# අරගලයේ උල්පත



1971-2021

අප්‍රේල් අරගලයට අඩසියවසයි

නියමුවා ප්‍රකාශන

1971-2021
අප්‍රේල් අරගලයට
අඩසියවසයි

# අරගල ඉතිහාසය



"පාලක කල්ලි හා සූරාකන පංතීහු විප්ලවවාදීන් හා සූරාකෑමට ගොදුරු වන්නන් බලය අත්කර ගැනීමෙන් වැළැක්වීමේ තත්ත්වයන් නිර්මාණය කිරීමට ප්‍රයත්න දරති. ඈත ඉතිහාසය, ඊයේ අද හා නිරන්තර ඉතිහාසය, විප්ලවයන් නිර්මාණය කළා වූ ජනතාවගේ ඉතිහාසය විසින් ඒකමතික මාවතක් අපට පෙන්වා දී ඇත්තේය. 'කවර හෝ ප්‍රගතියක්, කවර හෝ නිදහසක් දිනාගෙන ඇත්තා වූ ජනතාවන් විසින් අපට උගන්වා ඇත්තේ ඔවුන් එය ඉටුකරගෙන ඇත්තේ, නිවට නියාලු වීමෙන් හෝ වියගස මත තම ගෙල තැබීමෙන් හෝ නොවන බවයි. ජනතාවෝ තමන්ට අරගල කරන්නට බලකරනු ලැබූ විට අරගල කළහ. ලේ වැගිරීමට තමන් තුළ ඇති කැමැත්ත නිසා නොව වහල්භාවය හෝ කැප කිරීම පිළිබඳ විකල්පය තෝරාගැනීමට මුහුණ දුන් නිසාම සටන් කිරීමට ඔවුන්ට සිදුවිය. ඔවුහු තමන්ගේ නිදහස සහ සාධාරණත්වය උදෙසා තම ලෙයින් හා ජීවිත පරිත්‍යාගයෙන් මිල ගෙවීමට බලකරන ලදහ. සූරාකන්නන් විසින් සූරාකනු ලබන්නන් මතද, පීඩකයන් විසින් පීඩිතයන් මතද, වහල් හිමියන් විසින් වහලුන් මතද පටවා ඇති ඓතිහාසික විකල්පය මෙයයි. සූරාකෑම, පීඩනය, වහල්භාවය එසේ නැතිනම් ජීවිත පරිත්‍යාගය; මහත්වරුනි, මේ මාවත ජනතාව විසින් තෝරාගනු ලැබ නැත. ජනතාව ඔවුන්ගේ සූරාකන්නන් සහ පීඩකයන් විසින් තමන් වෙතට පටවනු ලැබූ මාර්ගය අනුගමනය කරනවා පමණි. අප පිළිබඳව බලන විට එය පැහැදිලිය. අපගේ ජනතාවන්ට අවාසනාවකට මෙන් විමුක්තිය කරා යාමට අරගලය හැර අන් මාවතක් නැත."

**- පිදෙල් කස්ත්‍රෝ -**

# අරගලයේ උල්පත

1971-2021

අප්‍රේල් අරගලයට
අඩසියවසයි

**විශේෂ සමරු කලාපය**


**71 අරගලය සත්‍යය හා අසත්‍යය!**
පිටුව 05





**අප්‍රේල් අරගලයේ සමාජ බලපෑම**
පිටුව 13





**අදත් ඒ සටන්කාමියා මා තුළ ජීවත් වෙනවා**
පිටුව 19





**අසන්නෙමි මෙසේ පැනයක්!**
පිටුව 28





**අපරාජිත වීරත්වයක සාමූහික ධජය**
පිටුව 30





**කාන්තාවන් එදාට වඩා අද පෙරට එන්න ඕනෑ**
පිටුව 36





**අරගලයේ කලාව හා කලාවේ අරගලය**
පිටුව 39





**රතු පාටින් ඉර බැස ගිය සැඳෑවක්**
පිටුව 49





**ප්‍රකාශනය**
නියමුවා ප්‍රකාශන,
43/20, නුගගහ පෙදෙස,
පිළියන්දල පාර, මහරගම.

**පළමු මුද්‍රණය**
2021 අප්‍රේල්

**විමසීම්:**
දුරකතනය: +94112785612 | ෆැක්ස්: +94112786050
විද්‍යුත් තැපෑල: niyamuwanews@gmail.com
වෙබ්: www.jvpsrilanka.com

# අපෙන්...

1971 අප්‍රේල් අරගලයට මේ වන විට වසර 50ක් හෙවත් අඩ සියවසක් පිරී ඇත. අප්‍රේල් අරගලය පිළිබඳ විවිධ මත තිබුණද එම අරගලය ලාංකේය සමාජයට කර ඇති බලපෑම සුළුපටු නොවේ. උගන්වා ඇති පාඩම් සුළුපටු නොවේ. අරගලය පරාජයෙන් කෙළවර වුවද එයට නායකත්වය දුන් හා එය විසින්ම යළි බිහි කළ දේශපාලන ව්‍යාපාරය තවමත් මේ රටේ සක්‍රියම දේශපාලන ව්‍යාපාරය ලෙස, සටන්කාමී හා සමාජ පරිවර්තනයක් වෙනුවෙන් වෙහෙසෙන දේශපාලන ව්‍යාපාරය ලෙස විවිධ හැලහැප්පීම් තුළ, ජය පරාජයන් තුළ පෙරට යමින් සිටී.

අප්‍රේල් අරගලය පිළිබඳ සමාජය තුළ විවිධ විග්‍රහ පවතී. එහෙත් සමාජය තුළ තහවුරු වී ඇති ඉන් බොහොමයක්, නිවැරදි හෝ විද්‍යාත්මක විධික්‍රම මත පිහිටා ප්‍රකාශ කළ විග්‍රහයන් හෝ මතයන් නොවේ. ඒවා බොහොමයක් පවතින ධනේශ්වර පාලනයට ගැළපෙන ධනේශ්වර මතවාදයන්ට අනුව නිර්මාණය කරන ලද ඒවාය. අප්‍රේල් අරගලය පිළිබඳ නිවැරදි කියැවීමක් අවශ්‍ය වන්නේ මේ නිසාය.

වරක් ලෙනින් විසින් මෙසේ පවසා තිබිණි. “දේශපාලනයේදී ජනතාව, සැමදාමත් රැවටිල්ලට හා ආත්ම රැවටිල්ලට අඥාන ලෙස ගොදුරු වී ඇත. එමෙන්ම, සියලුම සදාචාර, ආගමික දේශපාලන හා සමාජ වදන්, ප්‍රකාශයන් හා පොරොන්දු පිටුපස තිබෙන කිසියම් එක් හෝ අනෙක් පංතියක වුවමනාවන් සොයා තෝරා ගැනීමට ඔවුන් උගෙන ගන්නා තෙක්ම ඔවුන් එසේ තවදුරටත් රැවටෙනු ඇත.” - (ලෙනින් තෝරාගත් කෘති-1වැනි වෙළුම, 52 පිටුව)

මේ අනුව අප්‍රේල් අරගලය දෙස බැලිය යුත්තේද, එය කියවා ගත යුත්තේද අපේ පංතියේ පංති දෘෂ්ටි කෝණයෙනි. අරගලය පිළිබඳ සත්‍යය දැකගත හැකි වන්නේ එවිටය. එහෙත් වර්තමාන සමාජයේ පැතිර තහවුරුව ඇත්තේ අරගලය පිළිබඳ ධනේශ්වර හෝ සුළු ධනේශ්වර පංති පදනමේ සිට පළ කළ අදහස්ය; විග්‍රහයන්ය. ඒවා නොමඟ යවනසුලුය. අප මේ විශේෂ සමරු කලාපය මගින් උත්සාහ දරන්නේද අප්‍රේල් අරගලය දෙස නිවැරදිව බැලීමට, සැබෑ පංති දැක්මක් සහිතව බැලීමට මඟපෙන්වීමටය.



අප්‍රේල් අරගලය පිළිබඳ ධනේශ්වර පංතියේ පැත්තෙන් එල්ල කර තිබෙන නිෂේධනාත්මක, සත්‍යය විකෘති කරන ලද චෝදනාවන් හා විග්‍රහයන් සේම අරගලය තුළ සිටිමින්ම එය නිවැරදිව වටහා නොගැනීම නිසා හෝ අරගලයෙන් පලාගොස්, එය සාධාරණය කර ගැනීම සඳහා පතුරුවන මතයන්ද අරගලයේ සත්‍යය දැකීමට බාධා කරන බව පෙනේ.

අරගලය ‘අතිධාවනකාරී’ ලෙස හඳුන්වා තමන් ‘පරිණත බව’ හැඟවීමට උත්සාහ දරන ‘හාන්සි පුටු විප්ලවවාදීන්’ අප විසින් ඉතිහාසය තුළ දැක තිබේ. එසේම අරගලය බහුජන ව්‍යාපාරයක් ලෙස ගොඩ නොනැගීම හා බහුජන ව්‍යාපාරයක් බවට පත්වීමට පෙර තනිවම සටන් වැදීම වැරැද්දක් බවට මැසිවිලි නගන අයද සමාජය තුළ සිටිති. පුදුමය වන්නේ ’71 අරගලයට සම්බන්ධ තරුණයන්ගේ දේශපාලන ව්‍යාපාරය වූ ජනතා විමුක්ති පෙරමුණ බහුජන ව්‍යාපාරයක් ගොඩනගමින් සිටි බවත්, එය බහුජන ව්‍යාපාරයක් බවට පත්වීමට පෙර එල්ල වූ බිහිසුණු ධනේශ්වර මර්දනයත්, ව්‍යාපාරයේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධතාත් මෙම අරගලයට පාර කැපූ බවත් ඔවුන්ට නොපෙනීමය.

ඉතිහාසය ගොඩගනගන මිනිසුන් ස්වකීය ඉතිහාසය ගොඩනගන්නේ තමන්ට කැමති පරිදි නොව තමන්ට ලැබී ඇති හා පවතින සමාජ, දේශපාලන තත්වයන් යටතේය යනුවෙන් මාක්ස් උගැන්වූ සත්‍යය මේ බොහෝ දෙනා අමතක කර සිටිති. එය අරගලය පිළිබඳ සත්‍යමය ගවේෂණයකට බාධාවකි.

අප්‍රේල් අරගලය විසින් පෙන්වූ වීරත්වය, සටන්කාමීත්වය, පරිත්‍යාගය, සාමූහිකත්වය, සහෝදරත්වය, අරමුණ වෙනුවෙන් කැපවීමේ හා දිවි පිදීමේ ගුණය ආදී දහසක් සාධනීය ලක්ෂණ අතර එහි දුර්වලතා ද තිබේ. එහෙත් ඒවා තේරුම් ගත යුත්තේ මනෝමූලිකව, වියුක්තව නොව විෂයමූල වටපිටාවක් තුළ සංයුක්තවය.

ලාංකේය ධනවාදය මේ මොහොතේ පවතින්නේ ඉතාමත් බරපතළ විනාශකාරී අර්බුදයක් තුළය. එය සියලු නිෂ්පාදන මාර්ග බිඳදමා රට ණය සාගරයක ගිල්වනු ලැබ තිබේ. නව ලිබරල්වාදී ආර්ථිකය තුළ ඊට අනුවම නිර්මාණය කළ පරිභෝජනවාදී, ආත්මාර්ථකාමී සිතුවිලි නිසා ලාභ පසුපස, මුදල් පසුපස හඹා යන තරගය නිසා සමාජය බරපතළ ලෙස පිරිහීමකට ලක්ව තිබේ. මනුෂ්‍යත්වය අතුරුදහන් වී ම්ලේච්ඡත්වයේ ලක්ෂණ මතුවෙමින් තිබේ. හැම දේකම මිල දන්නා, එහෙත් වටිනාකම නොදන්නා සමාජයක් නිර්මාණය කෙරෙමින් තිබේ. ඒ තුළ ‘මිනිසුන්ට’ ජීවත්වීම අසීරු කර තිබේ. පරිසරය විනාශයට මුහුණපා තිබේ. අනාගතය අවිනිශ්චිත හා විනාශය වෙත ගමන් කරන්නක් වී තිබේ.

එබැවින් මෙම සමාජය වෙනස් කළ යුතුය. එය විප්ලවීය පරිවර්තනයකට ලක් කළ යුතුය. කැත, කෑදර, අමානුෂික ධනවාදය වෙනුවට මනුෂ්‍යත්වය පිරි ලස්සන සමාජයක්, සමාජවාදී සමාජයක් නිර්මාණය කළ යුතුය. ඒ සඳහා පීඩාවට පත් ජනයා ධනවාදය සමඟ අතරමඟ සමාදානයකින් තොරව සටන් කළ යුතුය. අවසානයේ ජනතාව ජයගත යුතුය.

ලංකාවේ ධනවාදයට එරෙහිව මීට වසර 50කට පෙර තරුණ පරපුරක් විසින් කරන ලද ප්‍රථම අභියෝගය, පළමු අවිගත් නැගිටීම දෙස අප බැලිය යුත්තේ, එය අධ්‍යයනය කළ යුත්තේ, ඉන් පාඩම් උගත යුත්තේ මේ මොහොතේ ඉහත අරගලය ජය ගැනීම සඳහාය. ’71 අප්‍රේල් අරගලය එම ජයග්‍රහණයට මඟපෙන්වන උදා තරුවක් කර ගැනීමටය.

මෙම විශේෂ අප්‍රේල් සමරු කලාපය ඒ වෙනුවෙනි. අප්‍රේල් අරගලයේ අත්දැකීම් නමැති මහා කෝෂ්ඨාගාරය මෙහි නැත. එහෙත් යමෙකුට ඊට ප්‍රවේශවීමට අවශ්‍ය නම් ඒ සඳහා වන ‘යතුර’ මෙහි ඇත. මෙම සමරු කලාපය ඒ අරමුණ වෙනුවෙනි. එකී අරමුණ ඉටුවන්නේ නම් අපේ බලාපොරොත්තුවද ඉටු වන බව නිහතමානීව පවසමු.

අප්‍රේල් අරගලයත්, එහි අරමුණුත්, අප්‍රේල් විරුවන්ගේ නාමයත් සදාකල් පවතිනු ඇත. කුමක් වුවත් අවසානයේ සත්‍යය ජය ගනු ඇත. පීඩිත ජනයා නව ලෝකයක් නිර්මාණය කරනු ඇත.

අප්‍රේල් විරුවන් සදාකල් සැමරෙනු ඇත.

සංස්කාරක මණ්ඩලය
2021.04.05

# බක්මහේ සුසුම

මතක ද?
ඇළ දොළ ගඟේ පාවුණ
කුණු මස් වැදලි සොය සොයා
ගිජුලිහිණි පාවී ආ දවස අහසේ
ඉව සොයා කබරුන් සුනඛයින් ගෑටුවා
ලේ දියේ පිහිනමින් මත්ස්‍යයෝ වැළපුණා

අම්මාවරු ළය පැළී වැතිරුණා
පියවරු සුසුම් මැද තනි වුණා
දස අතේ ගිනිදැල් පැතිරුණා
ඇසුණා ද ගිගුම් හඬ?

කම්හලේ ගොවිපොළේ වැඩබිමේ
සරසවියෙ සිප්හලේ
හන්දියේ කඩපොළේ බස්රියේ
මොනවාද දෙඩුවෙ රහසේ
දහදිය දුක වේදනා කඳුළු කරගැට
සොච්චම් වැටුප පීඩනය...

අයියණ්ඩියේ උඹ නිල් ඇඳුම ඇඳගෙන
එක රෑක ආවා පෑල දොරින් රෑන එක්ක
බත් වළඳ හූරා අම්මා කැවුවා හැමෝටම කට කට
එක වගේම පුත්තු උඹලා කියලා හඬා වැටුණා ඈය

සියලු සුසුමන් එකම මිටකට කූඩු කරගෙන
ඈත දිදුලන ක්ෂේම බිම වෙත පා නගන්නට
සවිය සමගිය සමඟ අයිතිය ගැන දෙඩුව මුව
ගොළු වුණේ අද ඊයෙ වාගෙයි දැනෙන්නේ මට

රතු පොකුරු සේ පිපි එරබදු දහස් ගණනින්
නිසංසල සුළඟේ වැනෙයි ඉපිලෙමින් සෝකෙන්
මුග්ධ සතුනට එරෙහි වීගෙන උන්ගෙ ගිනි අවි මැදට පැන්නේ
කොවුලනේ ගී ගයව් සමරා බක්මහේ රෑ දෙගොඩ යාමේ

නොදැල්වුණ මුත් ගම් දනව් මැද පහන් නුඹලා නාම ගුණයට
පහන් සිළු සේ තරු දිලී දැල්වේ අමිල ගුණ සමරන්නට
නුඹේ සගයෙක් රුදුරු උණ්ඩෙන් වැතිරුණා මම දනිමි අයියේ
එතැන බිම සිප විරුවන් සමරමු
නැවුම් හිරු සඳු දෙරණ මත හෙට දිදුලනා තුරු විරුවනේ මේ

**චන්ද්‍රකුමාර වික්‍රමරත්න**



# 71 අරගලය සත්‍යය හා අසත්‍යය

මිනිසුන් ස්වකීය ඉතිහාසය නිර්මාණය කරන බවත්, එහෙත් ඔවුන් එසේ කරන්නේ ඔවුන්ගේම රුචිකත්වය හෝ කැමැත්ත මතම නොව ඔවුන් වෙත අතීතයෙන් ලැබී ඇති හා ඒ මොහොතේ ඔවුන් වටා පවතින විෂයමූල සාධකවලට අනුව බවත් පැවසුවේ මාක්ස්ය. ඒ අනුව ඉතිහාසය හෝ ඉතිහාසයේ ප්‍රබල සිදුවීම් ඒවාට දායකවූ මිනිසුන්ගේ පෞද්ගලික කැමැත්තේම ප්‍රතිඵල නොව, පැවැති සමාජ ඓතිහාසික හා විෂයමූල සාධක තුළ ඊට අනුව සිදුකළ මිනිසුන්ගේ ක්‍රියා හෝ ප්‍රතික්‍රියාවල ඵලයක් බව පැහැදිලිය.

අනෙක් අතට හැම විටම ඉතිහාසය ලියනු ලබන්නේද ජයග්‍රාහකයන් විසිනි. ඒ, පන්ති අරමුණුද සහිතවය. ධනවාදය තුළ ඊට එරෙහිව කරන ලද අරගලයක් පරාජයෙන් කෙළවර වූයේ නම්, එම අරගලය පිළිබඳ ‘සමාජගත වන’ ඉතිහාසය ලියනු ලබන්නේ ජයග්‍රාහකයන් වූ ධනපතියන් විසිනි.
ඒ, සඳහා ඔවුන් එකී අරගලයට ද්‍රෝහි වූවන්ගේ හා අරගලය අත්හැර දැමූවන්ගේ මතයන්ද උපයෝගී කර ගනිමිනි. එවිට ධනවාදයට එරෙහිව සිදු වූ එම අරගලය පොදුවේ සමාජගත වන්නේ වරදක් ලෙස, අපරාධයක් ලෙස හා විනාශකාරී එකක් ලෙසය. එවිට ඉතිහාසයේ, එම සිදුවීමේ සැබෑව හා සත්‍යය යටපත් වන අතර, එය මතුකර ගැනීම හා සමාජ මනෝභාවය තුළ එහි සත්‍යය තහවුරු කිරීම ඉතාම දුෂ්කර වනු ඇත.

1971 අරගලයට මේ අප්‍රේල් මාසයට වසර 50ක් පිරේ. ඊනියා නිදහසින් පසු ලංකාවේ දේශපාලනය තුළ ප්‍රබලම කම්පනය ඇති කළ සිදුවීම වූයේ 71 අරගලයයි. එය ලංකාවේ ධනේශ්වර ඉතිහාසය තුළ සිදුවූ පළමු අවිගත් තරුණ නැගිටීම විය. එය අපේ රට තුළ පංති සටන ප්‍රකාශයට පත්වූ එක් ආකාරයක් ලෙසද සැලකිය හැක. "මෙතෙක් බිහිවුණු සමාජයන්ගේ (ලිඛිත) ඉතිහාසය වූ කලී පංති සටන්වල ඉතිහාසයක්" බව කොමියුනිස්ට් ප්‍රකාශනය තුළ සඳහන් කළේ මාක්ස් හා එංගල්ස්ය. වහල් ක්‍රමයේ පීඩාවට එරෙහි වහලුන්ගේ කැරලි හා නැගිටීම්වල සිට මේ දක්වාම පංති පීඩනයට එරෙහිව ලොව පුරා විවිධ කාලවල විවිධ ජන කණ්ඩායම් විසින් සටන් කොට තිබේ; අරගල කර තිබේ. විටෙක ජයග්‍රහණයෙන් කෙළවර වූද විටෙක



සටන් කරන පංතීන්ගේ විනාශයෙන් කෙළවර වූද සටනක් නොකඩවා පැවති බව මාක්ස් කියයි. ලෝක ඉතිහාසය අපට උගන්වන සත්‍යය එයයි. 71 අරගලයද එවැනි පරාජයට පත්වූ අරගලයකි.

අඩ සියවසරක් පිරෙන අප්‍රේල් අරගලය පිළිබඳව මේ මොහොතේ පවා අපේ රට තුළ ඇත්තේ ඒ පිළිබඳ පැහැදිලි නිරවුල් මතයක් නොවේ. 71 අරගලය ලෙයින්, යකඩින් මර්දනය කළ ධනපති පාලනයත්, අරගලය අතහැර පලාගිය වුන් හා අරගලයට ද්‍රෝහී වූවනුත් විසින් සමාජය තුළ 71 පිළිබඳ වැරදි මත රැසක් පළකොට තිබේ. අසත්‍යයන්, අර්ධ සත්‍යයන් හා විකෘති කරන ලද කරුණු බහුල වූද ධනේශ්වර පංති වුවමනාවන්ට අනුව නිර්මාණය කරන ලද්දා වූද එම වැරදි මතවාද, සමාජය තුළ පැතිරී තිබේ. 71 අරගලයේ සටන්කාමීත්වයේ ගෞරවය තම තමන්ගේ නමට ලියා ගැනීම සඳහා පුවත්පත් මගින්, විවිධ ප්‍රකාශන මගින් පුරසාරම් දොඩවන අය පවා අරගලයේ සැබෑ අරමුණු හා එහි සාධනීය බලපෑම විකෘති කරනු අප දැක ඇත. 71 අප්‍රේල් අරගලය සිදුවූයේ කෙසේද? ඊට බලපෑ සැබෑ හේතු හා සාධක මොනවාද යන්න පිළිබඳව ඉතාම කෙටියෙන් හෝ අප විසින් විමසා බැලිය යුත්තේ මේ නිසාය.

## අහම්බයක් නොවූ නැගිටීමක්

1971 අප්‍රේල් නැගිටීම අහම්බයක් හෝ පුද්ගල හිතුවක්කාරකමක ප්‍රතිඵලයක් හෝ රාජ්‍ය බලය ඇල්ලීම සඳහා කළ කුමන්ත්‍රණයක් හෝ නොවේ. එය ඒ මොහොත වන විට ලාංකේය දේශපාලනය තුළ නිර්මාණය වෙමින් පැවැති සියලු දේශපාලන තත්ත්වයන්ගේ තර්කානුකූල ප්‍රතිඵලය විය. ධනපති පංතිය එකල මෙම අරගල හැඳින්වූයේ 'නොමඟ ගිය අතිධාවනකාරී තරුණයන්ගේ කැරැල්ලක්', 'රාජ්‍ය බලය පැහැර ගැනීමේ කුමන්ත්‍රණයක්' ආදී ලෙසය. එහෙත් '71 නැගිටීම යනු ඉතාම කෙටියෙන් පැවසුවහොත්, විප්ලවකාරී ව්‍යාපාරයක දේශපාලනය කිරීමේ අයිතිය වෙනුවෙන්, ධනේශ්වර මර්දනයට එරෙහිව සිදුකරන ලද අවිගත් නැගිටීමකි. ධනේශ්වර මර්දනයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ පැත්තෙන් ඇතිවූ ප්‍රතික්‍රියාවකි.

ධනේශ්වර මර්දනය මඟහැර යාම හෝ එයට සන්නද්ධ නොවන ක්‍රමයකින් මුහුණ දීම ගැන වර්තමානයේ සිට සිතන කෙනකුට සිතිය හැකි වුවත්, '71ට පෙර මර්දනය වළක්වා ගැනීමට යම් යම් සීමිත පියවර ගැනීමට ජනතා විමුක්ති පෙරමුණ උත්සාහ කොට තිබුණත්, පැවැති යථාර්ථය වූයේ මර්දනයට එරෙහි පීඩනය අවිගත් නැගිටීමක් ලෙස පුපුරා යාමය. ඒ වන විට ජනතා විමුක්ති පෙරමුණ ගොඩනැගීමට පටන්ගෙන ගතවී තිබුණේ වසර 6කි. ඒ වන විටත් ජවිපෙ හොඳින් සංවිධානගතවූ දේශපාලන පක්ෂයක් නොවීය. එහි විවිධ කණ්ඩායම් අතර අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන්ද තිබිණි. ධනේශ්වර මර්දනය පක්ෂය ක්‍රමවත්ව ගොඩනගා ගැනීමට මෙන්ම අභ්‍යන්තර අර්බුද විසඳා ගැනීමටද බාධා කරන ලදී. අනෙක් අතට එකල ලෝක දේශපාලනය තුළ සමාජවාදී සමාජ විප්ලව සඳහා ප්‍රබල මාදිලියක් ලෙස සන්නද්ධ අරගල ක්‍රියාත්මක විය. වියට්නාමයේ, නිකරගුවාවේ, එල් සැල්වදෝරයේ සමහර අප්‍රිකානු රටවල සන්නද්ධ අරගල ඇවිළී තිබිණි. කියුබාවේ සන්නද්ධ අරගලය ජයගෙන තිබිණි. එම ලෝක තත්ත්වයද මර්දනයට එරෙහිව අවිගත් නැගිටීමකට එදා ජවිපෙට බලපෑ බව පෙනේ. '71 අරගලය නිර්මාණය වූයේ එවැනි පසුබිමකය.

## විප්ලවකාරී ව්‍යාපාරයක පැනනැගීම

1965 ජවිපෙට උපත දෙන ලද්දේ පැරණි වමේ ව්‍යාපාරයෙන් බිඳීගිය තරුණ පිරිසක් විසිනි. එහි මූලිකයා වූයේ රෝහණ විජේවීර සහෝදරයාය.

ලංකාවේ පැරණි වමේ ව්‍යාපාරය වම පාවාදී ධනපති සභාග දේශපාලනයට පල්ලම් බැසීමත්, ධනවාදයේ අර්බුදය උග්‍රවෙමින් තිබීමත් විසින් නව විප්ලවකාරී වාමාංශික ව්‍යාපාරයකට අවශ්‍ය විෂයමූල පදනම රට තුළ නිර්මාණය කරනු ලැබීය. ජාත්‍යන්තර වශයෙන් 50 දශකයේ අග හා 60 දශකයේ ලොව පුරා පැවැති විමුක්ති අරගලවල ආස්වාදය ද, 1963 ප්‍රකාශයට පත්වූ චීන - සෝවියට් මතභේදය විසින් ද ලොව පුරා වමේ පක්ෂ තුළ ඇති කළ මතවාදී සංවාදය ද මේ සඳහා බලපෑ ජාත්‍යන්තර සාධක විය.

ජවිපෙ බිහිවීම එක් අතකින් ලංකාවේ පසුගාමී, පරාධීන, අධිරාජ්‍ය ගැති ධනපති පාලකයන්ට අභියෝග යක් වූ අතර, පැරණි වමට ද එය අභියෝගයක් විය. එහි ප්‍රතිඵලය වූයේ පැරණි වම විසින් 1969දීම ජවිපෙ CIA කෙමනක් ලෙස නම් කිරීමත්, ධනපති ආණ්ඩු එය පසුපස ලුහුබැඳ එය දඩයම් කිරීමට කටයුතු කිරීමත්ය.

එදා පැවැති තත්වයන්ට අනුවත් ජාත්‍යන්තර අත්දැකීම්වලට අනුවත් ජවිපෙ ආරම්භයේදී එක්තරා ප්‍රමාණයකින් අර්ධ රහසිගත ව්‍යාපාරයක් විය. එය ආරම්භ වූයේ ගාල්ලේ අක්මීමන කම්කරුවකුගේ නිවසේ පැවැති රහසිගත සාකච්ඡාවකිනි. එය කුමන්ත්‍රණකාරීත්වයක් නොව එදා පැවැති තත්ත්වයට අනුව සිදුවූවක් විය. මෙම අර්ධ රහසිගත ස්වභාවය රටේ තරුණ පරපුරට ආස්වාදජනක වුවත් ධනපති පංතිය එය ජවිපෙ මර්දනය කිරීම සඳහා 'හේතුවක්' ලෙස යොදා ගනු ලැබූ බව පෙනිණි. අනෙක් අතට ආරම්භයේදීම ජවිපෙ තුළ බිහිවූ කණ්ඩායම්වාදය මෙම ධනපති මර්දනයට විශාල සහායක් ලබාදෙන ලදී. ඒ අනුව ජවිපෙ ගොඩනගා වසර 5ක් ගත වන විටම එය ඉතාම ළදරු සංවිධානයක් ලෙස පවතිද්දීම ධනේශ්වර මර්දන යන්ත්‍රය ඒ පසුපස හඹා ඒම අරඹන ලදී. ඒ ජවිපෙ කිසිදු නීති විරෝධී කාර්යයක් කර නොතිබියදීමය.

## කණ්ඩායම්වාදයේ බලපෑම

1969 වන විට ජවිපෙ තුළ කිසියම් කණ්ඩායම්වාදයක් බිහිවෙමින් තිබිණි. මෙය නිර්ධන පංති පක්ෂයකට විශාල හානියක් නිසා එය පැරදවිය යුතුව තිබිණි. එහිදී ධර්මසේකර කණ්ඩායම තම කණ්ඩායම්වාදී ක්‍රියාමාර්ග වෙනස් කර ගැනීමට සූදානම් නොවූයෙන්, එම කණ්ඩායම 1969 අගදී පක්ෂයෙන් නෙරපන ලදී. ඉන්පසු ඔවුන් විසින් ඉතාම සතුරු ආකාරයකින් ධනපති ආණ්ඩුවට බොරු තොරතුරු සැපයූ අතර, එහි ප්‍රතිඵලය වූයේ ධනේශ්වර රාජ්‍ය යන්ත්‍රය ජවිපෙ නායකයන් පසුපස හඹා ඒමය. එහි එක් පියවරක් වූයේ 1970 අප්‍රේල්වලදී රහස් පොලිසියේ විශේෂ ඒකකයක් ලෙස 'චේ ගුවේරා බියුරෝව' පිහිටුවීමය. ඒ අනුව ජවිපෙ ක්‍රියාකාරීන්ට චේ ගුවේරා යන නම ධනපති පාලකයන් විසින් පටබඳින ලදී. ඉන්පසු කිසිදු සාධාරණ හේතුවක් නැතිව ජවිපෙ ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගැනීම ද ඇරඹිණි.

එලෙස අත්අඩංගුවට ගැනීමේ උච්ච අවස්ථාව වූයේ මර්දනය තුළ ආරක්ෂාව සඳහා හම්බන්තොට ජුල්ගමුවේ නිවසක නතරවී සිටි රෝහණ විජේවීර සහෝදරයා අත්අඩංගුවට ගනු ලැබීමය. 1970 මැයි 12 දින ඔහු අත්අඩංගුවට ගනු ලැබූ අතර, ඒ වන විට රටේ පැවැතියේ එජාප පාලනයයි. අත්අඩංගුවට ගැනුණු රෝහණ සහෝදරයා කොළඹ ගෙනැවිත් පසුව කුමන්ත්‍රණකාරී ලෙස ආණ්ඩුව විසින් නුවරඑළියේ මහේස්ත්‍රාත්වරයකුට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. යළි ඔහු නිදහස් කරනු ලැබුවේ 1970 ජූලි 09 දිනය. ඒ, ඔහු රඳවා තැබීමට

> **1971 අප්‍රේල් නැගිටීම අහම්බයක් හෝ පුද්ගල හිතුවක්කාරකමක ප්‍රතිවිලයක් හෝ රාජ්‍ය බලය ඇල්ලීම සඳහා කළ කුමන්ත්‍රණයක් හෝ නොවේ. එය ඒ මොහොත වන විට ලාංකේය දේශපාලනය තුළ නිර්මාණය වෙමින් පැවැති සියලු දේශපාලන තත්ත්වයන්ගේ තර්කානුකූල ප්‍රතිවිලය විය.**

එරෙහිව සිදුකරන ලද විශාල ප්‍රචාරක ව්‍යාපාරයක බලපෑමද සහිතවය. මේ වන විට '70 මැයි මැතිවරණයෙන් සමගි පෙරමුණ ජය ලබා ආණ්ඩුවක් පිහිටුවා තිබිණි.

ශ්‍රීලනිප, සමසමාජ, කොප එක්ව පිහිටුවූ සමගි පෙරමුණ යටතේ එජාපයට වඩා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ලැබෙිය යන විශ්වාසය තුළ ජවිපෙ 1970 මහ මැතිවරණයේදී සමගි පෙරමුණේ ජයග්‍රහණය වෙනුවෙන් ප්‍රාදේශීයව වැඩ කළ ද, සමගි පෙරමුණු පාලනය ද ජවිපෙට එරෙහි මර්දනය දිගටම ගෙන යන ලදී. එය බරපතළ කරුණක් විය.

## ප්‍රසිද්ධ දේශපාලනයට අවතීර්ණව

'70 ජූලි රෝහණ සහෝදරයා නිදහස් වීමෙන් පසු පක්ෂය රට පුරා ප්‍රසිද්ධ දේශපාලන කටයුතු ආරම්භ කරන ලදී. මේ අනුව 1970 ජූලි 14දා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේදී 'CIA කාරයෝ' නමින් දේශනයක් පවත්වා දේශන මාලාවක් ද, 1970 අගෝස්තු 10දා කොළඹ හයිඩ් පිටියෙන් ඇරැඹී ජවිපෙ මංගල රැලියේ සිට රට පුරා රැලි මාලාවක් ද ඉතාම සාර්ථකව

පවත්වන ලදී. 'රතු බලය', 'ජනතා විමුක්ති', 'දේශප්‍රේමී' යන නම්වලින් පුවත්පත් ද මුද්‍රණය කර බෙදාහැරිණි.

මෙම ප්‍රචාරක වැඩ නිසා මර්දනය අඩු විය යුතු වුවත්, සිදු වූයේ රාජ්‍ය මර්දනය තව තවත් වැඩි වීමය. ජවිපෙ වටා වැඩකරන ජනතාව, තරුණ පරපුර වේගයෙන් එකතු වනු දුටු ධනපති පාලකයන් ඉන් බියට පත්ව ජවිපෙ මර්දනය කොට විනාශ කිරීමේ අරමුණින් කටයුතු කළ බව හොඳින් පෙනිණි.

මේ බව පැහැදිලි වූයේ 1970 අගෝස්තු 10දා පැවැත්වූ ජවිපෙ මංගල රැලියෙන් පසු එනම් අගෝස්තු 12දා එවකට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ආතර් රාජ්කුමාර් රත්නවේල් විසින් නිකුත් කරන ලද නිවේදනයකිනි. එහි සඳහන් වූයේ "රටේ හිස ඔසවමින් තිබෙන චේ ගුවේරා ව්‍යාපාරය

**1971 අප්‍රේල් නැගිටීමෙන් පසු ආණ්ඩුවත්, ඔවුනට අනුව මත සකස් කළ අයත් සමාජය තුළ තහවුරු කිරීමට උත්සාහ කළේ ජවිපෙ අවි ගත් නිසා එය මර්දනය කළ බවය. එහෙත්, සැබෑ ලෙසම සිදු වූයේ එහි අනෙක් පැත්තය. එනම්, ආණ්ඩුවේ මර්දනය නිසා ජවිපෙට අවි ගැනීමට බල කිරීමය.**

ආණ්ඩුවේ අංක එකේ මූලික හතුරා වන්නේය. එය හඹා ගොස් මුලිනුපුටා දැමිය යුතුය. ආණ්ඩුව මේ සඳහා නීතිරීති සකස්කරමින් සිටී" යනුවෙනි. මෙය අගෝස්තු 13 දින 'SUN' නමැති ඉංග්‍රීසි පුවත්පතේ වාර්තා කර තිබිණි. මෙම ප්‍රකාශය ඉතා බරපතළ එකක් විය. ඒ වන විට කිසිදු නීති විරෝධී දෙයක් කර නැති ප්‍රසිද්ධ දේශපාලනයේ නියැළෙන සංවිධානයක් ආණ්ඩුවේ අංක එකේ සතුරා ලෙස නම් කොට මෙලෙස විනාශ කර දැමීමට ආණ්ඩුවේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් තීරණය කොට එය ප්‍රකාශ කිරීම ආණ්ඩුවේ අරමුණ කුමක් ද යන්න පැහැදිලි වීමක් විය.

මෙය ජවිපෙ පැත්තෙන් බැලූ විට බරපතළ අනතුරු ඇඟවීමක් විය. අනෙක් අතට ලෝක දේශපාලනයේ මෙවැනි අත්දැකීම් ද තිබිණි. 1965දී හමුදා කුමන්ත්‍රණයකින් ඉන්දුනීසියාවේ බලයට පත් ආණ්ඩුව විසින් එරට කොමියුනිස්ට් පක්ෂය මහා මිනිස් සංහාරයකින් විනාශ කළ ආකාරය අමතක කළ නොහැකි කරුණක් විය. අවසානයේ තම ආරක්ෂාව වෙනුවෙන් ජවිපෙ සන්නද්ධ කළ යුතු යැයි 1971 ජනවාරියේ ජවිපෙ තීරණය කරන්නේ මේ අනුවය. 1971 ජවිපෙ අවි එකතු කිරීමට තීරණය කළ ද, එය ආත්මාරක්ෂාව සඳහා ගත් පියවරක් වුවා සේම 1971 අප්‍රේල්වල ආණ්ඩුවට පහරදීමේ තීරණයක් තිබුණේ නැත. ඒ නිසාම අවි එකතු කිරීමට හා ඒවා ආරක්ෂිතව ගබඩා කිරීමට පමණක් තීරණය කර තිබිණි.

මේ වන විට ජවිපෙ තුළ නැවත කණ්ඩායම්වාදය මතු වී තිබූ අතර, ලොකු අතුල ඇතුළු කණ්ඩායම මෙම තීරණය තමන්ගේ බල අරමුණු වෙනුවෙන් යොදා ගැනීමට කටයුතු කළ බව ද පෙනිණි. ඒ නිසාම මෙම සන්නද්ධ වීමේ තීරණය ක්‍රියාවට නැඟුණේ සංවිධාන විනයක්, වගකීම්සහගතභාවයක් සහිතවම නොවේ.



ඒ නිසාම මේ තත්ත්වය ආණ්ඩුවට වාර්තා වී තිබුණ බව ද පෙනේ.

## මර්දනය උග්‍ර වීම

1971 වනවිට එක් අතකින් ධනේශ්වර මර්දනය උග්‍ර වූ අතර, අනෙක් අතින් අභ්‍යන්තර ප්‍රතිවිරෝධයක් ද, ධර්මසේකර කල්ලියේ ප්‍රතිවිප්ලවකාරී ක්‍රියාවන් ද, පාවාදීම් ද උත්සන්න වෙමින් තිබිණි.

1971 අප්‍රේල් නැගිටීමෙන් පසු ආණ්ඩුවත්, ඔවුනට

අනුව මත සකස් කළ අයත් සමාජය තුළ තහවුරු කිරීමට උත්සාහ කළේ ජවිපෙ අවිගත් නිසා එය මර්දනය කළ බවය. එහෙත් සැබෑ ලෙසම සිදුවූයේ, එහි අනෙක් පැත්තය. එනම් ආණ්ඩුවේ මර්දනය නිසා ජවිපෙට අවි ගැනීමට බලකිරීමය. මේ පිළිබඳ උදාහරණ ඕනෑතරම් තිබේ. 1970 අගෝස්තු 10 මංගල රැලියෙන් පසු 12දා ආරක්ෂක ලේකම් නිකුත් කළ ප්‍රකාශයේ සිට මර්දනකාරී කටයුතු දිගට පෙළගැසුණ හැටි දැකිය හැක. එකල පුවත්පත්වල පළවූ සිරස්තල කිහිපයකින් මෙය තේරුම් ගත හැක. 1970 අගෝස්තු 11දා 'සිලෝන් ඩේලි මිරර්' පත්‍රය වාර්තා කර තිබුණේ, 'චේ ගෙවාරා ව්‍යාපාරය යටපත් කිරීමේලා තම



උත්සාහයන් උත්සන්න කිරීමට පොලිසිය තීරණය කරයි' යනුවෙනි.

1970 අගෝස්තු 20 'සිලෝන් ඩේලි නිව්ස්' පුවත්පතේ සිරස්තලය වූයේ 'පොලිස්පති ජවිපෙ ගැන - කැරැලිකරුවන් මර්දනය කිරීමට නව නීති' යනුවෙනි. මෙහිදී රටේ කිසිදු කැරැල්ලක් ඇති වී නොතිබියදී, අවි එකතු කර නොතිබියදී, ආණ්ඩුව ජවිපෙට 'කැරැලිකරුවන්' යන නම පටබැඳ තිබිණි. 1970 ඔක්තෝබර් 05 'සිලෝන් ඩේලි නිව්ස්' පත්‍රය වාර්තා කළේ 'පොලිස් හමුදාව 5,000කින් තර කිරීමට යයි' යනුවෙනි. මෙවැනි තවත් ප්‍රකාශ රැසක් තිබූ අතර ඉන් පැහැදිලි වූයේ මෙම තරුණ ව්‍යාපාරය දඩයම් කිරීමට සැරසෙන ආණ්ඩුව ඒ සඳහා ජන මතය සකසමින් මර්දනයේ දැල එළමින් සිටින බවය.

## මර්දනය වැළැක්වීමට දැරූ උත්සාහයන්

මෙලෙස පෙළගැසුණ රාජ්‍ය මර්දනය වැළැක්වීමට ජවිපෙ උත්සාහ නොකළේද? කෙනකු තුළ එම ප්‍රශ්නය මතුවීමට ඉඩ තිබේ. සැබැවින්ම ඒ සඳහා විවිධ උත්සාහයන් ගැනිණි. මෙම මර්දනය පිළිබඳ පාර්ලිමේන්තුව තුළ ප්‍රින්ස් ගුණසේකර හා පී. ද එස්. කුලරත්න යන මන්ත්‍රීවරු කථා කළ අතර ජවිපෙ හා අගමැතිනිය අතර සාකච්ඡාවක් ගැනීමටද උත්සාහ කරන ලදී. එහෙත් අගමැතිනිය ඊට ප්‍රතිචාර දැක්වූයේ නැත. මර්දනය හෙළිකරමින් ජනතාවට පක්ෂයේ අරමුණු පැහැදිලි කිරීමද කරන ලදී. සමහර සිදුවීම්වලට නඩු පැවරීමටද කටයුතු කරන ලදී. එහෙත් ඒ කිසිවකින් මර්දනය නතර නොවීය.

මෙලෙස මර්දනය උග්‍රවෙද්දී පක්ෂයේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන්ද උග්‍රවිය. එය ආණ්ඩුවට වාසිදායකද විය. 1971 මාර්තු 06 ධර්මසේකර කල්ලිය විසින් ලංකාවේ ඇමරිකානු තානාපති කාර්යාලය ඉදිරිපිට බෝම්බයක් පුපුරවා ඒ ආසන්නයේ සිටි පොලිස් නිලධාරියෙකුට තියුණු ආයුධයකින් ඇන මරා දමන්නේ මේ අතරය. මෙම සිදුවීම ආණ්ඩුවට වෙස්වලාගත් ආශීර්වාදයක් විය. මෙම සිදුවීම යොදාගනිමින් රට තුළ හදිසි නීතිය ක්‍රියාත්මක කළ ආණ්ඩුව ජවිපෙ මර්දනය වේගවත් කරන ලදී.

## අරගලය පැනනැගීම

1971 අප්‍රේල් 05දා රාජ්‍ය යන්ත්‍රයට පහරදීමේ තීරණය සඳහා සමස්ත පක්ෂ කේඩරය එකග කර ගැනීමට එකී තීරණය ගත් ලොකු අතුල කණ්ඩායමට හැකිවූයේ මෙම මර්දනය විසින් පෙරළා පහරදීමේ මානසිකත්වයට පක්ෂ ක්‍රියාකාරීන් පත්ව සිටීමය. රාජ්‍ය යන්ත්‍රය තමන්ට පහරදී විනාශ කර දැමීමට පෙර රාජ්‍ය යාන්ත්‍රණයට පහර දිය යුතුය යන අදහස බොහෝ දෙනා තුළ තිබෙන්නටද ඇත. කෙසේ වෙතත් අප්‍රේල් නැගිටීමට ආසන්න ලෙස බලපෑ සිදුවීම් අතර ධර්මසේකර කල්ලිය මාර්තු 06 කළ පහරදීම ප්‍රබල විය. ඉන්පසු මාර්තු 13දා අම්පාරේදී පක්ෂයේ වැඩකට යමින් සිටියේදී රෝහණ විජේවීර සහෝදරයා හා කෙලී සේනානායක අත්අඩංගුවට ගන්නා ලදහ. ඉන්පසු කොළඹට ගෙන ආ රෝහණ සහෝදරයා රැඳවුම් නියෝග මත යාපනය බන්ධනාගාරයේ රඳවන ලදී. ඔහු සමග කිසිදු නීති විරෝධී දෙයක් අත්අඩංගුවට ගෙන තිබුණේ නැත. ඒ සමගම ආණ්ඩුව මහජන ආරක්ෂක පනත යටතේ

මාර්තු 16 සිට මළමිනී මරණ පරීක්ෂණයකින් තොරව වැළලීමේ නීතිය ප්‍රකාශයට පත් කරන ලදී. මෙය ඉතාම බිහිසුණු එකක් විය. ඉන් පැහැදිලි වූයේ ආණ්ඩුව විප්ලවාදීන් සංහාරයකට සැරසෙන බවය.

රෝහණ විජේවීර සහෝදරයා අත්අඩංගුවට පත්වීමත් සමග පක්ෂයේ තත්ත්වය බරපතළ විය. නොසන්සුන් විය. මේ තත්ත්වය මත ආරක්ෂා වෙමින් මර්දනය හෙළිකොට එය පැරදවීමට කටයුතු කරන මෙන් දන්වා රෝහණ සහෝදරයා විසින් යාපනයේ සිරගෙදර සිට තමා බැලීමට පැමිණි ඔස්මන් සහෝදරයාගේ මව, සීලවතී සහෝදරිය අත එවූ පණිවුඩයද ලොකු අතුලලා නොසලකා හරින ලදී. ඒ වෙනුවට මේ අවස්ථාව පහරදීම සඳහා යොදාගැනීමට ලොකු අතුල කණ්ඩායම යොදාගත්තේය. එය එක්තරා අන්දමක පක්ෂය නොමග යැවීමක්ද විය. මේ තත්ත්වය තුළ ලොකු අතුල කණ්ඩායම මාර්තු අග රැස්වී තීරණය කර තිබී ඇත්තේ අප්‍රේල් 05 අළුයම පහර දීමටය. එහෙත් මෙම තීරණයට රෝහණ සහෝදරයාට පක්ෂව සිටි ලයනල් බෝපගේ ඇතුළු පිරිස එකඟ කර ගැනීමට අප්‍රේල් 02 විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ සංඝාරාමයේ හමුවක් පවත්වා ඇත. එහිදී කලින් තීරණය කර ගත් බවක් නොපෙන්වා පහරදීමේ තීරණය ගෙන ඇති අතර ඒ සඳහා රෝහණ සහෝදරයා පණිවුඩයක් එවූ බවද (මෙය අසත්‍යයකි) පවසා ඇත. එහිදී තීරණය කරන ලද්දේ 1971 අප්‍රේල් 5 රාත්‍රී පහරදීමය. මෙහිදී යළිත් ගත් තීරණයේ වෙලාව වෙනස් කර යළි දිස්ත්‍රික්ක වෙත පණිවිඩ ලබාදුන්නද මොනරාගලට එම පණිවිඩය ලබාදිය නොහැකිවී තිබේ. එහි ප්‍රතිඵලය වූයේ 71 අප්‍රේල් 5 පාන්දර වැල්ලවාය පොලිසියට පහරදීමය.

එබැවින් මෙම පහරදීමේ තීරණය පොදුවේ පක්ෂය ගත් තීරණයකට වඩා ලොකු අතුල කල්ලියේ තීරණය උපක්‍රමශීලීව පක්ෂය මත පැටවීමක් විය. 71 අරගලය පැන නැගුණේ එසේය. කෙසේ වෙතත් සමස්ත පක්ෂයම තමන් මුහුණදුන් මර්දනය තුළ පෙරළා පහරදීමේ වුවමනාවෙන් පසුවිය. ලොකු අතුලට තම තීරණය පක්ෂය මත පැටවීමට පහසු වූයේ ඒ නිසාය. අවසන් තීරණය කෙසේ ගත්තද මෙම නැගිටීම ඒ මොහොතේ පැවති සමස්ත සාධක විසින් පොළඹවන ලද්දක් විය.

1971 අප්‍රේල් අරගලය තේරුම් ගත යුත්තේ ඉහත තත්ත්වයන්ට යටත්ව කරන විග්‍රහයකින් පමණකි. සන්නද්ධ නැගිටීමක් සඳහා විෂය මූලික තත්වයක් මුහුකුරා ගොස් නැතිනම් කිසිවෙකුටත් තම කැමැත්තට එවැනි නැගිටීමක් ඇති කළ නොහැකිය. සත්‍ය එයයි. එබැවින් අප්‍රේල් අරගලය යනු අහම්බයක් හෝ පුද්ගල හිතුවක්කාරකමක ප්‍රතිඵලයක් නොවේ. එසේම එය බලය ඇල්ලීමේ විප්ලවයක්ද නොවේ. මන්ද ඒ වනවිට ධනපති ක්‍රමයේ අර්බුදය මෝරා තිබුණද සමාජයේ විප්ලවීය තත්ත්වයක් තිබුණේ නැත. ජවිපෙ ක්‍රියාකාරකයින් හා ඒ වටා එක්වූවන් සමාජවාදයට, සමාජවාදී විප්ලවයට පෙම්බැඳ සිටියවුන් බව ඇත්තය. ඔවුන්ට සමාජවාදය පිළිබඳ ප්‍රාර්ථනයක්, සිහිනයක් තිබූ බව සත්‍යයකි. ඔවුන් දිවි පරදුවට තබා සටන් කළේ එම හැඟීම විසින් ඇති කළ මනෝභාවයන් තුළය.

ඔවුහු සටන්කාමීහු වූහ. නිවහල් මනසකින් යුතු අයද වූහ. දණින් වැටී ජීවත්වනවාට වඩා දෙපයින් සිට මිය යාම උතුම් බව ඔවුන් පැවසුවේ ඒ නිසාය. ඔවුන්ට පෞද්ගලික අරමුණු පටු අරමුණු නොවීය. නව සමාජයක් සඳහා දේශපාලනය කිරීමේ, සංවිධානය වීමේ ශුද්ධ වූ අයිතිය වෙනුවෙන් අවි ගෙන සටන් කිරීමට ඔවුන් පෙරට ආවේ එම නිසාය.



එබැවින් 71 අප්‍රේල් යනු කුමන දුර්වලතා පැවතියද අභ්‍යන්තර අර්බුද තිබුණද එය පීඩාවට එරෙහිව, ධනේශ්වර වහල් භාවයට එරෙහිව, අදිරදවාදයට එරෙහිව නිර්ධන පංතියේ පැත්තෙන්, තරුණ පරපුරේ පැත්තෙන් මතුවූ රණ හඬ වේ. තම දේශපාලන අයිතිය වෙනුවෙන් හා මර්දනයට එරෙහිව තරුණ පරපුරේ පැත්තෙන් ආ ප්‍රතිචාරය ලෙසටද මෙය තේරුම් ගත හැක. නිර්ධන පංතියට තමන්ගේම පක්ෂයක් තුළ සංවිධානය වීමට ඇති අයිතියට බාධාකරමින් දිගින් දිගටම සිදුකළ රාජ්‍ය මර්දනයේ ඉතිහාසය නොසලකා, එය අමතක කර අප්‍රේල් අරගල බිහිවීමේ හේතු සෙවිය නොහැක. එය තම පංතියේ, පංති දේශපාලනයේ අයිතිය වෙනුවෙන් හා සමාජවාදී සමාජයක සිහිනය වෙනුවෙන් ධනපති පාලනයට එරෙහිව අවි දරා කළ අභියෝගයක් විය. 71 අරගලය අපේ රටේ දේශපාලනයේ ගැඹුරු සටහන් තැබූ සිදුවීමක් වන්නේ ඒ නිසාය■



"නැඟූ රණ ගොස දෙරණ පතුරා
මැවූ ජය මඟ එළිය කරවා
ඔබ නැගූ හඬ - ඔබ පිදූ ලෙය
පතා ජනතාවගේ විමුක්තිය
පතා ජනතාවගේ ගරුත්වය
සදා සමරමු සොහොයුරෝ

පුදා හල මුත් ජීවිතේ - උපන්නේ ජනතා හදේ
ඔබෙන් නැගි හඬ රණ බිමේ, - විජය ගීතය වේ අපේ!

එයයි මුළු ලොව පුබුදු වන්නේ
එයිනි නව ලොව බිහි කෙරෙන්නේ
ඔබෙ සුසුමෙන් පැතිර ජීවය
ප්‍රාණ වායුව වේ අපේ

වැටී දිවුරමු ඔබේ සොහොනේ
විප්ලවේ ජය දද නඟන්නෙමු
රතු ලොවක් අපි ගොඩ නඟන්නෙමු!"

**(විමුක්ති ගී)**



## ඵරබදු

මිත්‍රවරුනි, ගස අඩ් විසිපහක් ඇතී
පත්‍ර විතරමයි ගෙඩි මල් කිසිත් නැතී
වෘක්ෂ දේවතාවොත් පිට මගම යතී
මුත්‍ර කරන්නට විතරක් මුලට ඒතී

සාර සුබාවට ගස වැඩෙමින් රුවට
සාර සියක් අතු ඉති වැනුණත් අවට
බෝධි සත්ත්වයින්ගේ හෙවණට ඉහට
බෝධි රාජයෙක් වනු බැරිවිය ගහට

නීල වර්ණ නිල් චාමර කොළ තුරිනේ
මෝදු වුණයි රතු කැකුළක් ගස මුදුනේ
පාරමිතා මිණිමුතුවී මල පිපුණේ
යාළු, ඒයට 'ඵරබදු' යන නම ලැබුණේ

රනේ රුවට රන් කිරුළක අන්දමට
පෙනේ සුරත් මල ගහ උඩ තුන්යමට
මලේ වරුණ පවසන මහ පිංකමට
අනේ යෝද බල ලැබියන් දරුවන්ට

ඉතින් යහළුවනි මල් පිපුණොත් ගසක
සැකක් නැතිය පලයක් හටගනු නිසැක
සිතින් අත නෑර මල්වල මුදු මෙළෙක
වරෙව් පරාගණයට රොද බැඳ හනික

**රත්න ශ්‍රී විජේසිංහ**
(සුබ උදෑසන)

# අප්‍රේල් අරගලයේ සමාජ බලපෑම



1971 අප්‍රේල් අරගලය ලාංකේය සමාජ දේශපාලන ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයක් වන්නේ හේතු සාධක ගණනාවක් නිසාය. සියවස් 25ක් පමණ තිස්සේ මෙරට රජවරුන්ගේ පාලනයන් පැවති අතර ඒ බොහෝ රාජ්‍යත්වයන් මාරුවීමේදී කැරලි කෝලාහල සිදුවූ බවත් ඒ සියල්ලේම අරමුණ වූයේ තවත් එක් රජෙකු වෙත රාජ්‍ය බාරදීම බවත් පැහැදිලි කරුණකි. පසුව පැවති පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි පාලන කාලවලදීද විවිධාකාරයේ අරගල මතු වුවද එක්කෝ ඒවා තවත් එක් රජකෙනෙකු පත් කිරීම හෝ වෙනත් පාර්ශ්වීය කරුණු මත පදනම් විය. ජනතාව අතට බලය ලබාගැනීමේ සැලැස්මක් හෝ අරමුණක් ඒවා තුළ නොපැවතුණි.

71 අප්‍රේල් අරගලය යනු රාජ්‍යයේ අයිතිය ධනපති පංතිය අතින් පීඩිත ජනතාව වෙත ලබාගැනීම සඳහා සංවිධානය වූ නිර්ධන පංති දේශපාලන ව්‍යාපාරයක් තම පංතියට දේශපාලනය කිරීමේ අයිතිය වෙනුවෙන් ඉතිහාසයේ දියත් කළ පළමු අවිගත් නැගිටීමයි.

## පීඩිතයන්ට අත්පොතක්

අප රටේ වාමාංශික ව්‍යාපාරය 1935 පමණ ආරම්භ වුවද ඔවුන්ගේ මතවාදයන් හා භාවිතාවන් සමාජවාදී සමාජ විප්ලවය පිළිබඳව නිරවුල් අදහසක් ඇතිකිරීමට සමත් වූයේ නැත. එනම් පීඩක රාජ්‍ය යාන්ත්‍රණය සමග සම්මුතිවාදී හා සමාදානවාදී පිළිවෙතක් ඔවුහු දිගටම අනුගමනය කළෝය. පීඩිත පංතිය අතට බලය ලබාගැනීම වෙනුවෙන් පංති අරගලය මුවහත් කිරීම සහ එමගින් පීඩිත පංති බලය ශක්තිමත් කිරීමත්, නිර්ධන පංති පක්ෂය ස්වාධීනව ගොඩනැගීමත් යන අත්‍යවශ්‍යම සාධක මගහැරී තිබුණි.

71 අරගලයෙන් පීඩිත පංතියට ලැබුණු දේශපාලන අත්දැකීම් ගණනාවකි. එනම් නව සමාජයක් පිළිබඳව බලාපොරොත්තුවක් පුළුල් ලෙස සමාජ ගත වීම, අයිතීන් දිනාගැනීමට සටන් කරමින් නැගී සිටිය යුතු බව උගැන්වීම, පීඩිතයන්ගේ සැබෑ සතුරා ධනේශ්වර




රාජ්‍ය යන්ත්‍රය බව ප්‍රායෝගිකවම ජනතාව ඉගෙන ගැනීම, කොතරම් බලගතු වුවත් ධනේශ්වර රාජ්‍ය යන්ත්‍රයට අභියෝග කිරීමට පීඩිත පංතියට හැකි බව හා ඒ පිළිබඳ විශ්වාසයක් ඇති වීම, අරගලය ජය ගැනීමට පංති බලවේග වැඩි වැඩියෙන් සංවිධානාත්මකව ශක්තිමත් කළ යුතු බව හා ශක්ති සම්පන්න නිර්ධන පංති පක්ෂයක් ගොඩනැගීම අත්‍යවශ්‍ය බව යනාදී වශයෙන් වූ වැදගත්ම දේශපාලන කරුණු පීඩිත සමාජය තුළ රෝපණය වීම සිදුවිය. සැබැවින්ම "න්‍යාය ටොන් එකකට වඩා භාවිතය අවුන්සයක් වටී" යනුවෙන් වූ කියමන කෙතරම් අගනේදැයි අප්‍රේල් අත්දැකීම් කියාපායි.

එයින් කිසිසේත්ම න්‍යායයේ වැදගත්කම අවතක්සේරු නොකරගත යුතු අතර භාවිතයේ වන වැදගත්කම අවධාරණය කිරීමට එය වැදගත් වේ. මන්ද පොත් සියයක් කියවා ඉගෙනගත නොහැකි දේ ඉගෙනගැනීමට මේ අරගලයේ පාඩම් සුවිශාල වන බැවිනි. කෙටියෙන්ම පවසන්නේ නම් පොදුවේ සමාජයේ, විශේෂයෙන් තරුණ පරපුරේ නිදිබර ස්වභාවයන් අවදි කරනු ලැබූයේ 71 අරගලය යයි කිවහොත් එය වැරදි නැත.

එසේම පවතින සමාජ අසාධාරණයන් දෙස විශේෂයෙන් තරුණ පරපුරේ ගැටලු දෙස දෙනෙත් හැර බැලීමටත්, ඒවාට යම් යම් ප්‍රතිසංස්කරණවාදී විසඳුම් ලබාදීමටත් 71 අරගලය පාලකයන්ට බලකරනු ලැබීය. ඒ අරභයා ආණ්ඩුව පසුව ගනු ලැබූ ක්‍රියාමාර්ගවලින් ඒ බව පැහැදිලි වෙයි.

## බ්‍රිතාන්‍ය කිරීටයෙන් නිදහස් වීම

71 අරගලකරුවන්ට අධිකරණය ඉදිරියේ නඩු පවරන ලද්දේ බ්‍රිතාන්‍ය මහරැජිනගේ ආණ්ඩුව සාපරාධී ලෙස බියවැද්දීම හා එය පෙරළා දැමීමට කුමන්ත්‍රණය කිරීම යන චෝදනා මතය. 1948 ඊනියා නිදහස යන්න කොතරම් ව්‍යාජයක්ද යන්න සමාජය හමුවේ නිර්දය ලෙස හෙළිදරව් කරන ලද්දේ මේ මඟින් යැයි කීවොත් එය අතිශයෝක්තියක් නොවේ. ඒ වන විට පැවති ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා රාජ්‍යයේ ප්‍රධානියා ලෙස සලකනු ලැබූයේ එක්සත් රාජධානියේ රැජිණයි. එසේම අවසානාත්මක අධිකරණය ලෙස හඳුන්වනු ලැබූයේ බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සිලය හා සාමි මන්ත්‍රී මණ්ඩලයයි.

මේ නිසාවෙන්ම ශ්‍රී ලංකාව ස්වාධීන ජනරජයක්ය යන්න තහවුරු කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති කිරීම අවශ්‍ය විය. මේ සම්බන්ධ සමගි පෙරමුණ මැතිවරණ පොරොන්දුවක්ද දී තිබූ අතර ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පිහිටුවා තිබුණි. එහෙත් 71 අරගලයෙන් කළ බලපෑම ඒවා කඩිනම් කිරීමටත් ප්‍රායෝගික කිරීමටත් විශාල බලපෑමක් වූ බව පැහැදිලිය.

ඒ අනුව 1972 මැයි මස 04 වැනිදා අවසන් ව්‍යවස්ථා කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණ අතර එය එම වර්ෂයේ මැයි 22 දින එය සම්මත කරන ලදී. මෙහි කටයුතු සඳහා මුල් වූයේ ආණ්ඩුවේ ඇමතිවරයකු වූ කොල්වින් ආර්. ද සිල්වාය. ඉන් පසු එය රටේ මූලික නීතිය බවට පත්වූ අතර බ්‍රිතාන්‍ය කිරීටයෙන් වෙන්වූ ස්වාධීන ජනරජයක් විය. එසේ වුවත් පාලකයන්ගේ විවිධ බල වුවමනාවන් නිසා මෙම ව්‍යවස්ථාවේ පොදු සමාජයට අහිතකර කරුණු රැසක්ම පැවති බවද මෙහිලා සඳහන් කළ යුතුය.

## ඉඩම් ප්‍රතිසංස්කරණය

71 අරගලයට සම්බන්ධ බහුතර තරුණ තරුණියන් ඊට දායක වූයේ පැවති බරපතළ සමාජ අසාධාරණය නිසා බව අරගලයත් සමඟ මතුවූ ප්‍රධානම කරුණකි.

පංති විෂමතාවය එහි පදනම් හේතුවය. ඒ වන විටත් ඉහළම වරප්‍රසාද ලැබූ වලව් කීපයක්ම පැවති අතර රටේ ඉඩම් අයිතියෙන් විශාල ප්‍රමාණයක් ඔවුන් සතු විය. හොරගොල්ල වලව්ව, බෝතලේ වලව්ව, ඔබේසේකර වලව්ව, ආටිගල වලව්ව, මහවලතැන්න වලව්ව ආදිය ඊට උදාහරණයන් කිහිපයකි. පීඩිත ජනකොටස් ඉඩම් අයිතිය අහිමිව අසරණ වෙද්දී ධන කුවේරයන් සතුව අක්කර සිය දහස් ගණන් පැවතුණි.

ඒ අනුව මෙම ඉඩම් අයිතිය සඳහා සීමාවක් පනවා ඉතිරිය රජයට පවරා ගත යුතුය යන පදනමින් 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත ඉදිරිපත් විය. මේ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා වූ නීතිඥ හෙක්ටර් කොබ්බෑකඩුවය. 1972 අගෝස්තු 26දා ඉදිරිපත්වූ මෙම පනතේ මෙසේ සඳහන්ය.

"ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීම සඳහාද, පුද්ගලයන් විසින් අයිතිව තබාගත හැකි කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය පිළිබඳ උපරිමයක් නියම කිරීම සඳහාද, ඒ උපරිමයට වැඩියෙන් අයිතිව තිබෙන ඉඩම් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කිරීම පිණිස හා ඒ ඉඩම් කොමිෂන් සභාව විසින් දෙනු ලබන ව්‍යවස්ථාපිත බද්දක් පිට කලින් අයිතිකරුවන් විසින්ම දැරීමට විධිවිධාන සැලැස්වීම සඳහාද, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු වන කෘෂිකාර්මික ඉඩම් නිෂ්පාදනය හා රැකී රක්ෂා වැඩිවන පරිදි එම කොමිෂන් සභාව විසින් යොදවනු ලබන කාර්යයන් හා ආකාරය නියම කිරීම සඳහාද, මේ පනත යටතේ සිය ඉඩම් අහිමි වූ තැනැත්තන්ට වන්දි ගෙවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා යන ඒවාට සම්බන්ධ හෝ අනුශාංගික කරුණු පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි."

ඒ අනුව එක් අයකුට තබාගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය අක්කර 50කට සීමාකරන ලදී. එම ඉඩම් තනිකරම කුඹුරු ඉඩම් නම් එය උපරිම අක්කර 25ට සීමා කරන ලදී.

මෙය සැබවින්ම තරමක විප්ලවකාරී ප්‍රතිසංස්කරණයක් වූ අතර ධන කුවේරයන් රැසකට තම ඉඩම් සීමාකිරීමට සිදුවූ අතර රජයට සෙසු ඉඩම් පවරා ගන්නා ලදී. රන් පවුම් වතු ලෙස හැඳින්වූ අක්කර දහස් ගණන් විශාල තේ වතු වූ ලිප්ටන් හා බෲක්බොන්ඩ් වැනි වතුද ජනසතු කරන ලදී. අදාළ ප්‍රමාණ අනුව ඉඩම් හිමියන් වෙත වන්දි ලබාදෙන ලදී. ඉඩම් අහිමි ජනතාවට ඉඩම් ලබාදීමද සිදුකළ බව එවකට ආණ්ඩුවේ සංඛ්‍යාලේඛන පෙන්වා දේ. 1972 ඉඩම් අක්කර ලක්ෂ 06ක්ද, 1975 වතු ඉඩම් අක්කර ලක්ෂ 09ක්ද ජනසතු කළ බව සඳහන් වේ.

පසුව 1977 බලයට පැමිණි ජේ.ආර්. ජයවර්ධන මෙම ඉඩම් සීමාව අක්කර 100 දක්වා වැඩිකරන ලදී. එසේම නිලධාරීවාදය හා දේශපාලන මැදිහත්වීම් නිසා රාජ්‍ය වතු පාඩු ලැබීම සිදුවිය. කෙසේ වෙතත් ඉඩම් ප්‍රතිසංස්කරණයක් කිරීමට සමගි පෙරමුණු ආණ්ඩුවට සිදුවීම ඉතිහාසයේ වැදගත් කරුණකි.

## රැකියා වැඩපිළිවෙළ

සමාජ අසාධාරණය පෙන්නුම් කළ තවත් ප්‍රබල සාධකයක් වූයේ රැකියා ප්‍රශ්නයයි. තරග විභාග නාමිකව පැවතියත් දේශපාලන බලය හිමි අය තමන්ගේ පවුල්වල ඥාතීන්ට හා හිතවතුන්ට රැකියා ලබාදීම දිගටම පැවති ක්‍රමයයි. ඒ නිසා උගත්, නූගත් සියලුම තරුණ ප්‍රජාව අතර රැකියා විරහිත ප්‍රශ්නය බරපතළ වී පැවතුණි. අරගලයෙන් පසු ආණ්ඩුවට රැකියා ලබාදීමේදී දේශපාලන ඇඟිලි ගැසීම් වැළැක්වීමට ක්‍රමයක් හඳුන්වා දීමට සිදුවිය. මෙයට මුල් වූයේ එවකට රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා වූ ෆීලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායකය.

**71 අරගලයට සම්බන්ධ බහුතර තරුණ තරුණියන් ඊට දායක වූයේ පැවති බරපතළ සමාජ අසාධාරණය නිසා බව අරගලයත් සමග මතුවූ ප්‍රධානම කරුණකි. පංති විෂමතාවය එහි පදනම් හේතුවය. ඒ වන විටත් ඉහළම වරප්‍රසාද ලැබූ වලව් කීපයක්ම පැවති අතර රටේ ඉඩම් අයිතියෙන් විශාල ප්‍රමාණයක් ඔවුන් සතු විය.**

අ.පො.ස. සා.පෙළ. සමතුන්ට රැකියා ලබාදීමේ අරමුණ යටතේ ක්‍රමවේදයක් සකස් කෙරිණි. එනම් පරිගණක ලකුණු මත රැකියා දීමේ ක්‍රමයයි. ඒ අනුව ගැසට් නිවේදනයක් මගින් රැකියා අපේක්ෂිත අයගෙන් අයදුම්පත් කැඳවනු ලබයි. එහිදී අ.පො.ස. සා.පෙ. සමත්වූවන් එකිනෙක විෂයට ලබාගත් සාමාර්ථය සැලකිල්ලට ගෙන ලකුණු ක්‍රමයක් යොදා ගනී. එවකට පැවති ලකුණු ක්‍රමය අනුව විශිෂ්ට සාමාර්ථයක් (D) සඳහා ලකුණු 75ක්ද, සම්මාන සාමාර්ථයක් (C) සඳහා ලකුණු 50ක්ද, සාමාන්‍ය සාමාර්ථයක් (S) සඳහා ලකුණු 40ක්ද වශයෙන් ලකුණු ගණනය කරනු ලැබීය. ඊට අමතරව මුළු උපාධියම සඳහා ලකුණු 70ක් ලබාදෙයි. මෙසේ පිළියෙල කරගත් ලකුණු පරිගණක ගත කරනු ලබයි.

එකිනෙක රාජ්‍ය ආයතනයන්හි ලිපිකාර ධූර පුරප්පාඩු පවතින්නේ නම් රාජ්‍ය පරිපාලන

අමාත්‍යාංශයේ රැකියා බැංකුවට දැනුම් දුන් පසු ඒ ඒ ආයතනයේ දැරීමට සිදුවන වගකීම් අනුව සලකා බලා වර්ග කරන ලද ලකුණු මට්ටම අනුව ශ්‍රී ලංකා මහ බැංකුව, සෙසු රාජ්‍ය බැංකු, ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රජයේ විගණන දෙපාර්තමේන්තුව ආදී වශයෙන් ඒ ඒ ආයතන සඳහා ඉහළ සිට පහළට ලකුණු මට්ටම් තීරණය කොට එම වර්ගීකරණයට අදාළ ලැයිස්තු ඒ ඒ ආයතනයට යවනු ලබයි. බඳවා ගැනීමට අවශ්‍ය සේවක සංඛ්‍යාව 800ක් නම් 1000කගේ ලැයිස්තුවක් යැවූ පසු අදාල ආයතනයෙන් සම්මුඛ පරීක්ෂණය කොට නියමිත සේවක සංඛ්‍යාව තෝරාගෙන එම ලැයිස්තුව රාජ්‍ය පරිපාලන රැකියා බැංකුව වෙත යැවීමෙන් අනතුරුව මුළු පරිගණක අපේක්ෂක ලැයිස්තුවෙන් මෙම පිරිස ඉවත් කරනු ලබයි. සෑම රාජ්‍ය ආයතනයකම රැකියා පුරප්පාඩු සපුරන්නේ එම ක්‍රමවේදයට බැවින් දේශපාලන ඇඟිලි ගැසීමක් සිදු නොවේ. එබැවින් හැම අපේක්ෂකයෙකුටම තමන් ලැබූ සුදුසුකම් මත දේශපාලන බලපෑමකින් තොරව රැකියාවක් ලැබීමේ අයිතිය තහවුරු වේ. තමන් ලැබූ සුදුසුකම් මත තමන්ට රැකියාව ලැබෙන්නෙ කුමන ආයතනයේද යන්න කල් ඇතිවම හැම අපේක්ෂකයෙකුටම දැනගත හැකිය.

එහෙත් බොහෝ දේශපාලන පක්ෂ සහ දේශපාලකයෝ මෙම ක්‍රමයට අකමැති වූහ. "ඕක මම දුන්නු ජොබ් එකක්" යැයි හංවඩු ගසා මියයන තෙක් ඔහුගේ හා පවුලේ අයගේ ඡන්දය ගරා ගැනීමේ අවස්ථා මෙමගින්ම අහෝසි වී ගිය බැවිනි. එහෙයින්ම පරිගණක ලකුණු මත රැකියා ලබාදීමේ මෙකී ක්‍රමයට යා හැකි වූයේ 1972 හා 1973 වැනි කෙටි කාලයක් පමණි. නැවත දේශපාලකයන්ගේ ලැයිස්තු මත රැකියා සපයන ක්‍රමය ඇති විය.

මීට අමතරව පාසල් හැරගිය තරුණ තරුණියන් වෙනුවෙන් වෘත්තීය පුහුණු අධිකාරිය ආරම්භ කෙරුණු අතර ඒවායේ විවිධ වෘත්තීය පුහුණු පාඨමාලා ක්‍රියාත්මක විය. මේ සඳහා රජයේ පාසල්වල සවස් කාලය යොදා ගත් අතර පෙදරේරු කර්මාන්තය, වඩු කර්මාන්තය, මැටි කර්මාන්තය, කාර්මික පාඨමාලා, රූපලාවන්‍ය පාඨමාලා ආදී විවිධ පාඨමාලා ආරම්භ කෙරුණි.

## සමූහ ගොවිබිම් ඇති කිරීම

රැකියා අවස්ථා ඇති කිරීමටත්, සමාජ අසාධාරණය දුරු කරන බව පෙන්වීමටත් එවකට ආණ්ඩුව ආරම්භ කළ තවත් වැඩසටහනක් වූයේ සමූහ ගොවිපලවල් ඇති කිරීමයි. සමාජවාදී රටවල්වල ක්‍රියාත්මක වූ සමූහ ගොවිපළ ක්‍රමය ආදර්ශයට ගැනීමක් ලෙසද මෙය දැකිය හැකිය. මෙම ගොවිපළ ක්‍රමයේදී ශ්‍රම ඵලදායකත්වයේ හිමිකමද නිෂ්පාදනයේ නියැලෙන අයටම ලැබෙන පරිදි ක්‍රමවේදය සකසා තිබුණි. සමසමාජ, කොමියුනිස්ට් පක්ෂ නියෝජනය කළ මැති ඇමතිවරු සිටි ආසනවල වැඩිපුර මේවා ක්‍රියාවට නැගුණි. මාතර - මොරවක, කෑගල්ල - දෙහිඕවිට, රුවන්වැල්ල හා දැරණියගලද, මහනුවර - ගලහ, හේවාහැට හා හඟුරන්කෙතද, ආරම්භ කළ ගොවිපොළවල් මීට උදාහරණ ලෙස දැක්විය හැකිය. කෙසේ නමුත් මේවායේ අවස්ථා සැලසුණේ අදාළ දේශපාලකයන්ගේ සමීපතමයන්ට නිසාත්, ඒවා රට පුරා සාර්ථක කිරීමට වැඩපිළිවෙළක් නොමැති වූ නිසාත් සැබැවින්ම ධනපති ක්‍රමය තුළ එවැනි දේ යථාර්ථයක් කිරීම ප්‍රයෝගික නොවන නිසාත් ප්‍රතිඵලදායක වූ බවක් නොපෙනේ.




ඒ අතර ජනතා කමිටු පිහිටුවීම නමින් ද ආණ්ඩුව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලද අතර සෝවියට් දේශයේ සොවියට් සභා සහ චීනයේ කැන්ටන් යනුවෙන් හැඳින්වූ ජනතාව බලගන්වන ක්‍රම මේවාට පූර්වාදර්ශ කර ගන්නා බව ප්‍රකාශයට පත්විය. එවකට අගමැතිනිය වූ සිරිමා බණ්ඩාරනායකගේ එක් දියණියක් වූ සුනේත්‍රා බණ්ඩාරනායකත්, කුමාර් රූපසිංහත් යන දෙදෙනා මෙම වැඩපිළිවෙළට මුල් වී කටයුතු කළහ. එහෙත් මේවා ප්‍රායෝගිකව යථාර්ථයක් කළ හැකි ඒවා නොවීය.

පොදුවේ ගත්කළ තරුණ ප්‍රශ්න පිළිබඳ වැඩිපුරම සිතීමට ආණ්ඩුවට බලකළේ අප්‍රේල් නැගිටීම විසින් බව පැහැදිලිය. ඒ වන විටත් පැවති ජාතික තරුණ සේවා සභාවේ වැඩකටයුතු වඩාත් පුළුල් තලයකට ගෙන ඒමටද මෙම නැගිටීම හේතු වූ බව පෙනේ.

මේ අනුව 71 අප්‍රේල් අරගලය පරාජය වුවද එය සමාජයට කළ බලපෑමත්, සමාජයට දිනා දුන් ප්‍රතිසංස්කරණත් දෙස බලන විට එම අරගලය කෙතරම් ප්‍රබලද යන්න තේරුම් ගත හැකිවනු ඇත■

ගිලිහුණු තුවක්කුව සොහොයුරකුගේ අතින්
දැඩි කොට වැළඳ ගන්නෙමි හද පිරුණු බැතින්
පෙරමුණු සොහොයුරන්ගේ මළ කඳන් මතින්
නැවතත් සටන් වදිනට අපි බලමු ඉතින්

**71 සිරගෙදර බිත්තියෙන්**





1971 මැයි මාසයේදී අත්අඩංගුවට පත්ව වසර 06ක් සිරගතව සිටි චාල්ස් දයානන්ද සහෝදරයා සිරගෙයි ජීවිතය සිතුවමට නැගුවේය. එය ලංකාවේ සිරකරුවන් සම්බන්ධයෙන් ජීවමාන සාක්ෂි සහිත පළමු සිතුවම් පෙළ වේ. දැනට සැත්තෑ එක්වන වියේ පසුවන දයානන්ද සහෝදරයා අදටද සමාජවාදී සමාජයක් ගොඩනැංවීම සඳහා මතවාදී අරගලයක නියැලෙමින් සිටී. ඔහු සටන්කාමියකු ලෙස 71 අරගලය සම්බන්ධ සිය මතකය අවදි කරමින් මෙම කතාබහට එක්වන්නේ 71 අරගලයට වසර 50ක් පිරීම නිමිත්තෙනි.





# අදත් ඒ සටන්කාමියා මා තුළ ජීවත් වෙනවා

චාල්ස් දයානන්ද
සහෝදරයා

## ඔබ ගැන කෙටි හැඳින්වීමක් කළොත් ?

මට දැන් අවුරුදු හැත්තෑඑකයි. මම රජයේ සේවයේ නියුතුව ඉඳලා දැන් විශ්‍රාම ගිහින් ඉන්නේ. නමුත්, මම වැඩ අතහැරලා නෑ. චිත්‍ර අඳිමින්, කියවමින්, සමාජ, දේශපාලන කටයුතුවල නිරත වෙමින් ඉන්නවා.

## ඔබේ ළමා කාලය, තරුණ කාලය හා ජවිපෙට සම්බන්ධ වීමට පෙර පසුබිම ගැන පැහැදිලි කළොත් ?

මගේ ළමා කාලය ගත වුණේ, බලංගොඩ, ඕලුගංතොට. බොහොම ලස්සන, සුන්දර ගමක්. මගේ පියා වඩු කාර්මිකයෙක්. මම ඉගෙන ගත්තේ, බලංගොඩ බුද්ධ ජයන්තිය කියන පුංචි ඉස්කෝලෙක. ඇත්තටම ඒ කාලේ අපිට අඳින්න ඇඳුම් වුණත් තිබුණෙ නෑ. සපත්තු දාන්නෙත් නැතුව පයින්ම බොහොම දුෂ්කර විදියටයි ඉස්කෝලේ ගියේ.



ඒ කාලෙදීම ගෙදර තිබුණු දරිද්‍රතාව, අපේ නිර්ධන පන්ති ස්වභාවය අපට තදින් දැනුණා. මම උසස් පෙළට ඉගෙන ගනිද්දිත් සටහන් ලියන්න පොත් පත් තිබුණේ නෑ. මගේ නැන්දා කෙනෙක් ඉස්පිරිතාලෙ වැඩ කළා. ඉස්පිරිතාලේ තුණ්ඩු ලියන කොළවල එක් පැත්තක් හිස් තියෙනවා. එයා ගෙනැවිත් දුන්න ඒ කොළවල තමයි, මම උසස් පෙළ පාඩම් ලිව්වේ. ඒ නිසාම කුඩා කාලේ ඉඳලාම අපට මෙහෙම වෙලා තියෙන්නේ, සමාජ අසාධාරණය, අසමානතාව නිසාය කියලා අපට දැනිලා, හිතට වැදිලා තිබුණා. අපේ ගුරුවරුන් අපට ඒ ගැන හොඳින් පැහැදිලි කරලා දුන්නා. ඒ නිසා අපි සමාජ වෙනසක් ගැන ලොකු ජවයකින්, හැඟීමකින් තමයි, හිටියේ.

## ජවිපෙට සම්බන්ධ වුණේ කොහොම ද? ඒකට බලපාපු හේතු හෝ සිදුවීම් මොනවා ද?

ඇත්තටම විශ්වවිද්‍යාලයට ඇතුළු වෙන කොටම අපට සමාජ වෙනසක් කරන්න ඕනෑය කියන හැඟීම තිබුණා. මාත් ඇතුළු හිටපු තරුණ අය වැඩි පිරිසකට තද පීඩාකාරී බවක්, පීඩනයක් තිබුණා. සමස්ත තරුණ පරපුරම රැකියා අහිමි වීම්, උසස් අධ්‍යාපනය අහිමි වීම්, ඉගෙන ගන්න පහසුකම් නැති වීම් වාගේ ගැටලුවලින් අපි අසහනයට පත් වෙලා සිටියා. විශ්වවිද්‍යාලය තුළත් මේ දැනීම කතාබහට ලක් වුණා. එතකොට තමයි, ජනතා විමුක්ති පෙරමුණ පිබිදෙමින් එන්නේ. ඒත්, ඒ කාලේ ජවිපෙ කියලා නමක් තිබුණේ නෑ. පස්සේ තමයි, ඒ නම දාන්නේ. නමුත්, කිසියම් තරුණ විප්ලවවාදී ව්‍යාපාරයක් ව්‍යාප්ත වෙමින් පවතිනවා කියන හෝඩුවාව අපි දැනගෙන හිටියා. එනිසා අපි ඒකට ආකර්ෂණය වුණා. විශාල ආස්වාදයක් තිබුණේ, අපි කැමැත්තෙන් ඒකට බැඳුණා.

## ඒ කියන්නේ, සහෝදරයා පක්ෂය හොයාගෙන ගිහින් බැඳුණ ද?

ඇත්තටම වුණේ, අපිත් හොයනවා ! අපිවත් හොයනවා !

ඇත්තටම ඒ වෙනකොට අපිව හොයන්න වුවමනාවක් තිබුණේ නෑ. අපි දැනගෙන හිටියා, අපි විඳින පීඩාව සමාජ අසාධාරණයක ප්‍රතිඵලයක් කියලා. එනිසා අපි ආස්වාදයෙන් ඒකට සම්බන්ධ වුණා.

## හැත්තෑඑකේ අප්‍රේල් 5ට පෙර ජවිපෙ තුළ කරන ලද මූලික කටයුතු හා ක්‍රියාමාර්ග මොනවාද? ඒ වාගේ ම තිබුණු ප්‍රධාන පරමාර්ථ මොනවාද?

ඔව්. අපි පංති කළා. ඒ වාගේම වෙනත් විවිධ වැඩ රාශියක් කළා. හැත්තෑඑකට කිට්ටුව නම්, මර්දනයට එරෙහිව ප්‍රතිප්‍රහාර දීමට සිදු වුණොත්, ඊට අදාළ සූදානම් වීම් කළා.

අපි හැත්තෑඑකේ අප්‍රේල්වලට පෙර ලංකාව පුරාම ගහපු පෝස්ටර් දෙකක් තිබුණා. එකක් තමයි, 'අධිරාජ්‍යවාදයට විනාශය! ජනතාවට විමුක්තිය!!'. අනික තමයි, 'ධනවාදයට විනාශය! ජනතාවට සමාජවාදය!!' මේ දෙක තමයි. ප්‍රබලම සටන් පාඨ දෙක වුණේ. මේක ලංකාව පුරාම හැම තාප්පයකම ගැහුවා.

ඒ නිසා අපි කළේ සමාජවාදී විප්ලවයක්! ඒක මේ විදියට අසාර්ථක වුණත්, ඒකේ සංවිධාන දුර්වලතා කොපමණ තිබුණත්, සම්බන්ධ වෙච්ච අපි, තරුණ පරපුර හැටියට අපි සම්බන්ධ වුණේ, සමාජවාදී සමාජයක් ගොඩනගන්නයි.

## එහෙම නැතුව ආර්ථික අමාරුකම්වලට රැකියාවක් ගන්න එහෙම නෙවෙයි ද?

නෑ... නෑ... නෑ.. එහෙම පටු පරමාර්ථ කා ළඟවත් තිබුණේ නෑ. මම කියන්න කැමැතියි, හැම කෙනෙක්ම ජීවිත පුදන්න සූදානම් වුණා. ලෝක සමාජවාදී ව්‍යාපාරයේ පුරෝගාමී චරිත අපේ පූර්වාදර්ශ වුණා. ඔවුන් එදා කොහොමද වෙඩි උණ්ඩවලට මුහුණ දුන්නේ, අන්තිමට සටන්කාමීන් මිය ගියේ කොහොමද? මේ සියල්ලම අපි ආස්වාදනීය විදියට

ග්‍රහණය කර ගත්තා. අපි, අපේ ජීවිත පුදලා හරි ඊළඟ පරපුරට සමාජවාදය ලබා දෙනවා කියන පරමාර්ථය හැර වෙන කිසිම පෞද්ගලික පරමාර්ථයක් තිබුණේ නෑ.

මම දන්නවා, සමහර සහෝදරවරු මිය ගියේ, "වෙඩි තියපල්ලා, අපි සමාජවාදය වෙනුවෙන් මැරෙන්න බය නෑ" කියලා කෑ ගසමින්.

හැත්තෑඑකේ අරගලය ගැන කවුරු මොනවා කිව්වත්, මම පැහැදිලිව කියන්නේ, එය සමාජවාදී විප්ලවය වෙනුවෙන් තරුණයන් දැනුම්වත්ව නැඟීසිටීමක් ලෙසයි. හැම කෙනෙක්ම එකට සම්බන්ධ වුණේ එහෙම තමයි.

අපේ අඩුපාඩු තිබුණා. කම්කරු පන්තිය, පොදුජන බලවේග ඔවුන් සම්බන්ධ කර නොගැනීම. නමුත්, පරමාර්ථය වශයෙන් මේ තරුණයන් සෑම කෙනෙක්ම පැහැදිලිවම සමාජවාදය වෙනුවෙන් සටන් කළ අයයි.

අපි ඊට පෙර දේශපාලන අධ්‍යාපන පන්තිවලදී සාකච්ඡා කළා, මීට පෙර පැවැති අරගල ගැන. 1818 සහ 1848 කැරැලි වැනි දේ පිළිබඳව. ඒවා අපි විග්‍රහ කළේ අධිරාජ්‍ය විරෝධී කැරැලි ලෙසයි. නමුත්, මම හිතනවා, ඒවා අධිරාජ්‍ය විරෝධී කැරැලිවලට වඩා වැඩවසම් ක්‍රමය නැවත ඇති කරලා, රජෙක් බිහි කර ගන්න කරපු අරගල කියලා. ඒ නිසා පළමු අධිරාජ්‍ය විරෝධී, සමාජවාදී අරගලය 1971 අරගලයයි.

**ඉතාම තරුණ වයසක් වන විස්ස, විසිදෙක වගේ කාලෙක දී ජවිපෙට, අරගලයට සම්බන්ධ වෙන්නෙ. සමාජවාදය ගොඩනැඟීම ගැන මොන වාගේ සැලසුම්ද, මොන වාගේ සංවාදද තිබුණේ ?**

ඇත්ත වශයෙන්ම සෑහෙන දුරට දැනුවත්. අනික අපි ඔක්කොම උගත් තරුණ පිරිසක්. අපිට සමාජවාදී ආර්ථිකය ගැන අවබෝධයක් තිබුණා. සමූහ ගොවිපළ ක්‍රමය ගැන, රටටම විදුලිය ලබා දීමේ වැඩපිළිවෙළ ගැන අපි දැනගෙන හිටියා. චීනයේ වෙන දේ අපි දැනගෙන හිටියා.

**ඔබ ජවිපෙට සම්බන්ධ වෙනකොට ලංකාවේ ප්‍රබල වමේ පක්ෂ තිබුණා. කොමියුනිස්ට් පක්ෂය, සමසමාජ පක්ෂය වාගේ. ඇයි ඒවාට සම්බන්ධ නොවී ජවිපෙට සම්බන්ධ වුණේ ?**

අපට ඒවා ගැන ඉතාම දැඩි කලකිරීමක් තිබුණා. අපිට කොමියුනිස්ට්, සමසමාජ පක්ෂ ගැන තිබුණේ, කලකිරීමක්. මට මතකයි, පිලිප් ගුණවර්ධන මහතාගේ නායකත්වයෙන් වාමාංශික එක්සත් පෙරමුණ පිහිටෙව්වා. ඊට පස්සේ ගෝල්ෆේස් එකේ අතිවිශාල රැස්වීමක් තිබ්බා. එදා සමසමාජ, කොමියුනිස්ට්, මහජන එක්සත් පෙරමුණ එකතු වී වාමාංශික එක්සත් පෙරමුණ හැදුවා. ඔය රැස්වීමේ දී පිලිප් කිව්වා, "අද තමයි, මේ රටේ සමාජවාදී ව්‍යාපාර එකට එකතු වෙලා දැවැන්ත බලයක් ගොඩනඟන්නේ. කොමියුනිස්ට් පක්ෂයේ සිමෙන්තිත්, සමසමාජයේ වැලිත්, මහජන එක්සත් පෙරමුණේ ගලුත් එක් කර බිඳිය නොහැකි කොන්ක්‍රීට් එකක් හදනවා" කියලා කිව්වා. රටම මේ ගැන බලාපොරොත්තුසහගතව හිටියා. හැබැයි, එහෙම කියලා දවස් ගණනක් ගියේ නෑ. සමසමාජ, කොමියුනිස්ට් නායකයන් සිරිමාවෝගේ ආණ්ඩුවට මුක්කු ගැහුවා. මුක්කු ගහලා ඇමතිකම් ගත්තා. මේකෙන් සමාජය තුළ වික්ෂෝපයක් ඇති වුණා; කඩාගෙන වැටුණා. ඒකෙන් වමේ ව්‍යාපාරය ධනපති පන්තියට මුක්කු ගසා මිනිස්සුන්ගේ බලාපොරොත්තු බින්දා. අපි මේවා තරුණයෝ විදියට දැක්කා. ඒ නිසා අපි මේ පක්ෂ තුනම අතහැරලා, ගොඩනැඟෙමින් එන නව ව්‍යාපාරය වැළඳ ගත්තා ඒකයි, ඇත්ත කතාව.

> හැත්තෑ එකේ අරගලය ගැන කවුරු මොනවා කිව්වත්, මම පැහැදිලිව කියන්නේ, එය සමාජවාදී විප්ලවය වෙනුවෙන් තරුණයන් දැනුම්වත්ව නැඟීසිටීමක් ලෙසයි. හැම කෙනෙක්ම ඒකට සම්බන්ධ වුණේ එහෙම තමයි.

**හැත්තෑඑකේ අප්‍රේල් ප්‍රහාරයට සම්බන්ධ වුණේ කොහොම ද? මොන විදියට ද?**

මමත් ප්‍රහාරක ඒකකයක සාමාජිකයෙක් වෙලා හිටියා.

**ඒ යුගය විප්ලවවල යුගයක්. ඔක්තෝබර් විප්ලවයට අවුරුදු පනහ පිරිලා. යූරි ගගාරින් අභ්‍යාවකාශය ජයග්‍රහණය කරලා. චීන විප්ලවය ජයග්‍රහණය කරලා. කියුබානු විප්ලවය ජයග්‍රහණය කරලා. වියට්නාම් විප්ලවය ඇමෙරිකාවට බැට දෙන කාලේ. මේ පසුබිම චාල්ස් සහෝදරයලාට ඇති කරපු බලපෑම මොකක් ද?**

ඇත්තටම අපි ඒ වෙන කොට ලෝක සමාජවාදී ව්‍යාපාරයෙන් කුල්මත් වෙලා හිටියා. හැත්තෑව දශකය වෙනකොට තමයි, වියට්නාම් විප්ලවය වෙන්නේ. ඒ දිනවල වියට්කොංවරුන් ඇමෙරිකානුවන්ට පහර දෙන කාලේ. මට මතක සිද්ධියක් තියෙනවා. වියට්කොංවරුන්ගේ ප්‍රහාර මැද්දේ එක් ඇමෙරිකානු හමුදා කඳවුරක් වැටෙනවා. ඇමෙරිකානුවන් යටත් වීම ප්‍රකාශ කරන්න සුදු කොඩියක් දානවා. ඒත් වියට්කොං ගරිල්ලෝ තමන්ගේ යුද ටැංකිය ඇමෙරිකානු කඳවුරේ ගේට්ටු කඩාගෙන ගිහින් සුදු කොඩිය ගලවලා, ඒකේ රතු කොඩියක් ඔසවනවා.

ඒවායින් අපි විශාල ප්‍රබෝධයකට ලක් වුණා.

ඒ වාගේම එතකොට චීන විප්ලවය දිනලා. කියුබානු විප්ලවය දිනලා. ඒ වාගේම ඒ කාලේ සෝවියට් දේශයෙන් විශාල මතවාදී ව්‍යාපාරයක් ගෙනිච්චා. එයාලා 'සෝවියට් දේශය' සඟරාව පළ කළා. ඒක අපට ආවා. අපි ඒවා කියෙව්වා. ඒ වාගේම ප්‍රගති ප්‍රකාශන මන්දිරයෙන් පොත්, පත්තර පළ කළා. ඒ වාගේම කොරියාවේ ඒ කාලේ බලයේ හිටියේ කිම් ඉල් සුං. ඒ කාලයේ කොරියානු තානාපති කාර්යාලයෙන් ගහපු පුවත්පතක එක පිටුවක් කිම් ඉල් සුංගෙ කතාවකට වෙන් කරනවා. අපි ඒක කියෙව්වා. ඒ නිසා අපිත් දුටුවා ලංකාව, ඉන්දියාව වාගේ දකුණු ආසියානු රටවලටත් විප්ලවයක අවශ්‍යතාව තියෙන බව. අපි ඒ ගැන හොඳට දැනුවත්භාවයක හිටියා.

ඒ නිසා අපි ජවිපෙට සම්බන්ධ වුණේ, කෙළින්ම සමාජවාදය වෙනුවෙන්. නැතුව වෙන දෙයකට නොවෙයි.

## අරගලය පරාජය වුණාට පස්සේ ඔබ අත්අඩංගුවට පත් වෙනවා. ඒක සිද්ධ වුණේ කොහොම ද?

මමයි, ගමනායක සහෝදරයයි එක බැච් එකේ. අරගලයෙන් පස්සේ ඔත්තු අංශ විසින් අපිව අත්අඩංගුවට ගත්තා. හැම කෙනකුම අත්අඩංගුවට පත් වුණා. ඒ පාවා දීම් නිසාම නොවෙයි. අපේ තොරතුරු විශාල ප්‍රමාණයක් ආරක්ෂක අංශ ළඟ තිබුණා. ඒ වාගේම අත්දැකීම් නැතිකම විසිනුත් අපේ සමහර සහෝදරවරුන්ගෙන් ඔවුන් තොරතුරු ලබාගෙන තිබුණා. නමුත්, කිසිම සබඳතාවක් නොතිබුණු අයත් අත්අඩංගුවට ගත්තා.

## හිරගෙදර දී කටයුතු කළේ කොහොම ද?

ඇත්තටම මාව අත්අඩංගුවට ගත්තේ, හැත්තෑඑකේ මැයිවල වගේ. ඊට පස්සේ අපව කොළඹ සී.ආර්.පී. එකේ රිමාන්ඩ් බන්ධනාගාරයේ රඳවා තැබුවා. ඒකේ ඉඩ තිබුණේ දෙසීයකට. ඒත් ඒකේ හත්සීයක් හිටියා. අපි ඉතාම දරුණු විදියට හිරගෙදර දි දුක්වින්දා. මුල් කාලයේ දී අපට සැලැකුවේ ඉතාම පහත් විදියට. වතුර නෑ. වැසිකිළි පහසුකම් නෑ. කෑම හරියට නෑ. නාන්න නෑ. අනික කාමරේ ඉඩ තියෙන්නේ තුන්දෙනාටයි. දහ දෙනෙක් විතර එක කාමරේ. එකා පිට එකා තමයි, හිටියේ. ඒ පීඩනය හැම හිරගෙදරකම තිබුණා. සී.ආර්.පී., මැගසින්, බෝගම්බර හැම තැනම මේ පීඩනය තිබුණා. මේ පීඩනය දරා ගන්න බැරිව ඉන්න කොට මීගමුවෙන් තව 500ක් අරන් ආවා. එදා මේ පීඩනය පුපුරලා ගියා. අපි එදා කට්ටිය එකතු වෙලා හිරගෙදර සියලු ම දොරවල් කැඩුවා. දොරවල් කඩලා එළියට බැස්සා. ඒක දැනුණේ විප්ලවය වාගේ. අපි කට්ටිය ගිහින් ජේලර්ලට දිගට හරහට ගගහා පැන්නුවා. ගාඩ්ලා පැනලා ගිහින් දොරවල් වහ ගත්තා. දැන් අපි විතරයි හිරගෙදර.

ඊට පස්සේ හමුදාවෙන් හිරගෙදර වට කළා. පැය විසිහතරක් ගත වුණා හමුදාව වට කරලා. අපිට කෑමත් නෑ. දෙවැනි දවසේ හමුදා කණ්ඩායමක් දොරවල් ඇරගෙන ඇතුළට ආවා. අපිට කරන්න දෙයක් නෑ. අපි ඔක්කොම දෙනා ඉදිරියට දිව්වා. ගේට්ටුව ළඟට ආවා. හමුදා කට්ටිය තුවක්කු මානාගෙන ඉන්නවා. අපි දාහක් විතර ඉස්සරහම හිටගෙන ඉන්නවා. අපි මරාගෙන මැරෙන්න ලෑස්ති වෙලා හිටියේ. හමුදා නායකයා කිව්වා, අපිට වාඩි වෙන්න කියලා. අපේ සහෝදරයෙක් කිව්වා වාඩි වෙන්න කියලා. එහෙම කියලා ඔහු කතාවක් කළා. ඉතා වේගවත් කතාවක්. හමුදා භටයන්ටයි කතාව කළේ. ඒ කතාවේ අඩංගුව ඉතා ම මානුෂිකයි. ඒකෙන් කිව්වේ, "අපිට මිනිස්සු හැටියට ජීවත් වෙන්න දෙන්න" කියලයි. "අපි සටන් කළේ සමාජවාදය වෙනුවෙන්. ඔයාලා වෙනුවෙන්, ඔයාලගේ දරුවන් වෙනුවෙන්, රට වෙනුවෙන්. අපි හොරු, මංකොල්ලකාරයෝ නෙවෙයි." කියලා.

මේ කතාව හමුදාවට වැදුණා. හමුදාව දැඩි සංවේදී වුණා. ඔවුන් තුවක්කු පහළ දැම්මා. හමුදා මේජර් ආරියප්පෙරුම, මට මතකයි, නම. ඔහු නැගිටලා කිව්වා, "දරුවනේ, කලබල වෙන්න එපා. සන්සුන් වෙන්න. මට ඔයාලාගේ ප්‍රශ්නය තේරෙනවා. මම මේ කෑම්ප් එක භාර ගන්නවා. මම සාකච්ඡා කරන්නම් ඔයගොල්ලො එක්ක" කියලා.



ඊට පස්සේ මේ රැල්ල හැම හිරගෙදරකටම ගියා. අපි ජයග්‍රහණ ගත්තේ සටන් කරලා. ඊට පස්සේ රජය පුනරුත්ථාපන ව්‍යාපෘතියක් ආරම්භ කරන්න වුණා. ඒ කියන්නේ, සිරකරුවන්ට සුබසාධනය සැලැසිය යුතු දෙයක් කියලා රජය පිළිගත්තා. ඔවුන්ට පොත් පත්, ක්‍රීඩා උපකරණ, තරමක හොඳ කෑම-බීම ආදී පහසුකම් ලබා දීලා කරන දෙයක්.

ඒක අපිට පහසුවක් වුණා වාගේම අද මම හිතනවා, අපේ විප්ලවීය ජීවගුණය මරන්නත් ඒක යොදා ගත්තා කියලා. ඒක හොඳ ධනේශ්වර උපායමාර්ගයක්. එනම්, සුබසාධනය දීලා, සුබසාධනය මඟින් විප්ලවවාදීන්ගේ ජීවගුණය බිඳදැමීම කළා. හැබැයි, එහෙම වුණා කියලා විප්ලවීය ව්‍යාපාරය සහමුලින් බිඳවැටුණේ නෑ.

මේ කාලෙදී අරගලය අසාර්ථක වීමත් සමඟ සිරගෙවල් තුළ ඉතාම දැඩි සාකච්ඡා අරගලය ගැන සිදු වුණා. අපි කරපු දේ හරිද වැරදිද? අපට වැරදුණේ කොතැනද? අපි සටන් කරන කොට කම්කරු පන්තිය අපි සමඟ එක් නොවුණේ ඇයි? පොදු ජනතාව සම්බන්ධ නොවුණේ ඇයි ආදිය පිළිබඳව.

මේ නිසා හැත්තෑ එකේ අරගලය ගැන තියුණු, බරපතළ න්‍යායික සහ ප්‍රායෝගික දුර්වලකම් ගැන දැඩි සංවාදයක් අප අතර සිදු වුණා. අපි ප්‍රශ්න යවනවා, විජේවීර සහෝදරයා පිළිතුරු ලියලා එවනවා.

මේ තත්ත්වය තුළ විශාල පිරිසක් නිෂ්ක්‍රිය වුණා. සමහරු ජවිපෙට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. පුනරුත්ථාපන, සුබසාධන කටයුතුවලින් බොහෝ අය ඒ පැත්තට යොමු වුණා. ඒ වාගේම තව කණ්ඩායමක් මේක අත්හරින්නේ නැතුව, වැරදි හදාගෙන විප්ලවය වෙනුවෙන් වැඩ කළ යුතුය කියන ස්ථාවරයේ හිටියා.



### ඔබ වසර හයක් සිරගෙදර හිටියා. ඒ කාලය තුළ සිරගෙදර වැඩකටයුතු සිදු වුණේ කොහොමද?

අපි කරපු අරගලයෙන් පස්සේ අපිට යම් ඉඩක් ලැබුණා. අපි විශාල ලෙස පන්ති කළා. සංවිධාන කැඳවූවා. අපි කරපු අරගලයෙන් පස්සේ අපිට පහසුකම් දුන්නා. බන්ධනාගාර බලධාරීන් අපි ඇතුළේ කර ගන්න ඒවා පාලනය කරන්න ආවේ නෑ. ඔවුන් උනන්දු වුණේ, නිරතුරුව තාප්ප පරීක්සම් කරන්න විතරයි. ඒ නිසා අපට අසීමිත නිදහසක් ලැබුණා. පොත් කියවන්න ලැබුණා. අපි කොළඹ නගර සභා පුස්තකාලයෙනුත් පොත් ගෙන්වා ගත්තා. ප්‍රසිද්ධියේ පක්ෂයේ කඳවුරු කළා. ඒකෙන් විශාල කට්ටියක් දැනුවත් වුණා. එමෙන්ම පාසල් අධ්‍යාපනය ලබා නැති අයට පාසල් අධ්‍යාපනය ලබා දීමත් සිදු කළා. මම නම් හිතන්නේ, අපේ දේශපාලන මුවහත්භාවය හොඳින්ම වැඩි වුණේ, හිරගෙදර හිටපු කාලයේයි. එහි දී විශාල ලෙස පොත් කියෙව්වා. ඒක විශ්වවිද්‍යාලයක් වුණා.

මම හිතනවා, හිරගෙදර තුළ පක්ෂයෙන් කරන ලද අධ්‍යයන පංති, සාකච්ඡා, කඳවුරු, සංවාද නිසා අපි ඉතාම හොඳින් දැනුම්වත් වුණා කියලා.

### ඔබ තුළ සිටින චිත්‍ර ශිල්පියා මතු වුණේ, අරගලයට පෙර ද? අරගලය තුළ ද? ඉන් පසු ද? සිරගෙය තුළ සිතුවම්කරණය පිළිබඳ අත්දැකීම් මොන වාගේ ද?

මම පුංචි කාලේ ඉඳලාම චිත්‍ර අඳින්න දක්ෂයි; ආසයි. ඒක මගේ ඇඟේම තිබුණු දෙයක්. හැබැයි, මේක හොඳින්ම මතු වුණේ හිරගෙදර දී. මම ඔය කාලේ හිටියේ බෝගම්බර. චිත්‍ර කියන එක හැම තැනකදීම ඕනෑ වෙනවා නේ. අඩු ගාණේ අකුරු ටිකක් ලියන්න හරි. මොකද? අපි පොත් පත් කියවනවා. දේශපාලනය කරනවා. තව පිරිසක් එහෙම නෑ. ඔවුන් පොල්කෙඳිවලින් මාල හදනවා. පොල්කටුවලින් කැටයම් කපනවා. ඒ කාලේ බන්ධනාගාරය, රජය හරි උපායශීලීයි. අපේ අවධානය දේශපාලනයෙන් විතැන් කිරීමේ වුවමනාවටත් එක්ක අපට විනෝදාංශ පංතියකට (Hobby Class) තැනක් බන්ධනාගාරයෙන් හදලා දුන්නා. ඒකට චිත්‍ර, කැටයම් ආදිය දන්න අය සම්බන්ධ වුණා. මමත් සම්බන්ධ වුණා. අවශ්‍ය අමුද්‍රව්‍ය අපිට රතුකුරුසෙන් එහෙමත් ලබා දුන්නා.

ඒකත් එක්ක මට සිද්ධ වුණා හැම කෙනාගෙම නිර්මාණවලට ඕනෑ කරන මූලික සැලැස්ම (Sketch) අඳින්න. මොන දේ කරන්නත් එහෙම එකක් ඕනෑ නේ. ඇත්තටම මම කියන චිත්‍ර ශිල්පියා බිහි වුණේ හිරගෙදරින් කියන එක නිවැරදියි.

ඒ එක්කම මට හිතුණා හිරගෙදර ජීවිතය චිත්‍රයට අඳින්න. ඒ පස්සේ ප්‍රදර්ශන තියන්න හිතාගෙන නෙවෙයි. මම ඒක තනි තනි සිරකරුවන්ගේ පින්තූර ඇඳීමෙන් පටන් ගත්තත්, පස්සේ මම බෝගම්බර හිරගෙදර ඇත්ත ජීවිතය චිත්‍රයට නැගුවා. පස්සේ එළියට ඇවිත්, 'සිරගෙදර සිතුවම්' කියලා ප්‍රදර්ශනයක් කළා.

**ප්‍රසිද්ධියේ චිත්‍ර ඇන්දා නම්, ඇයි චිත්‍ර සිරගෙදර හංගාගෙන හිටියේ ?**

ඒකට හේතුව අපට අඳින්න අවසර තිබුණු චිත්‍ර නෙමෙයි, මම ඇන්දේ. මම ඇන්දේ බන්ධනාගාරේ



කටුක, කෲර ජීවිතය. ඒවා දැක්කා නම්, ජේලර්ලා ඒවා අත්අඩංගුවට ගන්නවා. අනික කාලයක් ගියාම ජේලර්ලා යාළු වුණා. අපේ කුටි පරීක්ෂා කරන්න එනවා නම්, කලින් අපිට කියනවා, ඔන්න හෙට 'සර්ච්' (Search) කරනවා තියෙන දේවල් පරිස්සම් කර ගන්න කියලා. ඒ චිත්‍ර ඔරිජිනල් ඒවා. ඒ විදියටම අවුරුදු පනහක් තිස්සේ එහෙමම තියෙනවා.

**ඒවායේ විශාල ඓතිහාසික වැදගත්කමක් තියෙනවා නේද? ඔබේ චිත්‍ර කෘති ගණනාවක් වශයෙන් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අතර ජාතිවාදයට එරෙහිව ජාතික සමඟිය වෙනුවෙන් ඔබේ පින්සල භාවිත කර තිබෙනවා. හැත්තෑඑකේ අරගලය ඔබ තුළ තිබෙන මේ අගනා පුරුෂාර්ථයන් පෝෂණය කරන්න දායක වුණේ කොහොම ද?**

ඇත්ත වශයෙන්ම අපි සමාජවාදය වෙනුවෙන් පෙනී සිටි පිරිසක්. "ලෝකයේම කම්කරුවනි, එක්වව්" කියන එකයි අපේ අරමුණ වුණේ. අපි විශ්වාස කළේ ලෝකයේම නිර්ධන පන්තිය ගැන. ලංකාවේ අපි කියන්නේ, ඒකෙන් කොටසක්. ඒක තුළ ජාතිවාදය, ආගම්වාදය තියෙන්න බැහැ. නිර්ධන පන්ති සබඳතාව කියන්නේ, ජාතිය, ආගම විනිවිද ගිය එකක්. හැත්තෑ එකේ අරගලයෙන්, පංති තුළින්, සාකච්ඡා තුළින් අප තුළ ඒ අදහස මුල් බැහැ ගත්තා. අපි චින්තනමය වශයෙන් සමාජවාදීන්, කොමියුනිස්ට්වාදීන් වෙලා හිටියේ. ඉතින්, අපි තුළ ජාතිවාදයක් තිබුණේ නැහැ.

මට එක සිද්ධියක් මතකයි. 1972දී ව්‍යවස්ථාව වෙනස් කළා. හැත්තෑදෙකේ ව්‍යවස්ථාවට කලින් තිබුණු ව්‍යවස්ථාවේ සුළු ජාතිකත්ව අයිතීන් වෙනුවෙන් 29 වැනි ව්‍යවස්ථාව කියලා වගන්තියක් තිබුණා. හැත්තෑදෙකේ ව්‍යවස්ථාවෙන් 29 වැනි වගන්තිය ඉවත් කළා. මේ නිසා සුළු ජාතිකත්වයන් විශාල වශයෙන් කම්පාවට පත් වුණා. මේකට විරුද්ධව උතුරේ කළු කොඩි දැම්මා. ඒක කරපු තරුණයෝ ඔක්කොම අත්අඩංගුවට අරගෙන බෝගම්බරට එව්වා. එතැන දෙමළ තරුණයෝ පනහක් හැටක් පමණ හිටියා. ඒ අය අතර උමා මහේශ්වරන් හිටියා. එතකොට අපි දැනගෙන හිටියෙ නෑ ඒ උමා කියලා. ඔහුට හොඳට සිංහල පුළුවන්. අපි ඔවුන් සමඟ පුළුල් විදියට කතා කළා. ඒකෙ සමහරු අන්ත ජාතිවාදී තැනක හිටියා. උමා ඇතුළු තරුණ කණ්ඩායමක්ම හිටියා අපි කියන අදහසට එකඟ වුණු. අපි කිව්වා, අපි ඔක්කොම එකතු වෙලා සමාජවාදය ගොඩනගන්න වැඩ කරමු කියලා. ධනේශ්වර පන්තිය සිංහල වුණත්, දෙමළ වුණත් ඔක්කොම එකයි. මම, උමා එක්ක පෞද්ගලිකවම කතා කළා. ඔහු කිව්වා, "සහෝදරයා, මම එකඟයි. අපි එළියට ගිහිල්ලා, සමාජවාදී ව්‍යාපාරයට පක්ෂ අය එකතු කරන වැඩපිළිවෙළක් උතුරේ හදමු" කියලා. එළියට ආවාට පස්සේ අපි දැනගන්නවා, කොටි සංවිධානය කියලා එකක් බිහි කරලා කියලා. ඒකේ සම නායකයෝ උමා සහ ප්‍රභාකරන් කියලා. ප්‍රභාකරන් උමාව මරනවා. මොකද? උමා තුළ සමාජවාදී අදහස් තිබුණා. ප්‍රභාකරන් ජාතිවාදියෙක්.

අපි හැත්තෑ අටේ එළියට එනකොට ජේ.ආර්. ලංකාව ජාතිවාදී මඩගොහොරුවක දාලා තිබුණේ. ඊට පස්සේ යාපනය පුස්තකාලය ගිනි තිබ්බා. අසූතුනේ කළු ජූලිය සිදු වුණා. ඒකට විරුද්ධව කුමක් හෝ කළ යුතුයි යන හැඟීම මත තමයි, ජාතිවාදයට එරෙහිව මේ චිත්‍ර අඳින්න යොමු වුණේ.

**අරගලයෙන් පසු ජීවිතයට මුහුණ දුන්නේ කොහොම ද? ඔබ තවමත් සටන්කාමියෙක්. ඔබ වෘත්තීය සමිති සංවිධානය කරනවා. ගිරාගම සෞන්දර්ය ආයතනය රැකගන්න මහන්සි වෙනවා. මේ සටන්කාමියා හැත්තෑඑකෙන් පෝෂණය වුණේ කොහොම ද?**

ඇත්තටම හැත්තෑ එකට සම්බන්ධ වුණු නිසා දේශපාලන සංවාද, සාකච්ඡා ආදියෙන් අධ්‍යාපනය

ලබපු නිසා අප තුළ පුළුල් ජීවගුණයක් ඇති වුණා. ඒ නිසා ඒ සටන්කාමීත්වය හා ජීවගුණය ජීවිතයට එකතු වුණා. මම අදත් - වයසට ගිහිල්ලා හිටියා වුණත් - ලොකුවට ක්‍රියාකාරී නැති වුණත්, වචනවලින්, චිත්‍රවලින්, ක්‍රියාමාර්ගවලින් ඒ සටන්කාමීයා මා තුළ ක්‍රියාත්මක වෙනවා.

ගිරාගම ගුරු විද්‍යාලය රැකගන්නත් කට්ටිය එකතු කරලා, සංවිධාන හදලා එකට සටන් කළා. ඒ ජීවගුණය හැත්තෑ එකෙන්. ඒකට මම ගරු කරන්නේ හැත්තෑ එකට සහ ජනතා විමුක්ති පෙරමුණට. මම ජනතාවාදී දේශපාලනයක් තමයි, කරන්නේ. මම ගිරාගම ගුරු විද්‍යාලය තුළ ගුරුවර ගුරුවරියන් දහස් ගණනකට ලෝක වමේ ව්‍යාපාරය, ලෝක කලා ව්‍යාපාරය ගැන ඉගැන්වූවා. ඔවුන්ගේ චින්තනය සකස් කළා. මම ඒක දිගටම කරනවා. ඒ සියලු දේම තුළ හැත්තෑ එකේ ජීවගුණය තියෙනවා.

**අරගලයෙන් අවුරුදු පනහකට පස්සෙත් ඔබ සමාජ, දේශපාලන, සංස්කෘතික කටයුතුවල නිරතව සිටිනවා. ඔබ අද හැත්තෑ එකේ අරගලය දකින්නේ කොහොම ද?**

හැත්තෑ එකේ අරගලය චින්තනමය වශයෙන්, ආකල්පමය වශයෙන් නිවැරදියි. නමුත්, අපි ළාබාල ව්‍යාපාරයක් විදියට හොඳ සමාජවාදී ව්‍යාපාරයක තිබිය යුතු මූලික ගුණාංග අත්පත් කරගෙන හිටියේ නෑ. අපි හොඳ සංවිධාන ව්‍යුහයක් හදාගෙන හිටියෙ නෑ. මම කාවවත් විවේචනය කරන්නේ නෑ. ලෝකයේ මේ වාගේ ව්‍යාපාරවලට එහෙම වෙලා තියෙනවා. විනාශ වෙලා, ආයෙත් නැගිටලා තියෙනවා. ආපසු නිවැරදි වෙලා තියෙනවා. මාක්ස් කොමියුනිස්ට් ප්‍රකාශනයේ පවා කියනවා, "සමහර ව්‍යාපාර නැත්තටම නැති වෙනවා. නමුත්, ජනතා ව්‍යාපාර එහෙම නොවෙයි, ඒවා නැවත නැවත ගොඩනැගෙනවා" කියලා. අපි කම්කරු පන්තිය සංවිධානය කළේ නෑ. අපි ජනතා අරගලයක් නොවෙයි කළේ. අපි ශිෂ්‍ය, තරුණ කොටස් එක්කයි අරගලය කළේ.

අපේ ප්‍රධාන ඉලක්කය විය යුත්තේ පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද ව්‍යාපාරය නොවෙයි. අපේ ප්‍රධාන ඉලක්කය විය යුත්තේ, බහුජන අරගලයයි. බහුජන අරගලය කියන්නේ, වැඩ කරන පන්තියත් සමඟයි අපි එකතු විය යුත්තේ. ඡන්දදායකයන් කෝටියක බලයකට වඩා වැඩ කරන පන්තියේ විසිදහසක බලය වැඩියි.

**නැවත 1968ට 1969ට යන්න ලැබුණොත්, මේ වතාවේ අරගලය සංවිධානය කරන්නේ කොහොම ද?**

ප්‍රථමයෙන්ම වැඩ කරන පන්තිය සංවිධානය කරන එක. වැඩ කරන පන්තිය සංවිධානය කරන එක අමාරු වැඩක්. මොකද? ධනපති පන්තිය විසිනුත් වැඩ කරන පන්තිය සංවිධානය කරනවා. වෘත්තීය සමිති තුළ. නමුත්, සටන් ව්‍යාපාර තුළ ඒවා ගිලිහෙනවා. සටන තුළ දී ධනපති පන්තියේ වෘත්තීය සමිති තුළ ඉන්න සටන්කාමීන් ඔක්කොම අපට ඇදිලා එනවා. සටන තුළ එක් වෙනවා.

අපි නිතරම පන්තිය ගැන හිතන්න ඕනෑ. පක්ෂයක් ලෙස සංවිධානය කිරීම, බහුජන සංවිධාන, බහුජන අරගල සංවිධානය කිරීම් කළ යුතුයි. ඕනෑම ඒකාධිපති පාලකයකු වුණත් වැඩ කරන පන්තිය වැඩ නතර කළොත්, වැටෙනවා. ඒ නිසා වැඩ කරන පන්තිය සංවිධානය කළ යුතු වෙනවා. ඒ වාගේම අපි අපේ අරගලය තවත් අපේ මේ සමාජ, සංස්කෘතික පදනමට හොඳින් ගැලැප්පීමට කටයුතු කළ යුතුයි.

වර්තමානයේ තිබෙන තවත් ප්‍රධානම අරගලයක් තමයි, මේ මිථ්‍යාවට හා ජාතිවාදයට එරෙහි අරගලය. ඒ වාගේම අපේ රටේ තවමත් වැඩවසම් චින්තනය

**වර්තමානයේ තිබෙන තවත් ප්‍රධානම අරගලයක් තමයි, මේ මිථ්‍යාවට හා ජාතිවාදයට එරෙහි අරගලය. ඒ වාගේම අපේ රටේ තවමත් වැඩවසම් චින්තනය බලවත්. වැඩවසම් ආයතන බලවත්. ඒ නිසා අපි වැඩවසම් චින්තනයට, මිථ්‍යාවට, ජාතිවාදයට එරෙහිව පුළුල් අරගලයක් කළ යුතුයි.**

බලවත්. වැඩවසම් ආයතන බලවත්. ඒ නිසා අපි වැඩවසම් චින්තනයට, මිථ්‍යාවට, ජාතිවාදයට එරෙහිව පුළුල් අරගලයක් කළ යුතුයි. තවමත් අපේ මේ වැඩවසම් චින්තනය තිබෙන බවට හොඳම උදාහරණය තමයි, අපේ මිනිස්සු තවමත් රජෙකුට කැමැති වීම. පාර්ලිමේන්තු ඡන්දෙන් නායකයෙක් පත් කරගෙන එයාට කියනවා, "ඔයා රජ වෙන්න" කියලා. ඊට පස්සේ බලන් ඉන්නවා එයාගේ පුත්තු රජ වෙනකම්. මියැදෙන ධනවාදය වෙනුවට ජාතිවාදය ගෙන එන නිසා. පන්ති සටන වෙනුවට ජාතිවාදී සටන ගෙනෙනවා. ඒ නිසා පුළුල් මට්ටමෙන් සුවිශාල තියුණු මතවාදී අරගලයක් හා අධ්‍යාපනික අරගලයක් කළ යුතුයි■





# අසන්නෙමි මෙසේ පැනයක්!



**ළඟදීම අප්‍රේල් කැරැල්ලේ**
**මහ නඩුවේ තීන්දුව**
**දෙන්නට යන බවට පුවතක්**
**ධනපති පුවත් පත්වල**
**පළවෙයි.**

ඇත කටුගෙයි හිස්කබලක්
ලබමින් නෙක ගරු බුහුමන්
අසන්නෙමි මෙසේ පැනයක්
එම්බා හිස් කබල
කැප්පෙටිපොළ මොනරවිල
කුමක් සඳහා මෙහි සිටින්නෙ ද?

"එරෙහිව අයුක්තියට
එරෙහිව වංචාවට
එරෙහිව පීඩනයට
අත්තනෝමතිකත්වයට එරෙහිව
ගසන්නට කැරැලි
අයිතිය මිනිසා සතු
කියාපාන්නට
උරුමය ලේවල
පෙන්වා දෙන්නට,
දායාදය පරම්පරාගත රකින්නට
සිටින්නෙමි මෙහි"

එක්දහස් අටසිය දහඅට
ඉතිහාසයට එක් කළ
මිනිසුනි දිවි පිදුව
අසනු මැන මෙපුවත

"නැත ඔබට අයිතිය
ගසන්නට කැරැලි
එරෙහිව රජයකට
දුෂ්ට වූ පාපිෂ්ට වූ
කුරිරු වූ දුර්දාන්ත වූ
දරා ගත යුතු ය ඔබ
සැම විට ම නිහඬව
මිනීමරු පාලනය
රජයන පවුල් බලය"

එයයි අද දින ගයන ගීතය
ධනයට අධිපති පාලක පංතිය

"බිහිරි විය යුතු ය ඔබ
වංචාව ඉදිරියේ
අන්ධ විය යුතු ය ඔබ

අයුක්තිය ඉදිරියේ
ගොළු විය යුතු ය ඔබ
මරණය ඉදිරියේ”

එයයි අද දින දෙසන ධර්මය
බලයට කෑදර පාලක පංතිය

"When the government
violates the rights
of the people
insurrection is for them
the most sacred of rights
the most imperative of duties"

රජය වැසියාගේ
අයිතීන් සිඳින විට
ජනයා සතු
අයිතිය පාරිශුද්ධ
වගකීම අනිවාරණීය
ගැසීමයි කැරැලි-
විප්ලවය ප්‍රංශ
උරුම කර දුන් ලෝ දනන් වෙත
මහඟු අයිතිය උදුර ගත්තේ
කා විසින් දෝ?

ඇදවැටුණු බැස්ටීලය,
බිඳී ගිය අදිරදේ,
නොබස්නා හිරු,
ඉතිහාසය මිනිස්,
ගොළු බසින් කියන්නේ
ජනයා සතු
කැරැලි ගැසීමේ
අයිතිය ගැන නොවේ දෝ?

පළවන චාල්ස්
දෙවැනි ජේම්ස්
දහසය වන ලුවී
සාර් නිකොලායි
ඉරණමට කැප කළේ
පාලිතයන් සතු
මේ අයිතිය නොවේ දෝ?
කොමියුනය පැරිස්
ඔක්තෝබරය රතු
විප්ලවය චීන
ඇන්ටිලිස් කොදෙව්වේ
දිවයින වීර
දායාදය ලොවට දුන්
කැරැලි ගැසීමේ අයිතිය නොවේ
දෝ?

ගරුතර මැතිඳුනි,
ධනයේ නියෝජිත !
අරා වැජඹෙන උස් අසුන්
‘කැකිල්ලේ සිංහාසනේ’
නොදන්නෙහි ද ඔබ
ඔබගේ මහැදුරු
ජෝන් ලොක්ගේ
මෙවැනි වූ කියමන්
"The only remedy
against unauthorised force
is to oppose it by force"
එකම පිළියම
එරෙහිව අනීතික බලයට
යෙදීමයි බලය

ඉතින් මැතිඳුනි,
ධනයේ නියෝජිත !
ධනයේ පාලනය
වැසියා මඬින විට
කුරිරු ලෙස දීන ලෙස
අනීතික බලයෙන්
නොමැති ද අයිතිය
පොදු ජනයා වෙත
දෙන්නට පිළිතුරු ?

ගරුතර මැතිඳුනි,
ධනයේ නියෝජිත !
නොදන්නෙහි ද ඔබ
ලියැවුණු අදහස්
කැරැලි ගසන්නට
පොදු ජනයා සතු
අයිතිය පිළිගෙන

‘වින්ඩීෂිය කොන්ත්‍රාතිරානෝස්’
‘ට්‍රෙටීස් ඔන් පොලිටික්ස්
‘ද රේග් එ රේගිසින්ස් ටිටියුෂනෙ’
‘සුම්ම තියලොගික’
‘දු කොන්ත්‍රැක් සෝෂියල්’
පුස්තකවල
ඔබේ ඇදුරන්ගේ ?
නො ඇසුවෙහි ද ඔබ
පළ කළ අදහස්
කැරැලි ගසන්නට
පොදු ජනයා සතු
අයිතිය හඬ නඟමින්
ලෝක්, බුකනන්
මහ කවි මිල්ටන්
දුගුයිට් දිද්රෝ
ජෝන් ඇල්තස්
පිලිප් මෙලැන්ක්තෝන්
වෝල්ටෙයාර්, රූසෝ
ඔබගේ ගුරුවරයන්

ධනයේ නාමයෙන්
ජනයාට එරෙහිව
දෙන විට තීන්දුව
දඟගෙයි දමන්නට
තරුණයන් වූ අපව
‘සාධාරණ මිනිසකුට
වඩා ගරු කරන්නට
චෞරයකුට වඩා
ඔටුනු පලන්’
සිහි නොවේ ඔබ හට
මේ වදන් කිසි විට
තෝමස් පේන්ගේ

ගරුතර මැතිඳුනි,
ධනයේ නියෝජිත !
එය කරුමයක් නොවේ.
එය අරුමයක් නොවේ.
ඔබේ සේවය කැප වුණේ
ධනයේ බලය වෙත බැවින්
ඔටුනු පලන් චෞරයනට හෙයින්

**රෝහණ විජේවීර**
(1974 දෙසැම්බර් 1 වැනි දින
නව මැගසින් බන්ධනාගාරයේ
‘පී’ මැදිරියේ දී ය.)



# අපරාජිත වීරත්වයක සාමූහික ධජය, 1971 අප්‍රේල් අරගලය

විශ්වය තම කාල අවකාශය පුරා ඉඩහසර සොයමින් පැතිර යද්දී මානව ඉතිහාසයද එහි නොමැකෙන සටහන් තබන්නට විය. මිනිසා තම චින්තන විප්ලවයේ නිම්වළලු පුළුල් කරද්දී මානව සමාජය යනු ජයග්‍රහණයන් සොයමින් ඉදිරියට ඇදෙන බාධක පරයන ගංඟාවක් වැනිය. අරගලය යනු එහි දී සමාජ සංවර්ධනයේ මාවත සකස් කරනු ලබන සජීවී සාමූහික මිනිස් උපකරණයයි.

මෙයට දශක පහකට පෙර එනම් 1971 අප්‍රේලයේ ශ්‍රී ලංකාව නම් වූ දිවයිනේ ධනය, බලය පිරි කුවේර ලොව සලිත කළ අරගලයක් පැන නැගිණි. මෙය 1971 අරගලය නම් වේ. විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් විවිධ මතවාදයන්ගෙන් නිරන්තර විනිශ්චයට භාජනය වන මෙම ඓතිහාසික මානව ප්‍රතිචාරය වැරදි විග්‍රහයන් තුළ මරාදැමීම එය මර්දනය කළ පංතියේ ඒකායන ප්‍රයත්නයයි. 1971 අප්‍රේලයේ සිට මේ දක්වා ලංකාව කේන්ද්‍ර වන දේශපාලන කතිකාවේදී 71 අප්‍රේල් නැගිටීමට පක්ෂව හා එරෙහිව තර්ක විතර්ක ගොඩනැගෙමින් තිබේ. එය විසින් මෙම අරගලයේදී ජීවිත පරිත්‍යාගයෙන් නැගී සිටි වීරත්වය මතවාදීමය ලෙසද මරා දැමීමට කෲර මෙහෙයුමක් පවතී. මානව ප්‍රගමනය උදෙසා වන සටනේ මෙම සුවිශේෂී අවස්ථාව නිහඬත්වය තුළ හෝ බොරුව තුළ හෝ වසන් කරදැමීමට ඉඩදිය යුතු නැත. ඒ මානව ඉතිහාසයේ තවත් එක් මානව විමුක්තිය අරමුණු කොටගත් සාමූහික මානව ක්‍රියාකාරිත්වයක නොපරදින වීරත්වයක පාඩම්ද එතුළ වළලා දැමිය හැකි බැවිනි.

ලෝක ඉතිහාසය ගොඩනැගෙන්නේම පීඩකයාගේ මර්දනයෙන් නොව පීඩිතයාගේ සටන්කාමිත්වයෙනි. එහි දී අවිඥානක වහල් නැගීසිටීම්වල සිට සවිඥානක නිර්ධන පංතික නැගිටීම් දක්වා වන අරගලයන් බොහෝ වේ. ඒ අතර 1971 අප්‍රේල් අරගලය සුවිශේෂී වන කාරණා කිහිපයකි. ඉන් එක් ප්‍රධාන කරුණක් මෙසේ ඉස්මතු වේ. රටක පීඩාවට පත් වන්නේ වැඩකරන මිනිසුන්ය. ඔවුන් බලයෙන් දුබල නම් පාලකයා ජයග්‍රාහකයා වේ.

මිනිසකු ලෙස මෙලොවට බිහිව වහල් සත්වයකු සේ මියයන අසමානතාවයේ ඉරණමට එරෙහිව 1965 දී ජනතා විමුක්ති පෙරමුණ නම් නිර්ධන පංති නියමුවා උපත ලැබීය. එය සෙමෙන් වර්ධනය වෙමින් සංවිධානය විය. සංවිධානය වීම යනු පීඩකයාගේ බලයට එරෙහිව වන අවියයි. පීඩිතයා සංවිධානය වීම යන්න පීඩකයාගේ බියට හේතුවේ. එම බිය විසින් පාලක පංතිය වියරු වැටුණි. සංවිධානය වන වැඩකරන පංතියේ ජනතා නියමුවා වන පක්ෂය කෙසේ හෝ විනාශ කරන්නෙමුයි තම පංතියට සපථ කළ ධනපති ආණ්ඩුව ජවිපෙ හඹා ගොස් මුලිනුපුටා දමන්නෙමුයි වහසි බස් දෙඩවීය. ජවිපෙ යන නම පවා නොමැතිව ළදරු දේශපාලන පක්ෂයක් සේ පංති සටනට පිවිසි ඔවුහු එම අසාධාරණ, කෲර මර්දනයට එරෙහිව පෙරළා නැගී සිටින්නට වූයේ එය තම පරම අයිතියක් කොට ගෙනය. මෙතෙක් ලාංකේය ඉතිහාසයේ හුදු පංතිමය නොවන දේශප්‍රේමී මුහුණුවරින් පමණක් අරගල පැන නැගි රටක තම පංතියේ විමුක්තිය උදෙසා නැගී සිටීමේ පරම පවිත්‍ර සමාජ අරමුණ වෙනුවෙන් ඔවුහු දිවි පරදුවට තබා නැගී සිටියහ. එය ලංකාවේ පංති සටන් ඉතිහාසයේ පළමු නිර්ධන පංතික අරගලය පමණක් නොව පීඩිතයා පෙරළා නැගී සිටි අරගලයයි. එතැන් පටන් පැන නැගෙන සියලු පංති සටන් අරගලයන්හි පළමු පරපුර එයයි. පළමු ආදර්ශය එයයි. එම අර්ථයෙන් ඔවුහු පීඩිත පංති අරගලයේ නොමැකෙන විරුවන්ය. දණින් වැටී ජීවත් වීම වෙනුවට දෙපයින් නැගී සිට නිවහල්ව මිය යන්නේ කෙසේදැයි ජීවිත ආදර්ශයෙන් ඔවුහු පෙන්වාලූහ. ධනපති මර්දනයේ කෲර හස්තය අභිමුව වීරත්වය කැටි කළ 1971 පංති අරමුණ තේරුම් ගැනීමෙන් මිස මෙය වටහා ගැනීම සාමාන්‍ය බුද්ධියට අසීරු කරුණකි. 1971 නැගිටීම යනු අන් කිසිවක් නොව ලාංකේය ධනපති මර්දනයට එරෙහිව ලාංකේය නිර්ධන පංති පක්ෂයේ අවිගත් නැගී සිටීමයි. සංවිධානය වූ නිර්ධන පංතිය යනු කෙබඳු බලවේගයක්දැයි අප්‍රේල් විරුවෝ පෙන්වා දුන්හ. අරගලයෙන් පසු ආණ්ඩුවේ බියගුලු හැසිරීම විසින් එය මනාව සනාථ විය. අපකීර්තිමත්, අසාධාරණ අපරාධ යුක්ති විනිශ්චය සභා පනත භාවිතා කොට සකස් කළ අප්‍රේල් මහ නඩුවේ ධනපති නීතිය හා සාධාරණත්වය රෝහණ විජේවීර සහෝදරයා ප්‍රශ්න කරනු ලැබුවේ මේ සත්‍යය හෙළිදරව් කිරීමේ අරමුණෙනි. ඒ යුක්තිය ඉල්ලා ඔවුන් විසින් නගන ලද හඬ ප්‍රබල බැවින්ය. අනෙක ජීවිත පරිත්‍යාගයේ මාවත තෝරාගත් ඔවුන් එසේ තෝරාගනු ලැබූයේ උමතුවකින් නොව, නිර්ධන පංතික වීරත්වය නිසාවෙනි.

"සූරාකන පාලක පංතිය විසින් වහල්භාවයද? නැත්නම් ජීවිත පරිත්‍යාගයද? යන දෙකින් එකක් තෝරා ගැනීම පමණක් නිර්ධන පංතිය වෙතට උරුම කළ විට ඒ අනුව නිර්ධන පංතිය ජීවිත පරිත්‍යාග කිරීමේ මාවතට, සන්නද්ධ අරගලයේ මාවතට පිවිසෙති. එම මාවත සූරාකන පාලක පංතීන් විසින් නිර්ධන පංතිය වෙතට පටවනවා විනා නිර්ධන පංතිය විසින් ස්වේඡාවෙන් තෝරා ගනු ලබනවා නොවේ."

(රෝහණ විජේවීර 'අප මරා දැමුවද අප නගන හඬ සදා නොමියනු ඇත.' කෘතියේ 67 පිටුව)

1971 අප්‍රේල් නැගිටීමේ වීරත්වය පිළිබඳව කතා කරන විට එහි රැඳි මානව දයාව යන්න කිසි විටෙක අමතක කළ නොහැකිය. මානවහිතවාදීන් බිහිවන්නේ පොදු මානව දයාව පදනම්වය. එනිසාම පංති සමාජයක සූරාකන්නන් යනු මානව සංහතියේ අපරාධකරුවන්ය. ඔවුහු මිනිස් ස්වරූපයෙන් ඉපිද තම සහෝදර මානව ප්‍රජාව අසරණ කොට ඔවුන්ව සූරාකමින් කුවේර ජීවිත ගත කරති. නිර්ව්‍යාජ හා පලදායි මානව හිතවාදය වන්නේ මෙම යුගයේ අධිරාජ්‍යවාදී ප්‍රාග්ධන දඬුඅඬුවෙන් මිරිකී තම මිනිස්කමෙහි පදනම වන ශ්‍රමය සූරාකෑමට

ගොදුරුව සිටින පීඩිත පංතීන් ඉන් මුදවාලන ජීවිත කැප කිරීමෙන් කරනු ලබන අරගලයයි. එබැවින් සාධාරණ සමාජයක්, යුක්තිගරුක දේශයක්, නිවහල් මිනිසෙක් වෙනුවෙන් 71 සටන් සගයින් අරගල කළේ පංති පීඩනයෙන් යටපත් කළ මිනිස්කම ඔසවා තබන්නටය. මිනිස් ජීවිතයේ පරම අභිලාෂය වන සාමූහික සතුට කරා ළඟා කරවීම උදෙසාය. එම මානව දයාවේ පිරිපුන් ඒකායන අරමුණෙහි ගමන් ගන්නා විප්ලවවාදීනට ඒ වෙනුවෙන් මානසික හෝ ප්‍රතිලාභ අවශ්‍ය නැත. ඒ වෙනුවට ඔහු තුළ උපදින්නේ පරිත්‍යාගයයි.

මානව වර්ගයාගේ අනාගත ජයග්‍රහණය උදෙසා, මානව වර්ගයාගේ සාමූහික අරගලයන්ගේ හැකියාව කෙරෙහි විශ්වාසය තබමින්, එම අරගලය උදෙසා දිවි පරදුවට තබා සටන් කළ යුතු අවස්ථාවේ දිවි පරදුවට තබා ඔවුහු සටනට වන්හ. අත්අඩංගුවේදී විඳි අපමණ වධ බන්ධන හමුවේ ඔවුහු විප්ලවවාදී සදාචාරය දියකර ගත්තේ නැත. සතුරා අභිමුව වැඳ වැටෙමින්, ආයාචනා කරමින් ජීවිතය ඉල්ලා ගනු ලැබුවේ නැත. මරණය අභියස වෙඩි උණ්ඩයක පහස ලයට සමීපවෙමින් පැවති අවසන් නිමේශයේ දී පවා ඔවුහු නිර්ධන පංතික සටන් අභිමානයෙන් සතුරා වික්ෂිප්ත කරමින් සියල්ල දරා ගත්තෝය; ඔව්, මිනිස් සිරුරකට දරාගත නොහැකි තරම් අපමණ වේදනාවන් දරාගත්තෝය. නිහඬ බවම ආරක්ෂාවද අවියද කොටගත් ඔවුහු සතුරු වෙඩි උණ්ඩය හමුවේ අපරාජිතව "ජනතා විමුක්ති පෙරමුණට ජයවේවා" යැයි පවසමින් දිවි පිදූහ. එම වීරත්වය අන් කිසිදු මානව බලයකට දෙවැනි වන්නේ නැත. මේ සම්බන්ධ උදාහරණ කිහිපයක් ජවිපෙ බිහිකිරීමේ නියමුවා වන රෝහණ විජේවීර සහෝදරයාගේ 'අප මරා දැමුවද අප නගන හඬ සදා නොමියනු ඇත' නමින් වන (1971 අප්‍රේල් මහනඩුවේ ලිඛිත සාක්ෂිය) කෘතියෙන් ගෙන ඔබ හමුවේ තැබීම වැදගත් වනු ඇතැයි අප විශ්වාස කරමු.

"මිනිස් ස්නායු පද්ධතියේ ධාරිතාවන් සීමිතය. ආසන්න මරණයේ හෝ අනාගතය සඳහා ඇති බලාපොරොත්තු සහමුලින්ම සුන්වීම, අත්හැරීම එකම ප්‍රතිඵලයකින් යුත් කාලවර්ණ බලාපොරොත්තු රහිත බවේ, නින්දාවේ සහ අපකීර්තියේ මහා පාතාලයක් තුළ ධනේශ්වර පංතිය තම ගොදුරු කොටුකර ගනී. බොහෝ විප්ලවවාදී සගයින් මෙම අඳුරු තත්වයන් යටතේ මරණය කිසිම පැකිලීමකින් තොරව තෝරාගන්නා ලදී. ඒ ඔවුන් ඉදිරියේ සදාචාරත්මක වැහැරීම හෝ මරණය යන එක පිටම වැටී ඇති මාවත් දෙකෙන් එකක් තෝරා ගැනීමට ඔවුන්ට ඉඩදෙනු ලැබූ විටයි. එසේ සදාචාරාත්මක වැහැරීම ප්‍රතික්ෂේප කරමින් මරු වැළඳ ගැනීමට කැමති වූ ඉතාමත් භක්තියෙන් මරු වැළඳගත් ගණන සුළු පටු නොවන බව මතක තබාගත යුතුය."

ඉහත සඳහන් කළ 'අප මරා දැමුවද අප නගන හඬ සදා නොමියෙනු ඇත' යන කෘතියෙහි සටහන් කොට තිබෙන සහ ජවිපෙ 1971 ඉතිහාසය පෙන්වාදෙන එවන් ජීවිත පරිත්‍යාගයන්හි ප්‍රමුඛ සංකේතාත්මක නාමයන් බොහෝය. ඒ අතර කිරින්ද ගොවිපළේ සිටම රෝහණ විජේවීර සොයුරා සමඟ ළඟින්ම ඇසුරු කළ දොඩංගොඩ කමලබන්දු (බද්දේගම



මානව වර්ගයාගේ අනාගත ජයග්‍රහණය උදෙසා, මානව වර්ගයාගේ සාමූහික අරගලයන්ගේ හැකියාව කෙරෙහි විශ්වාසය තබමින්, එම අරගලය උදෙසා දිවි පරදුවට තබා සටන් කළ යුතු අවස්ථාවේ දිවි පරදුවට තබා ඔවුහු සටනට වන්හ. අත්අඩංගුවේදී විඳි අපමණ වධ බන්ධන හමුවේ ඔවුහු විප්ලවවාදී සදාචාරය දියකර ගත්තේ නැත.

කමලබන්දු නමින් ප්‍රසිද්ධ විය) සහෝදරයාගේ ආදර්ශය පෙන්විය හැකිය.

බද්දේගම පොලිසිය විසින් ඔහු අත්අඩංගුවට ගෙන දැව ඉරන විදුලි කියතකින් ටිකෙන් ටික ශරීරයේ අංගයන් ඉරා දමමින් තිරිසන් ලෙස වද බන්ධනයට ලක්කොට තම සගයින් පිළිබඳව තොරතුරු සහ පාපෝච්චාරණයක් ඉල්ලා බලකරද්දී ශරීරය පෙළන වේදනාවන් පරයා පොලිසියට අවනත නොවී නිහඬ



මරණය තෝරාගන්නා ලද්දේ වීරත්වය යනු කෙතරම් ප්‍රබල බලයක්ද යන්න පෙන්වමිනි. උණගස්වල අනුර සහෝදරයා වැල්ලවාය පොලිසිය විසින් දෙන ලද වධ වේදනාවන් හමුවේ විප්ලවවාදී සදාචාරයේ ශක්තිය රකිමින් අරගලයද තම සටන් සගයින්ද පාවාදීම ප්‍රතික්ෂේප කර එක එල්ලේම මරණය තෝරාගත් බව සත්‍යයකි. අනුරාධපුර, නොච්චියාගම රත්නායක සහෝදරයා වෙඩි තබා දුබලව සහ වද වේදනාවන්ගෙන් හෙම්බත්ව පොලිස් ජීප් රියෙහි බොනට්ටුව මත බාවා සිටියදී ජනතා විමුක්ති පෙරමුණේ ගීතය දුබල හඬින් ගයමින් මරණය තෝරාගත්තේ භක්තිමත් විප්ලවවාදියකුගේ හෘදය සාක්ෂියේ ප්‍රබලත්වය මෙසේ යැයි පෙන්වමිනි.

තෙල්දෙනියේ සිසිර වීරකෝන් සහෝදරයා පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන වදදීම් අවසන පාපොච්චාරණයකට පොළඹවා ගත නොහැකිව මහනුවර, නත්තරම්පොත පාලම මතදී ගං දිය මතට වැටෙන්නට වෙඩි තබන විට "ජනතා විමුක්ති පෙරමුණට ජයවේවා" යැයි පැවසුවේ මිනීමරුවන්ට මරණයේ ජයග්‍රහණයද ඉතිරි නොකරමිනි. පාපෝච්චාරණය ප්‍රතික්ෂේප කොට මරණය තෝරාගනිද්දී වැලිගම ගමගේ සහෝදරයාගේ අතින්ම එම පොලිසිය පසුපස හාරන ලද මිනී වළක මරා වළලන ලදී. එපමණක් නොව දික්වැල්ලේ පොල්ගහමුල්ලේ සුරවීර සහෝදරයා ඔහුගේ ඇට කටු කුඩුකර තිබියදීත් කිසිවක් සතුරාට නොකියාම මරණය තෝරාගත්තේ ජීවිතයට වඩා විප්ලවවාදී සදාචාරය ප්‍රබල වන බැවිනි. තංගල්ලේ ගොඩවානේගොඩ සනී ආරියතිලක සහෝදරයා බලංගොඩ පොලිසියේ මිනීමරුවන් හමුවේ සදාචාරාත්මක වැහැරීම ප්‍රතික්ෂේප කර වචනයක්වත් කතා නොකර සියලු වධ වේදනාවලට පසුව ඇල්ලේපොළගේ පාඨයක් කියමින් වෙඩි කෑ බව 1971 වීරත්ව ඉතිහාසයේ නොමැකෙන ලෙස සටහන්ව ඇත.

කතරගම ප්‍රේමවතී මනම්පේරි සහෝදරිය දූෂණය කොට වධ දී නිරුවත්ව නගරය පුරා ඇවිද්දවමින් නොමරා මරමින් පණපිටින් වළලා දැමීම විසින් පෙන්වා දෙන්නේ ධනපති මර්දනය කෙතරම් කුරිරුද, බියජනකද යන්නය. 1971 අරගලයෙන් පසුව පසුබසිමින් සිටි විල්පත්තු කණ්ඩායම සමග සිටි චූටි නංගි නමින් හැඳින් වූ ලාබාල සොයුරිය (ඇය වැඩිවියට පත්වූයේද විල්පත්තු කැලයේදීය) වෙඩි වැදී මිය යමින් සිටියෙදී හමුදාවට පවසා සිටියේ "අපේ මාමලා මරා දමන්න එපා" යන්නය. එම සිදුවීම සැබැවින්ම 1871 පැරිස් කොමියුනය නම් ප්‍රථම නිර්ධන පංතික රාජ්‍ය රැකගැනීම වස් ධනපති මර්දකයාට එරෙහිව අවිගත් කොමියුනයේ දරුවන්ගේ වීරත්වය සිහිගන්වයි. මක් නිසාද යත් ධනපති ගහලයන්ගේ අවි එල්ල වුණේ ගැහැනුන් හා ළමුන් යන්න සලකා බලමින් නොවේ. මානව ප්‍රේමය පිරි හදවත් මානව සමාජය සාධාරණ යුක්තිගරුක සමාජයක් කරනුවස් වූ තම මෙහෙවර මර්දනය කරමින් ඔවුනගේ උත්තුංග අරමුණ දියකර හරින්නට පැවැති කුරිරු පාලනය, පොලිස් වධකාගාර සහ ගිනියම් උණ්ඩ භාවිත කළද වත්මනෙහි පවා ජව්පෙ තුළ මොනයම්ම හෝ අභියෝගයන් හමුවේ දිවිහිමියෙන් සටන් වදින ශක්තිය ගැබ්ව පවතින්නේ 1971 විප්ලවවාදී සගයන් මානව ඉතිහාසයට එක්කළ එම මහා වීරත්වයේ සදාචාරයේ ආදර්ශය නිසාවෙන්ය. ඒ අපගේ අරගලයේ වීරත්වයේ මුල් පාඩමය.

"ඒ අයුරින් දසදහස් ගණන් විප්ලවවාදී සහෝදරවරුන් අත්අඩංගුවට ගෙන සදාචාරාත්මක

වැහැරීමද මරණයද යන මාවත් දෙක හමුවට පමුණුවනු ලැබූ විට සදාචාරාත්මක වැහැරීමේ මාවත ප්‍රතික්ෂේප කර මරණය කිසිම කෙඳිරීමකින් තොරව පිළිගත් අයුරු ඔබ දන්නවා නම් හේවිසි, හොරණෑ වාදකයින්ගෙන් තොරව, පාංශුකූල පාවඩයන්ගෙන් තොරව, ටයර් එකයි, තෙල් ගැලුමයි දරසෑයේ ආදාහනය වූ ඒ විප්ලවවාදීන්ගේ අවමඟුල් ගීය ගැයීමට නුපුළුවන් වූ අපි" යනුවෙන් විජේවීර සහෝදරයා අපරාධ යුක්ති විනිශ්චය සභා කොමිසම නම් අපකීර්තිමත් කොමිසම හමුවේ තම ලිඛිත සාක්ෂියෙහි සඳහන් කරන්නේ මෙම පංති සගයන්ගේ දිවිපිදීම ජීවිතය අහම්බෙන් රැකුණු සගයන්ට ශක්තියක්, ධෛර්යයක් වූ බව නොවේද?

අරගලයක වීරත්වය පවතින්නේ දිවිපිදූවන් තුළ පමණක් නොව යම් අහුඹුවකින් දිවි රැකුනවුන් තුළද වීරත්වය පවතී. අනපේක්ෂිත ධවල භීෂණයකින් පසු සීසී කඩව අත්පා කඩා බිඳ දමා දුර්වල කළ

**එදා තමන් විසින්ම සකස් කොටගත් සරල අවි දරමින් සතුරාගේ ප්‍රබල ගිනි අවි පරදන ආත්ම විශ්වාසයකින් ඔවුන් සටන් වැදුනේ ලංකාවේ අනාගත කොමියුනිස්ට් පක්ෂය, විජේවීර සොයුරා පැවසූ පරිදිම අනාගත කොමියුනිස්ට් පක්ෂය උදෙසා විප්ලවවාදීන් බිහිකරන පක්ෂ පාසල වන ජවිපෙ මතු පරපුර වෙනුවෙන් භෞතිකව රැකදීමකට වඩා අධ්‍යාත්මිකව රැකදීම උදෙසාය.**

ළදරු ව්‍යාපාරයක ඉතිරි වූවන් සියල්ල ශක්තිමත්ව එළැඹි තත්ත්වයට මුහුණදීම හෝ නොදීම තීරණය වන්නේ ඔහු සමාජ විප්ලවය කෙරෙහි වන භක්තිමත් බවත්, එය යළි ජයග්‍රාහි මාවතේ ගෙන යන ශක්තිය ඔහු තුළ තිබේද නැද්ද යන්න මත පමණි. එනිසාම ආත්මාර්ථය තමන් සැඟවෙන පිටකටුව බවට පත්කොටගත් බියසුල්ලන්ද, පංති සතුරා තුරුලට වැද තම පංතිය තම සතුරා බවට පත්කොටගත් පංති ද්‍රෝහින්ද සියල්ල අවසන පක්ෂයට ගෙන ආවේ සතුරුකම්ය. වසර පනහක් ගෙවී අවසන් අරගලයක ආපසු හැරී බැලීමේදී මෙම පලාගියවුන් ඉතිහාසය විසින් එහි අඳුරු මුළුවල සඟවාලූ බව පැහැදිලිය.

ජවිපෙ නම් වත්මන් නිර්ධන පංතික උස් ධජය තවමත් ලාංකේය අහස් තලය පමණක් නොව ජාත්‍යන්තර ගුවන සිසාරා ලෙලදෙන්නේ පරාජය කළ සටන යළි දිනා දිය යුතු යැයි විශ්වාසයෙන් තම මරා දමන ලද සටන් සගයන් අතින් ගත් රතු ධජය යළි අතට ගත් වුන් නිසාවෙන්ය. වනාන්තර තුළ පසුබසිමින් සිටි සහ සිරගෙවල සිරගතව අපා දුක් විඳි මෙන්ම තනිව සැඟව සිටි බොහෝ දෙනෙකු අතර ව්‍යාකූල වූවන්, බිඳ වැටුනවුන් මෙන්ම සතුරන් අතර මුළා වූ හෝ ළදරු පක්ෂයට වෛරයෙන් කටයුතු කළ පිරිස් දක්නට හැකි විය. ධනපති හා වමේ අවස්ථාවාදී පාලකයන් විසින් විවිධ මොළ සේදීමේ උපායන්ගේ සිට වරප්‍රසාද දීම් දක්වා මෙම දුබලයන් බිලීබාගන්නා බිලී කොකු මානන්නට විය.

ඒ සියල්ල මැද පංතියට නිවැරදි වමක් අවශ්‍ය බව තේරුම් ගනිමින් යළි බිඳ වැටුණු පක්ෂය ගොඩනැගීම අරමුණු කොට රෝහණ විජේවීර සහෝදරයා හා



එක්ව කටයුතු කළ සොයුරන් විරුවන් වන්නේ ඒ වන විටත් සතුරාගේ සුරතලුන් වූ පිරිසක් පක්ෂයේ නිර්මාතෘවරයා සිරගෙය තුළදීම ඝාතනය කිරීමේ කුමන්ත්‍රණවල සිට මඩ අවලාද වැපිරීමේ කුමන්ත්‍රණයන්ගේ නියැලී සිටියෙදී වන බැවිනි. 1975 මාර්තු 18 පැරිස් කොමියුනයේ 104 සමරු දිනයේ සිරගෙය තුළ තාවකාලික මධ්‍යම කාරක සභාවක් පත්කරගනිමින්, ඔවුහු ව්‍යවස්ථානුකූල පක්ෂයක අඩිතාලම කටුසටහනක් ලෙස සකස්කොට ගත්තෝය. සිරගෙවල තුළ ලේ දන්දීමෙන් ලැබූ මුදල් හා කඳවුරු තුළ තම කෑම වේල වෙනුවට එකතු කොට ගත් මුදල් පිටතට එවා පක්ෂයේ මධ්‍යම පුවත්පත 'නියමුවා' ආරම්භ කළේද ඇද වැටුණු පක්ෂය ගොඩනැගීමේ

ඔවුන් තුළ වූ ධෛර්යය හා වීරත්වය නිසාය. සැබවින්ම ඔවුන් විසින් ආරම්භ කරන එම කටයුත්ත සාර්ථක කොට ගනිමින් යළි පක්ෂය ගොඩනැගිණි. එය අද පවතින සුවිසල් වෘක්ෂය දක්වා වැඩෙන්නේ ඉන් පසුවය. එය කෙතරම් ශක්තිමත් අඩිතාලමක්ද යනු දෙවන වර සතුරා විසින් නායකත්වය පවා මරා සියල්ල අවසන් යැයි උදම් ඇනූ විට ඉතිරි වූ තැනින් යළි පක්ෂය ඔසවන්නට සමත් පිරිසක් බිහිකර තිබීම විසින් සනාථ කෙරුණි. එසේ නොවන්නට 1971 අවධියේ එම ළදරු ව්‍යාපාරය මෙතරම් දැවැන්ත වෘක්ෂයක් සේ පසුව වැඩෙන්නේ කෙසේද?

1971 වීරත්වය පිළිබඳ බොහෝ කරුණු අතරින් තව එක් සුවිශේෂී කරුණක් ගෙනහැර දැක්වීම වැදගත්



යැයි විශ්වාස කරමු. රෝහණ විජේවීර සහෝදරයා විසින් මහනුවර හමුවේ පුන පුනා පැවසුයේ මෙම අරගලය පැන නගින්නේ විප්ලවීය තත්ත්වයක් සහිත පසුබිමක නොවන බවය. බලය ඇල්ලීමේ අරමුණක් මෙහි නොවන බව ඉන් ගම්‍ය වේ. පක්ෂය බිහිකරන්නේ අනාගත විප්ලවීය තත්ත්වයක පෙළගැසීමකට නායකත්වය දෙමින් පක්ෂය සමාජවාදී සමාජ විප්ලවයේ නියමු කාර්ය භාරය පවරාගන්නට බව සැබෑය. එහෙත් උපන්ගෙයිම ධවල භීෂණයකින් මුලිනුපුටා දමන්නට වෙර දැරූ නිර්ධන පංතික ව්‍යාපාරය අවිගෙන තම අයිතිය වෙනුවෙන් නැගී සිටියේ තම සාධාරණත්වය ඉල්ලීමට පමණක් නොවේ. එදා එම පරපුර උරමත පැටවී තිබූ භාරධූර වගකීමක්ද විය. ලෝක සමාජවාදී සමාජ විප්ලවයේ ශ්‍රී ලංකාවේ කොටස ඉටුකිරීමටත් ඉන් ඔබ්බට ලෝක විප්ලවයේ කාර්යභාරයට උරදීමටත් ලාංකේය නිර්ධන පංති ළදරුවා නිරුපද්‍රිතව අනාගත පරපුර වෙනුවෙන් රැක දිය යුතු විය. එහි අයිතිය මෙන්ම අභිමානයත්, ගරුත්වයත්, පැවැත්මත් විප්ලවවාදී ජීව ගුණයේ අරුතින් රැක දිය යුතු විය.

එදා තමන් විසින්ම සකස් කොටගත් සරල අවි දරමින් සතුරාගේ ප්‍රබල ගිනි අවි පරදන ආත්ම විශ්වාසයකින් ඔවුන් සටන් වැදුණේ ලංකාවේ අනාගත කොමියුනිස්ට් පක්ෂය, විජේවීර සොයුරා පැවසූ පරිදිම අනාගත කොමියුනිස්ට් පක්ෂය උදෙසා විප්ලවවාදීන් බිහිකරන පක්ෂ පාසල වන ජවිපෙ මතු පරපුර වෙනුවෙන් භෞතිකව රැකදීමකට වඩා ආධ්‍යාත්මිකව රැකදීම උදෙසාය. සැබැවින්ම අදද ජවිපෙ යනු භෞතික ශරීරවල එකතුවකට වඩා එය විප්ලවවාදී ලෙස සදාචාරාත්මක හා සංස්කෘතිකමය බලයකි. එබැවින් ජවිපෙ විනාශය ප්‍රාර්ථනා කළවුන් හා ඒ සඳහා වෙහෙසුනවුන් පරාජය වූවා මිස ජවිපෙ විනාශ වූයේ නැත. එබැවින් මතු පරපුරකට විප්ලවවාදී අධ්‍යාත්මය හා එම සංස්කෘතික ජාන රැක දෙමින් නැගී සිටි 1971 ඒ අරුතින්ද වීරත්වයම මිස අන් යමක් නොවේ. හේතුව තමන්ට අත්පත් නොවන, තමන් භුක්ති නොවිඳින යහපත් ලෝකයක් උදෙසා වන පක්ෂය රැකදීම වෙනුවෙන් ඔවුන් කිසිදු මිලක් හෝ දීමනාවක් නොඉල්ලා දිවිපරදුවට තබා සටන් කළ බැවිනි. ඒ ඔවුන් වචනයේ පරිසමාප්ත අරුතින්ම කොමියුනිස්ට් ලෝකයක් විශ්වාස කළ, එය ප්‍රාර්ථනාව කර, එම සිහිනය සැබෑවන සත්‍යය මත පය ගසා කටයුතු කළ අව්‍යාජ එමෙන්ම භක්තිමත් හා ශක්තිමත් විප්ලවවාදීන් බැවිනි.

මෙසේ කැටිකොට දැක්වුවද 1971 අරගලයේ වීරත්වය යනු පුළුල් පාඩම් පොතකි. මිනිසුන්ට තම පරම පවිත්‍ර මානවීය අරමුණ වෙනුවෙන් දිවි පිදීමේ හැකියාව පිළිබඳව, 'වානේ පන්නරය ලැබූ හැටි' පොත ලියූ ඔස්ත්‍රොව්ස්කි පැවසූ පරිදි මිනිසෙකුට එක්වරක් පමණක් ලැබෙන තම අති උතුම් වස්තුව වන ජීවිතය මානව ජයග්‍රහණය උදෙසා පරිත්‍යාග කරන්නට දෙවරක් නොසිතා නොපැකිල හැකි නම් ඒ කොමියුනිස්ට්වාදී වීරත්වය මිස අන් කුමක්ද? 1971 අප්‍රේල් අරගලය විසින් මතු පරම්පරාවන්ට ඉතිරිකොට තබා ගිය නොමැකෙන සේ සටහන්කොට ගිය වීරත්වයේ ආදර්ශය හා ශක්තිය එයයි. සතුරා කෙතරම් සුළුකොට පෙන්වන්නට උත්සාහ කළද සඟවාලිය නොහැකි ලෙසටම සජීවී ජනතා විමුක්ති පෙරමුණ නම් නිර්ධන පංතියේ නියමුවා තම ඉතිහාසයෙන් යළි යළිත් පෙන්වන සත්‍යය මෙයයි.■



මට දැන් වයස අවුරුදු 70ක් වෙනවා. '71 අප්‍රේල් අරගලයට අවුරුදු 50යි. මම පක්ෂයට සම්බන්ධ වුණේ අවුරුදු 19දී. ගෙවිලා ගිය අවුරුදු 50 දිහා දැන් වඩාත් හොඳින් ගැඹුරින් බලන්න පුළුවන්. හැමදේම දිහා බැලුවාම එක දෙයක් පැහැදිලිව කියන්න ඕනෑ. ඒ ධනපති ක්‍රමය අපිට ජීවිත අහිමි කරලා තියෙන බව. අපේ දරුවන්ට ඒ අයගේ කියලා ජීවිතයක් නෑ. ඒ නිසා දෙමාපියන් ගැන හොයන්න ඒ අයට කොහොමත් කාලයක් නැහැ. දරුවන් බලන්නවත් වෙලාවක් නැහැ. මුණුපුරන්ගෙ මිනිපිරියන්ගෙ දරු සුරතල් බලන එක සුන්දර වුණත්, දරුවන්ගෙ අනික් වැඩත් කරන්න වෙලා වැඩිහිටියන්ගෙ නිදහස සම්පූර්ණයෙන්ම නැති වෙන එක සාධාරණ ද? වැඩිහිටියන්ට මහලු කාලයේ නිස්කලංකව පොතක් පතක් කියවාගෙන නිදහස භුක්ති විඳින්න තියෙන්න ඕනෑ. ඒ අතරේ දරුවන්ට දෙමවුපියන් බරක් වෙලා තියෙනවා. එක දෙමවුපියන්ට දරන්න අමාරුම වේදනාවක්.

# කාන්තාවන් එදාට වඩා අද පෙරට එන්න ඕනෑ

යූ.ඒ. නන්දසීලී සහෝදරිය

මෙන්න මේ වටාපිටාවේ ඉඳන් තමයි, අද තියෙන සමාජ, ආර්ථික, දේශපාලන අත්දැකීම් එක්ක එදා ගැන බලන්නේ. අද තියෙන පරිසර හානි, වන සංහාර එක්ක තමයි, එදා අපේ අරමුණු ගැන බලන්නේ. අද අපි පැහැදිලිව අත්දකිමින් සිටින ජීවිත අහිමිවීම්වල දිග, පළල අනුව තමයි, එදා අපේ ජීවිත වඩා යහපත් සමාජයක් තුළ ගොඩනඟා ගැනීම ගැන අපිට තිබුණු අරමුණු ගැන බැලිය යුතු වන්නේ.

සමාජවාදී සමාජයක් ගැන කාන්තාවන් හැටියට අපේ ලොකු බලාපොරොත්තුවක් තිබුණා. ඒ වෙනුවෙන් ස්වේච්ඡාවෙන් කියන්න බැරි තරම් කැප වීමක් කළා. ගෙදරට සීමාවෙලා තිබුණු අපේ ජීවිත ඒ ශක්තිමත් කියන්න පුළුවන් සීමාවන් බිඳගෙන ඉස්සරහට ආවේ කොහොමද? අපේ සහෝදරවරු එක්ක හරිහරියට වැඩ කරන්න ශක්තිය ආවේ කොහොමද? සන්නද්ධ ව්‍යාපාරයක සහෝදරවරු එක්ක පහර දෙන්න ශක්තිය

**හිරගෙදර හිටි කාන්තාවන්ගේ ජීවිත අපි තේරුම් ගත්තා. කොයි තරම් වේදනාකාරී ඛේදවාචකවල ද ගිලිලා තියෙන්නේ කියලා දැක්කා. අත්අඩංගුවේ වධවේදනා ටික කාලයයි. ධනවාදී සමාජ ක්‍රමයක වධවේදනා මුළු ජීවිත කාලයටම. හැබැයි ඒ බව බහුතරයක් තේරුම් ගන්නේ නෑ. ජීවිතයම විඳින වධවේදනා, කරුමෙ, ලබා උපන් හැටි, වගේ දේවල් කියලා භාරගෙන ඉන්නේ.**

ආවේ කොහොම ද? මෙහෙම දෙයක් ඉතිහාසයේ අහල තිබුණේ නෑ; අත්දැකීමක් තිබුණේ නෑ. ගෙදරින් පිටවෙලා කැලෑවැදිලා අතිදුෂ්කර ජීවිත ගෙවමින් ක්‍රියා කරන්න ශක්තිය, ධෛර්යය ආවා නේ. ඒ තමයි, වඩාත් යහපත්, පොදු හැඟීම්වලින්, අරමුණුවලින් වැඩ කරන සාධාරණ, යුක්තිසහගත ජීවිතයක් ගැන තිබුණු අපේක්ෂාව.

මේ අපේක්ෂාව වෙනුවෙන් ජීවිතය පරදුවට තියලා එදා කාන්තාවන් සටන් කළා. අපේ සහෝදරවරුන්ට දෙවැනි වුණේ නෑ. මම හොඳම උදාහරණයක් කියන්නම්. මට පැවරිලා තිබුණේ රොස්මීඩ් පහර දීමට එකතු වෙන්න. රොස්මීඩ් කියන්නේ එදා හිටි අගමැතිවරියගේ ගෙදර. අමරසිංහ සහෝදරයා එක්ක අපිට එකතු වෙලා මේ පහර දීම කරන්න තිබුණේ. ඉතිං එතකොට වැඩේ බරපතළකම ගැන අපි නොදැන හිටියා නොවෙයි. හැබැයි එකා වගේ කවුරුත් මේක භාර ගත්තා. ඒ භාර ගත්තේ ස්වේච්ඡාවෙන්. අපි අපේ පෞද්ගලික අරමුණු තියාගෙන විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්තේ. ඒ පෞද්ගලික අරමුණු පැත්තකින් තියන්න තරම්, අවබෝධයක් වගේම ධෛර්යයක් එදා අපිට තිබුණා. අපමණ වධවේදනා විඳලා, මරණය හමුවේ පවා නොසැලී ජීවිතේ දීපු ප්‍රේමවතී මනම්පේරි වගේ තවත් නම් දන්න වගේම නොදන්නා සහෝදරියන් ගොඩක් හිටියා.

හැබැයි අදත් එක්ක බලන කොට විශේෂත්වයකුත් එදා කාන්තාවන්ගේ පැත්තෙන් තිබුණා. අද තරම් මිථ්‍යාවට වහවැටිලා හිටියේ නෑ. අද හොඳටම උගත් කාන්තාවන් පවා මිථ්‍යාවේ කොච්චර ගිලිලා ඉන්නවා ද? එදා අපි පොදු අරමුණු වෙනුවෙන් සටනට නායකත්වය දුන්නේ අලුත්, නිදහස් චින්තනයක් වෙනුවෙන්. අද කාන්තාවන් වැඩිම පිරිසක් පෙළගැහිලා ඉන්නේ මිථ්‍යා මත වෙනුවෙන්. අනික අද කාන්තාව පාරිභෝගික වහලියක් වෙලා. වෙළෙඳ දැන්වීම්වලින්, වෙනත් නොයෙකුත් වෙළෙඳ ප්‍රචාරවලින්, 'ස්ටාර්' වෙළෙඳ වැඩසටහන්වලින් අද පාරිභෝගික වහලියක් වෙලා. ගාල කඩාගෙන දුවන සමාජයේ මුලින්ම ඉන්නේ බාල, තරුණ, මහලු කාන්තාවන්. වයස් භේදයක් නැතිවම.

අප්‍රේල් අරගලය 'තරුණ කැරැල්ලක්' කියලානේ නම් කරන්නේ. 'තරුණ අසහනය' කියලත් කියනවා. අපිට කොහොමත් අසහනයක් නම් තිබුණේ නෑ. අලුත් සමාජ ජීවිතයක් ගැන අලුත් ලෝකයක් ගැන බලාපොරොත්තුවක් සහ ඒ වෙනුවෙන් කැප වීමක් තිබුණේ. ඒ බලාපොරොත්තුව සහ කැප වීමට පාලකයෝ හිතාමතාම විකෘති අර්ථකථන දුන්නා. 'තරුණ අසහනය' කියලා. හැබැයි මෙතැන දී තරුණ කියන අපි විතරකුත් නොවෙයි හිටියේ. ඒ බව විශේෂයෙන් කියන්න ඕනෑ. ඒ වෙන කොට මැදිවියේ හිටි අම්මලා හිටියා. 'අම්මා' නවකතාවෙ වගේ. අකුරු දන්නේ නැති අම්මලා පවා වැඩේ ගැන හැඟීමෙන් එකතු වෙලා හිටියා. හොඳම උදාහරණයක් ඔස්මන්ඩ් සහෝදරයාගේ අම්මා. මැක්සිම් ගෝර්කිගේ 'අම්මා' වගේම සංකේතයක්. තරුණ අපිට කරන්න බැරි ගොඩක් වැඩ කළ අම්මා කෙනෙක්. ඒ වාගේ මැදිවියේ තාත්තලත් හිටියා. මට දැන් නම් ගම් මතක් වෙන්නේ නෑ.

මෙහෙම ගත්තාම පොදුජන අරගලයක්. රස්සා නැති, අපේක්ෂාභංගත්වයට පත්වුණු තරුණයන් විතරක් නොවෙයි හිටියේ. නීතිඥවරු, වෛද්‍යවරු, ව්‍යාපාරිකයෝ වගේ ඒ වෙන කොට ස්ථාවර ජීවිත ගත කරපු අයට තිබුණු අසහනය මොකක් ද? අපේක්ෂාභංගත්වය මොකක් ද? එහෙම නෑ. අපේ රටේ ආර්ථික, දේශපාලන, සමාජ, සංස්කෘතික වාගේම ස්වාභාවික පරිසරයට වෙන්නේ මොකක් ද? වඩාත් හොඳ පැත්තකට රට ගෙනියන්න ඕනෑ කොහොම ද කියලා කල්පනා කළ අය හිටියේ. හැබැයි ලෝකයේ යහපත් වෙනස්කම් එක රැයකින් වුණේ නෑ. අවුරුද්දකින්, හමාරකින් වුණේ නෑ. එක පරම්පරාවක ජීවිත කාලය තුළ සිදු වුණෙත් නෑ. අරගලය සියවස් ගණනක් වුණත් තිබිලයි යහපත් පරිවර්තනයක් වුණේ.

එදා අපි හිරගෙවල් තුළ අනේක වධවේදනා වින්දා. හැබැයි හිරගෙවල් තුළ අපි කාන්තාවන් හැටියට වඩාත් හොඳින් ඉගෙන ගත්තා. කිටිකිටියේ අපි එක්ක මැගසින් හිරගෙදර හිටි කාන්තාවන්ගේ ජීවිත අපි තේරුම් ගත්තා. කොයි තරම් වේදනාකාරී ඛේදවාචකවල ද ගිලිලා තියෙන්නේ කියලා දැක්කා. අත්අඩංගුවේ වධවේදනා ටික කාලයයි. ධනවාදී සමාජ ක්‍රමයක වධවේදනා මුළු ජීවිත කාලයටම. හැබැයි ඒ බව බහුතරයක් තේරුම් ගන්නේ නෑ. ජීවිතයම විඳින වධවේදනා, කරුමෙ, ලබා උපන් හැටි, වගේ දේවල් කියලා භාරගෙන ඉන්නේ. කාන්තාවන් විශේෂයි. හැබැයි, මම නම් දැන් හොඳටම දකින්නේ තරුණ වයසේ දී අපේක්ෂා කළාටත් වඩා අපේ මේ මහලු වයසේදී සමාජවාදී සමාජයක අවශ්‍යතාව ඉතාම තදින් දැනෙන බව. කාන්තාවන් හැටියට එදා 1971දී කැප වුණාට වඩා අවබෝධයෙන්, කැපවීමෙන් පෙරට එන්න ඕනෑ කාලයක් අද තියෙන්නේ■



"අධිකරණ කෘත්‍යයක් මුවාවෙන් කෙරුණු මේ ක්‍රියාදාමය අවසානයේ මම මෙම ප්‍රකාශය නව මැගසින් බන්ධනාගාරයේ සිට ඔබ වෙත ලියන මේ මොහොතේ, මේ කුඩා අඳුරුවන් සිර මැදිරියට හරවන ලද පැරණි වෙඩි බෙහෙත් ගබඩාවේ මහත් වූ ගල්බිත්ති තුළින් මැවී පෙනෙන දර්ශනයකි.

කුරිරු ධනේශ්වර පංති සූරාකෑමෙන් හා පංති පීඩනයෙන් වැහැරී ගිය තිස්ලක්ෂයකට අධික මේ රටේ කම්කරු පංතියේත්, ඊටත් වඩා විශාල ප්‍රමාණයක් වන පීඩිත, දුප්පත් හා මැද ගොවියන්ගේත්, දුක්වේදනා වලින් මැලවුණු දෑස් දූන් මා වෙත යොමු වී තිබෙනු පෙනේ. පනස්ලක්ෂයකට අධික තරුණ තරුණියන්ගේත්, ළදරු ළදැරියන්ගේත්, ඒ කුඩා නිල්වන් දෑස්, මන්ද පෝෂණයෙන් ගිලී ගිය දෑස්, බලාපොරොත්තු මැඬලනු ලැබූ දෑස්, දුක් කඳුළුළින් පිරීගිය දෑස් දූන් මා වෙත යොමුවී තිබෙනු පෙනේ.

ඒ අවංක දුක්බර දෑස් නිහඬව, ගොළුබසින් මගෙන් ඉල්ලනුයේ කුමක්ද? සූරාකෑමටත්, පීඩනයට පත්වූවන්ගේ දෑස්, පරම්පරාවක දෑස් මගෙන් ඉල්ලනුයේ කුමක්ද? ඒ "එපා, යටත් වන්න එපා! එපා, අතරමග සාමාදාන වන්න එපා! අපට ජීවිතය අවශ්‍යයි, අපට ජීවත් වීමට අවශ්‍යයි. අපට සතුට, සැපත අවශ්‍යයි. අපේ අයිතීන් පාවා දෙන්න එපා! එදා මෙන්ම අදත් ඒ වෙනුවෙන්ම සටන් කරපන්; ඉදිරියට පලයන්; කෙලින් හිටපන්; අවශ්‍ය නම් දිවි පුදපන්; අපට ගණිකාවන් වන්නට බැහැ; එයට ඉඩ තියන්න එපා; අපට මහමඟ රස්තියාදුකාරයින් වන්න බැහැ; එයට ඉඩ තියන්න එපා; අපට ධනපති පංතියේ වහලුන් වන්නට බැහැ; එයට ඉඩ තියන්න එපා.

අපට මන්දපෝෂණය, සාගින්න හා නැතිබැරිකම උරුම කරන්නට එපා; අපට නිවටයින්, දීනයින් ලෙස ජීවත් වන්නට ඉඩ සලසන්න එපා; යුක්තිය වෙනුවෙන්, සමාජ සාධාරණත්වය වෙනුවෙන්, මනුෂ්‍යත්වය වෙනුවෙන්, අපේ අයිතිවාසිකම් වෙනුවෙන්, සමානාත්මතාව වෙනුවෙන්, ජනතාව වෙනුවෙන්, නිර්ධන පංතිය වෙනුවෙන්, අනාගත පරපුර වෙනුවෙන්, සැබෑ සමාජවාදය වෙනුවෙන් සටන් කරපන්.

ධනපති පංතියේ පෝරකයට බිය නොවී සටන් කරපන්. ධනපති පංතියේ වෙඩි උණ්ඩයට නොනැමී සටන් කරපන්. සතුරු නින්දා අපහාස වලින් නොසැලී සටන් කරපන්. යුක්තියත්, සාධාරණත්වයත්, මිනිස් අයිතිවාසිකමුත්, සැබෑ සමාජවාදයත් වෙනුවෙන් අවශ්‍ය නම් දසදහස් ගණන් නුඹේ සගයින් මෙන් දිවිපුදපන්. අප වෙනුවෙන්, ජනතාව වෙනුවෙන්, නිර්ධන පංතිය වෙනුවෙන්, නුඹේ ජාතික හා ජාත්‍යන්තර සගයින් ගිය මඟ පලයන්.

සකලවිද පංති සතුරන් නුඹටත්, නුඹේ සගයින්ටත් එරෙහිව නඟන සෑම සියලු නින්දා අපහාසයකින්ම, සෑම සියලු අවලාද අවමානයකින්ම, සෑම සියලු කුමන්ත්‍රණ අපරාධ චෝදනාවකින්ම අප නුඹ සහ නුඹේ සගයින් මානව සංහතිය හමුවේ, මිනිස් ඉතිහාසය හමුවේ නිදොස් කරන්නම්. අප කෙරේ විශ්වාසය තබපන්. ඉදිරියට පලයන්, මේ කෲර ධනේශ්වර ප්‍රතිගාමී ක්‍රියාමාර්ගය, මේ ප්‍රතිවිප්ලවීය ක්‍රියාදාමය දූඩි ලෙස හෙළා දැකපන්" යන්නයි.

ඔව්! කම්කරු පංතියේත්, ගොවි ජනතාවගේත්, තරුණ පරපුරේත් අව්‍යාජ අවශ්‍යතාවන් කියාපාන ඒ අවංක ඉල්ලීමට ඇහුන්කන් දීමට, අවනතවීමට, එකඟවීමට මම උදක්ම බැඳී සිටිමි. ඒ අනුව මම මෙහිදී ක්‍රියා කළෙමි."

**රෝහණ විජේවීර**
('අප මරා දැමුවද අප නඟන හඬ සදා නොමියෙනු ඇත')




# අරගලයේ කලාව හා කලාවේ අරගලය

සෑම වසරකම බක් මාසය ශ්‍රී ලාංකීය ජනතාවට උත්සව සිරි ගෙනේ. සිහල-දමිළ අලුත් අවුරුද්ද උදාවීම හා බැඳෙන සිරිත් පිළිවෙත් බොහෝ කලක් පටන් පැවත ඒ. පැරණි අවුරුද්ද නිමාකර උදාවන අලුත් අවුරුදු දිනයේදී නව අවුරුදු රැගෙන එන අවුරුදු කුමරුට සුබ දිශාවන්හි තැනෙන පහන් පැලක පහනක් දැල්වීම සිරිතකි.

1972 වසරේ පටන් අලුත් අවුරුද්දේදී ඉහත සිරිත වෙනස්කර අනුගමනය කරන ලෙස පියකු පැවසු අයුරු මොනිකා රුවන් පතිරණ කිවිඳිය "තහනම් දේශයකින්" - 1972 කාව්‍ය සංග්‍රහයේ මෙසේ සටහන් කර ඇත.

*පසුගිය වසරේ නව අවුරුදු දින*
*කිරි උතුරුවන මංගල මොහොතක*
*පොල්තෙල් පහනක රන්වන් එළියෙන්*
*පිළිවෙත් පිරූ බව මතකද දරුවනි?*
***තාත්තා කියූ සිරිතේ වෙනසක්***
***(1972 අලුත් අවුරුදු දා)***

1972 මේ නව වසර උදාවේදී පියා පළමුව දරුවන්ට පසුගිය වසරේ (1971) නව වසර සැමරූ අයුරු සිහිපත් කරයි. නැකතට කිරි උතුරවන මංගල මොහොත උදාවී ඇත්තේ කිසියම් වෙනස් පසුබිමක බව කිවිඳිය කියයි. වෙනදා මෙන් රබන් හඬ, රතිඤ්ඤා හඬ උත්සව සිරියෙන් නොව පොල්තෙල් පහනක එළියෙන් පිළිවෙත් පමණක් පිරූ බව හැඟවෙයි. වෙනදා අවුරුදු සිරිය නොතිබුනද එම කුඩා පහන් එළිය 'රන්වන් එළියක්' ලෙසින් හඳුන්වයි. සැමදා අවුරුදු උදාවේ ආලෝකය ගෙනෙන අවුරුදු කුමරු වෙනුවට එදා 'රන්වන් එළියක්' ගෙන මිනිසකු වත්තේ අඹ ගසක් මුල මියගොස් සිටි අයුරු පියා දරුවන්ට සිහිපත් කරයි.

*අවුරුදු කුමරිඳු වැඩි එම මොහොතේ*
*වෙඩි පහරක් ලැබ දිව ගොස් දසතේ*
*හෙළ පෙනෙන අඹ ගස මුල වැතිරී*
*මිනිසකු මළ බැව් මතකද දරුවනි*

එසේ 'රන්වන් එළිය' ගෙනා නොදන්නා මිනිසා වෙනුවෙන් මින් පසු අවුරුදු උදාවේ දල්වනා පහන අඹ ගස මුල දල්වන ලෙස පියා දරුවන්ට පවසයි.

*මෙතැන් පටන් කොට දරුවෙනි එබැවින*
*අවුරුදු කුමරිඳු වඩිනා හැම දින*
*පහන රැගෙන ගොස් එම සුබ මොහොතින*
*අඹ රුක මුල එය දල්වාලනු මැන!*

ඒ මන්ද? කවියේ සඳහන් 1971 බක් මාසය පිළිබඳ උතුරේ දමිළ කවියකු වන ව.අයි.ස. ජෙයපාලන් '71 වසන්තය' කවියේ දක්වා ඇති අයුරු,

*මලින් බරවිය මහා වන හිස*
*කොවුල් ගී නද ඇසින බිහිරව*
*පුරුදු පරිදිම*
*ඇවිත් ගිය හැම වසන්තය සේ*
*ප්‍රමෝදය හා යළිදු පිවිසිනි 71 වසන්තය..*




උදාවූ බක් මසෙහි අසිරිය පෙර හැම බක් මාසයකම මෙනි. ස්වභාදහම පමණක් නොව මිනිස් සමාජයද ඇදී ආවේ පුරුදු පරිදිමය. ඒ කෙසේද යත් කවියේ මීළඟට දක්වා ඇත.

*රාවණගේ පාලනය වුව*
*රාමාගේ පාලනයේ වුව කිම..?*
*උදාවුන ඒ වසන්තයේදීත්*
*ගමින් ගම නම් පුරුදු පරිදිම*
*පවුල් බලයේ බල පරාක්‍රම*
*පැවතුනේමය*

රටේ පාලකයා කවුරුන් වුවද ඔවුන් ගේ අධිපතීත්වය රටේ ඉහළ සිට ගම දක්වාම පැතිර තිබුන අතර මිනිසුන් ඒ අභියස දුක්, පීඩා, ගැහැට විඳිමින් ජීවත්වූයේ සියල්ල තම 'කරුමය', 'ලබා උපන් හැටි' යැයි සිතමිනි.

*මඩෙහි වද විඳි මී ගොනුන්*
*රුදුරු ඉරණම දිනනු නොහැකිය*
*සිතනවා මෙනි*
*"සියලු දේ වෙයි උපන් හැටියට"*
*කියා එලෙසින්*
*පැරණි ගැමියන්*
*යටත් වූවෝ, එගැමි සිරිතට...*

එහෙත් පැවැති මෙම සම්ප්‍රදායික ජීවිතවලට, අයුක්තියට එරෙහිව තරුණ සමහරුන් රහස් කෙඳිරුවේ මේ වසන්තයේම බව කවියා තවදුරටත් කියයි.

*උදාවූ ඒ වසත් දිනවල*
*තරුණ සමහරු*
*අනෙක් සොයුරන්*
*අවදි කෙරුවේ එක එකා මෙනි*
*දවල් නිදනා*
*දනන් වෙනුවෙන්*
*රුදුරු දිගු රෑ ගණන් නොනිදා*
*නැවුම් හිරු තැන් වසන්කර සිටි*
*මහා ගිරිකුළ ඉවත් කරලන*
*පරම රහසද කෙඳිරුවෝමය*

අඳුරේ ජීවත් වූ ජනතාවට නැවුම් හිරුකැන් ළඟාකරලීමට වෙහෙස දැරූ තරුණයන්ගේ එම පිබිදීම ජනතාවට සිතා ගැනීමට නොහැකිද විය. 'රන්වන් එළිය' කැඳවාලනු පිණිස සම්ප්‍රදායට එරෙහිව, පීඩාවට එරෙහිව සටන් වැදි ඔවුන් පාලක පැලැන්තියේ කුරිරු මර්දනය හමුවේ මිහි මව් තුරුලේ සැඟව ගියහ.

මොනිකා රුවන් පතිරණ කිවිඳියගේ 'තාත්තා කියූ සිරිතේ වෙනසක්' කවියේ අඹ ගහ යට මියැදුනු මිනිසාද මෙවන් 'හිරු දරුවෙකි' ඇයගේම 'කොහාගෙන් කවියක්' නමින් වන කවියෙහිද මෙම අවදිවීම, ඉමහත් අපේක්ෂා පිරිපුන්ව දකිනයුරු,

*පෙර කිසි බක් මහක නොදුටු*
*එරබදු මල් සිය දහසක්*
*පසුගිය එක් බක් මහකදී*
*දුටුවෙමි බැලූ බැලූ හැම දෙස*

*හදමල් පිබිදුනු එවිගස*
*එම සතුටේ තනුව තුළින්*
*බක් මහ ගීතය ගයමින්*
*බැලුවෙමි එරබදු මල් දෙස..*
***කොහාගෙන් කවියක්***



රතු ධජ නගා රණබිම පෙරමුණ ගත්තේ
පස්සට නොවේ අප පෙරටයි යනු ඇත්තේ
මැරෙතොත් මැරෙමු අප හැම දෙන එක මත්තේ
රතු ලංකාව අපට ය හිමි වෙනු ඇත්තේ
**71 සිරගෙදර බිත්තියෙන්**

ඉහත කවි ඔස්සේ අප එළඹියේ '71 අරගලය' කලා කෘති ඇසුරේ විමසීමටය. ඉන් පෙර කලා නිර්මාණ විෂය කොටගත් අනුභූතින් අතරට 'අරගලය' ද එක්වී ඇති අයුරු පිවිසුමේදීම දැන් අපට පසක් වේ.

'අරගලය' අප රටේ ආර්ථික, සමාජ, දේශපාලන යන සෑම ක්ෂේත්‍රයකම නව මානයක් කැටුව ආයේය. ඉන් සමාජය තුළ මහත් වෙනස්වීම්වලට බල කළේය. කලාවටද එය එසේම විය. 71 අප්‍රේල් අරගලයේ කම්පනය කලා කරුවන් රැසකට සිය නිර්මාණයන් වෙනස් තලයකට ගෙනයාමට බලකරන ලදී. ඔවුහු අරගලයේ අත්දැකීම, සටන්කාමීත්වය, කැපවීම හා පරිත්‍යාගය මෙන්ම අරගලයට හේතු වූ සමාජ ආර්ථික ගැටලු, අසාධාරණය, අසමානතාවය ආදිය තේමා කර ගනිමින් සිය නිර්මාණ බිහි කළහ. අප්‍රේල් අරගලයට දායක වී, දිවි රැකුන අයද සිරගෙවල් තුළ තම අත්දැකීම් එළි දක්වමින් කවි, ගීත, චිත්‍ර මගින් කලාවට දායක වූහ. ඒ අතර තවත් සමහරු සාම්ප්‍රදායිකව සිතීම ධනේශ්වර මතවාදයන්ට යටවීම හා තරුණ අරගල නොරිස්සීම නිසා අරගලය පිළිබඳව නිෂේධාත්මක ප්‍රවේශයක සිට නිර්මාණ බිහි කළෝය.




ඇතැම් කලාකරුවන්ට අනුව 'කලාව නිර්දේශපාලනික' විය. ඔවුහු තවදුරටත් ප්‍රේමය, සෞන්දර්ය, ඉතිහාස කතා, හාස්‍ය ආදී පැරණි වට්ටෝරු මත පමණක් තම නිර්මාණකරණය කරගෙන යද්දී 'අරගලය' ඔවුන්ට අතහැරුණු විෂයක් විය.

## 'අරගලය' ඔවුන්ගේ මානයෙන්

දේශපාලනයේදී නව වමක ආගමනය පැරණි වාමාංශයට දරාගත නොහැකිවුණි. අශෝක හඳගමගේ 'හෙණ' වේදිකා නාට්‍යය ඒ බැව් නිරූපණය කරයි.



මඟහැර ගියද සියලු කලාකරුවන්ට '71 අරගලය' හෙණ පහරක්ම විය. එබැවින් තවත් කොටසක් තම කලා නිර්මාණ සඳහා එය යොදාගනිති. නමුදු ඒ ඔවුන්ගේ නියෝජනය කළ අධිපති මතවාදයට පක්ෂපාති ලෙසින්ය.

සරත්චන්ද්‍රයන්ගේ 'හෙට එච්චර කළුවර නෑ' නවකතාව පාඨකයාට යෝජනා කරනුයේ '71' බොළඳයින්ගේ විකාර වැඩක් ලෙස එය බැහැර කරන ලෙසය. කෘතියේ වපසරිය විශ්වවිද්‍යාල ඇදුරකුට 'අරගලය' නිසා වූ කැලඹීම, භීතියට සීමාවූවකි.

අරගලයට බට තරුණයන්ගේ කැකෑරෙන පීඩාව විදහා දැක්වීමට ගුණදාස අමරසේකරගේ 'එක්ටැමෙන් පොළවට', 'එකම කතාව', 'කතා පහක්', ආදී කෘතිවලින් කටයුතු කරයි. එහෙත් පැරණි වම ධනපති සභාගයට ගිය නිසාවෙන් තරුණයන්ට නිසි නායකත්වයක් නොමතිව අනුවණ ලෙස කටයුතු කරන බව කියාපායි.

ටෙලි නාට්‍යක් ලෙසින්ද නිර්මාණය වූ සුමිත්‍රා රාහුබද්ධගේ අනුභූතීන්ට 'අරගලය' හසුවූ බව කියාපාන්නකි 'ඉටිපහන්'. එහෙත් ඉතා රළු, යාන්ත්‍රික විප්ලවවාදිනියක් නිරූපනය කරන එයින් හඟින අදහස් නම් සාධනීය නොවේ.

සිනමාවේදී නම් එවන් ගෙනහැරපෑම් සුලභ විය. ප්‍රමුඛයා තිස්ස අබේසේකරය. අරගලය සෘජු ලෙස නොවුණද වක්‍රෝත්තියෙන් ඒ බැව් සංකේතවත් කරමින් 1975 තිරගත වූ මණික් සන්ද සාගරගේ 'කළු දිය දහර' චිත්‍රපටියේ තිර රචකයා තිස්ස අබේසේකරය. 'බ්ලැක් පූල්' වතුයායේ පාලකයාට එරෙහිව තරුණ පිරිසක් කටයුතු කරනුයේ සිත් පිත් නැති කිසිදු මානුෂීය ගුණයක් නොමැති, ස්ත්‍රී දූෂක, කඩකප්පල්කාරී නරුම පිරිසක් ලෙසිනි. තිර පිටපත ලියූ තිස්ස අබේසේකරයන්ම අධ්‍යක්ෂණය කළ 1982 තිරගත වූ 'මහගෙදර' ද එවන් වූ නිර්මාණයකි. මල්වින්න වලව්වේ කතාවක අතුරු කථාවක් ලෙසින් අරගලයේ නියුතු තරුණයන් පෙන්වයි. ඔවුන්ද හිතුමතේ හැසිරෙන, විප්ලවය පිළිබඳ අනවබෝධයක් සහිත, අහිංසකයන් මරාදමන අයවළුන් වේ.

මේ රට වහල් දුන ඒ යුද බිමක සිටී
නිදහස පතා යුද අවි හා පොරට වැටී
සිපගෙන මහ පොළොව වගුරා රුහිරු කැටී
ඇස හැර බලව් ! මිනිසුන් ලෙස මැරුණ හැටී

**71 සිරගෙදර බිත්තියෙන්**

හඳගම 'හෙණ' මගින් පෙන්වා දුන් 'නව වම', 'පැරණි වම' විසින් නොඉවසන අයුරු තිස්ස අබේසේකර ඔහුගේ කලා නිර්මාණවල පෙන්වාලනුයේ ඔහුටද වූ පැරණි වමේ දේශපාලන සබඳතාවය නිසාම විය හැක. 1993දී තිරගත වූ 'නෙළුම් සහ සමන්මලී' ද (චන්ද්‍රරත්න මාපිටිගම) එවන් වූ තවත් සිනමා පටයකි. 71 අරගලයේ නායකයකුගේ පෙම්වතිය වූ තරුණියකගේ හා පුනරුප්පත්ති කතාවක් ලෙසින් දිගහැරෙන එහිද අරගලකරුවන් ස්ත්‍රී දූෂකයන්, මත් ජාවාරම්කරුවන් ලෙසින්ද හුවා දැක්වීමට කටයුතු කරයි. 1994 තිරගත වූ රංජිත් කුරුප්පුගේ 'පවන රළු විය' චිත්‍රපටයේ 'රොඩිනි' ද එවන් සරසවි සිසුවෙකි. රළු, මුහුණේ කිසිදු හිනාවක් නැති, පරත්වාරෝපිත තරුණයකු බව හැඟවන මෙම නිර්මාණයද අරගලයට බට තරුණයා ගැන මතුකරන චිත්‍රය නිවැරදිද යන ප්‍රශ්නය මතුවේ.



පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ 'අකීකරු පුත්‍රයකුගේ ලෝකය' කවි පොතේ 'විප්ලවවාදියකුගේ නඩු විභාග ය' පැදි පෙළේ අරගලයට බට තරුණයා ගැන ධනේශ්වර රාජ්‍යයේ සියලු ආයතන ලබාදෙන වාර්තා මෙසේය. පාසලේ, පන්සලේ, උසාවියේ, වෛද්‍යවරයාගේ ආදී ලෙසින් වන ඔවුන් සියල්ලන්ටම 'තරුණයන්' අසතුටුදායක හැසිරීමක් ඇති හිතුමතේ වැඩකරන, ධර්මයෙහි නොහැසිරෙන, කසපහර දියයුතු, ආවේග මර්දනය කළ යුතු අය බව පවසයි.

*1. පාසලේ රපෝර්තුව*
*උගන්වන සියලු දේ සැකකරයි*
*ප්‍රශ්න කරයි*
*අසම්මත ලෙස සිතයි*
*විනය ගැන නොසලකයි*
*හිතුමතේ වැඩ කරයි*
*හැසිරීම අසතුටුදායකයි*

*2. පන්සලේ රපෝර්තුව*
*විචිකිච්චාව, පව් සිතක ලකුණු මැයි*
*හඳහනද පින් මඳැයි*
*වාතය - රක්තයා කිපී ඇත*
*දේව ධර්මය නොදන්නී*
*බුදුන් සරණ යෙමියි බුත්සරණ යා යුතු*

*3. උසාවියේ රපෝර්තුව*
*(අ) නීතිය බිඳින්නට තැත් කර ඇත්තේය.*
*(ආ) සාමය-සමාදානය කඩ කොට ඇත්තේය*

*සත්‍යය, සම්පූර්ණ සත්‍යයේ නාමයෙන්,*
*(ඇ) කසපහර දිය යුතුය*
*(ඈ) යහපත් පුරවැසියකු කළ යුතුය.*

***විප්ලවවාදියකුගේ නඩු විභාගය***

ජෝර්ජ් ලෙස්ලි රණතුංග රචනාකර විල්බට් ඇන්තනී ගායනා කරන 'නොමඟ නොයන් පුතේ' ආසන්න වකවානුවේ පැවති සමගි පෙරමුණු ආණ්ඩුවේ මතය වන 'අරගලය අපරාධයක්' ලෙස හුවා දක්වයි. ආණ්ඩුවේ ව්‍යාපෘති සඳහා 'ගමේ කෝපි කඩේ දෙන්නා දෙපැත්තේ- දාං අදින්නේ' වැනි ගී තුළින් එක් පසෙකින් තරුණයන් නිකමුන් පිරිසක් ලෙස හඳුන්වන අතර, ඔවුන්ට අවඥා කරයි.

## අරගලය ඇයිද?

අරගලය 'කජු කිරි කොල්ලන්ගේ අමනෝඥ, දඩබ්බර වැඩක්' ලෙස ඇතැම් කලාකරුවන්ද සිය නිර්මාණ ඔස්සේ ගෙනහැර දක්වන තතු යටතේ, නැත! එය ඓතිහාසිකව ගොඩනැගී පීඩාවන් රැසක ඵලය බව කීමට ඉදිරිපත්වූ නිර්මාණකරුවන් අතලොස්සක් වූවද සිටි බව '71'න් පසු කලා නිර්මාණ විමසීමේදී දැනටමත් අපට හමුවී තිබේ. ඒ ඔස්සේ අරගලයේ සැබෑ පසුබිම ඔවුන් ස්පර්ශ කරගත් අයුරු තවදුරටත් විමසා බැලීම අත්‍යවශ්‍යම වේ.

එහිලා තරුණයන් මුහුණ දුන් අධ්‍යාපන හා රැකියා අවස්ථා පිළිබඳ ගැටලු නිරූපිත ආකාරයක් ගැන,



විරුවන් ගතින් වැගිරුණු ලේ පැහැය උරා
රතු මල් පිපෙනු ඇත මිහිකත දෙරණ පුරා
ලෙළ දෙන රතු ධජය දැඩි කොට සුරත දරා
පියවර තබමු අපි නිවහල් ලොවක් කරා

**71 සිරගෙදර බිත්තියෙන්**

***කුසුමාවතී***

***"කුසුමාවතීට තිබෙන සුදු ගවුම් දෙකම වේළාගන්ට බැරි වූ නිසා ළමයාට ඊයේ පාසල් එන්නට බැරිවිය. ඒ ගැන දඬුවම් නොකරන මෙන් ඉල්ලා සිටිමි.."***

*වේවැල අතකින් ගෙන*
*අතකින් ලියුම ගෙන*
*බැලූ විට*
*මගේ සිත පත්තු විය*

*කුසුමාවතී*
*ඔබට දඬුවම් දෙන්න හැකි කෙනෙක්*
*මෙලොව ඇද්ද කියන්න මට*
*දඬුවමක් නියම කරනු මුළු සමාජයටම*
*කස පහරක් නියම කරනු*
*ඔබේ නමට ගවුම් දෙකක් වෙන් කළාට..*
***('පොඩි මල්ලියේ' - 1973 පරාක්‍රම කොඩිතුවක්කු)***




ධර්මසේන පතිරාජගේ 'අහස් ගව්ව' (1974) සිනමා පටය මෙකී තාරුණ්‍ය මුහුණපාන විරැකියා ප්‍රශ්නය පෙන්වාදෙයි. වසන්ත ඔබේසේකරගේ 'වල්මත්වූවෝ' හි (1976) තරුණයන් වල්මත් වනුයේ විරැකියාව නිසාවෙනි. ගමෙන් නගරයට සංක්‍රමණය වන තරුණයන්ගේ ඛේදවාචකයන් නිරූපනය කරන ඔහුගේම 'පළඟැටියෝ' (1979) තවදුරටත් තරුණ අසහනය නිරූපණය කරයි.

අධ්‍යාපනයට හෝ අවශ්‍යතාවන්ට සරිලන පරිදි රැකියාවක් නොලැබීමත්, රැකියා කළද වැටුප ප්‍රමාණවත් නොවීමත් ධනවාදය හමුවේ වැඩකරන ජනතාවගේ සදාතනික ගැටලුවකි.

1985 අප්‍රේල් මාලිමාහි පල කළ චන්ද්‍ර කුමාර වික්‍රමරත්නගේ 'බක්මහේ සුසුම' කවියේ තැනක ඒ බැව් සඳහන් වන්නේ මෙපරිද්දෙනි.

*"කම්හලේ ගොවිපොළේ වැඩබිමේ*
*සරසවිය සිප්හලේ*
*හන්දියේ කඩපොළේ බස්රියේ*
*මොනවාද දෙඩුවේ රහසේ*
*දහදිය දුක වේදනා කඳුළු කරගැට*
*සොච්චම් වැටුප් පීඩනය..."*

සේවකයන් තළා පෙළා සූරාකන ධනපති සමාගමක 'සොච්චම් වැටුප් පීඩනයට' එරෙහිව සේවක වැඩ වර්ජනයක කතා පුවතක් සුගතපාල ද සිල්වා ශූරීන්ගේ 'දූන්න දූනු ගමුවේ' නාට්‍යයේ වෙයි. 'මනරංජන වැඩවර්ජන' නමින් හෙන්රි ජයසේනද එය ස්පර්ශ කරනු දැකිය හැකිවිය. ලී මෝලක වැඩවර්ජනයක් පිළිබඳ කතා පුවතකි, විජිත ගුණරත්නගේ 'දැති කියත' (1980).

ඉඳ හිට පඩි වැඩිකර ලබාදීම් ලැබෙනුයේද සොච්චමකිනි. එය කිසිසේත් ප්‍රමාණවත් නොවේ. තම හාම්පුතාගෙන් අයදුමක ස්වරයෙන් ඉල්ලා සිටිනුයේ වැඩි වැටුප්ය, අයිතීන්ය. ඒ 'කළුදිය දහර' චිත්‍රපටියේ (1975) කරුණාරත්න අබේසේකරගේ පද රචනයකට, නිමල් මෙන්ඩිස් සංගීතවත් කළ, නීලා වික්‍රමසිංහ ගයන ගීයකය.

*පනම් අටෙන් මට වැඩිකර දුන්න*
*හැකි වුණත් බත් මිටක් දරුවට කවන්න*
*මාස්ටර් සර් මට හිමි තැන දෙනවාද*
*අනේ සර් අනුකම්පාවෙන් සලකන්න*

එහෙත් මෙවන් අයදුමකින් පලක් නැත. මන්ද කම්කරුවා සූරාකෑමෙන් ලබන අතිමහත් ධනයක් සහිතව ඔවුහු ඉහළින්ම වැජඹෙති. පහළ පීඩිතයා හා ඔවුන් අතර පරතරය පියවීමට තබා ළංවීමටවත් ඔවුන් අකමැතිය. මෙම පරතරය, අසමානතාවද තරුණයා අරගලයට බට හේතුන් නොවන්නේද?



පරවී ගියත් පිබිදුණු රතු මල් සියලු
නැවතත් පිපෙනු ඇත දසදහසින් කැකුළු
නිදහස පතා ඔබ හෙළූ දහදිය කඳුළු
හරි බව කියනු ඇත මතු හදවත් සියලු
**71 සිරගෙදර බිත්තියෙන්**

ධනපතීන්ගේ සූරාකෑම, සමාජ විෂමතාවය 'සෙක්කුව' නම් නාට්‍යයෙන් පෙන්වාලීමට 1976 කාලයේදීම පරාක්‍රම නිරිඇල්ල දිරි ලබයි. ආර්.ආර්. සමරකෝන් ද 'අහසින් වැටුන මිනිස්සු', හරහා මේ බව පළමුවරට වේදිකාවේ රඟදැක්වීය.

ඉඩම්හිමි ධනවතෙකුගේ වත්තක පදිංචිව සිටින පවුලක ඔවුනොවුන් අතර අරගලය 'ඉඩම' නාට්‍යයෙන් ගෙන එන සමරකෝන්ගේ 'කැලණි පාලම' ද පීඩිත ගැටලු සාකච්ඡා කරයි.




'අරගලයක' සැබෑ තතු නොවිමසන සාහිත්‍ය කෘති දුලභ වූ යුගයක ඒ.වී. සුරවීරගේ 'හෙයියන්මාරුවෙන්ද' ඒ පිළිබඳව සාධනීය බැල්මක් හෙළීය.

විරැකියාව, කම්කරු, ගොවි, ධීවර ආදී ලෙසින් වූ ශ්‍රමිකයාගේ පීඩනය, සමාජ විෂමතාව ආදී මේසා පීඩාවන් ඉවසනු නොහේ වී අරගලයට පිවිසීම හැර අන් මගක් වීද? '71' යනු හදිසියේවත්, කලබලයකින් කළ අනුවණ ක්‍රියාවක්වත් නොවන බවට තවත් උදාහරණ බොහෝය.

## අරගලය තුළ පෑ වීරත්වය

පරාක්‍රම කොඩිතුවක්කුගේ 'විප්ලවාදියෙකුගේ නඩු විභාගය' නම් කවියේ පාසලේ, පංසලේ, උසාවියේ, වෛද්‍යවරයාගේ රපෝර්තු අබියස විත්තිකාර විප්ලවාදියාගේ ප්‍රකාශය වූයේ,

*ගොළු බෙල්ලෙක් නොකරව් මා*
*සෙලයන් කපා දා*
*බිය ගුල්ලෙක් නොකරව් මා*
*දේව ධර්මය දෙසා*
*මී හරකෙක් නොකරව් මා*
*මුසා දම් කරගසා*
*"හොඳ ළමයෙක්" නොකරව් මා*
*දෑත කට බැඳ දමා*

*සොක්‍රටීස් මෙන් ප්‍රශ්න නගන්නට*
*ඉඩදියෝ*
*ඩෙකාට්ස් වගේ සැක කරන්නට*
*ඉඩදියෝ*
*පිහියක් මෙන් පලාගෙන යන්ට*
*ඉඩදියෝ*
*පුරුෂ ලිංගයක් සේ මතුවෙන්ඩ*
*ඉඩදියෝ*
***විත්තිකරුගේ ප්‍රකාශය***

'ගොළු බෙල්ලෙක්' නොවී අයුක්තිය ප්‍රශ්න කරන්නට, 'බියගුල්ලෙක්' නොවී වීරියෙන් පෙරට ආ තරුණයන් පාලකයන් කෲර ලෙස මර්දනය කළහ. එහෙත් ඔවුන් පෑ වීරත්වය පාලකයන් පවා විශ්වාස නොකළ තරමේ විශ්මිත එකක් විය.

71 විරු පරපුරේ වීරත්වයන් ආවර්ජනය කරද්දී නිතැතින්ම හමුවන නන්දන වීරසිංහයන්ගේ කවි/ ගී පබැඳුම, රෝහණ වීරසිංහයන්ගේ සංගීතයට අනුව ගැයෙන නන්දා මාලනියගේ හඬ, මර්දනයේ කෲරත්වය, තරුණයන්ගේ වීරත්වය, බලාපොරොත්තුව සියල්ල කැටිකර ගත් නිර්මාණයකි.

*එරබදු අතු නැමී රැ හුළගේ හැපෙන*
*ගඟ ළඟ නුඹේ උණු ලේ පුසුඹම ඉහෙන*
*හිමිහිට පුංචි රතු මල් පෙති දිග හැරෙන*
*මේ බක් මහෙත් ඉවුරෙන් අත වනනු මැන*

*තෙලිකඩ ගඟේ දිය නෑ වෙනදා සිසිල*
*කිපිලා ලෝ දියව ලේ පාටයි ගඟුල*
*ගඟබඩ ළඟ රබර් හේඩාවෙන් ඉගිල*
*කොතැනක සිර කළෙද නුඹෙ උස් හඬ කොවුල*

*ඒ බක්මහේ රෑ හඳ දියවෙන කලට*
*නුඹේ සිරස පාවී ආවා තොටට*
*තියුණු නිවුනු සීතල දෑසෙහි රුවට*
*ඇවිලුනා පැතුම ගිනිදැල්ලක් ලෙසට*

*ගිනි බටවලින් පිඹහල මරණයේ විසට*
*විකාරව නොගිය නුඹේ මුහුණත යසට*
*ඇඳී තිබෙනු දුටුවා පුදුමෙකි සිතට*
*පැතුම් සහගතව දිවි පිදුමක සතුට*



දිවි දුන් සගයිනේ නුඹ නිඳනා සොහොන
අල්තාරයයි අප හද බැති මල් පුදන
ලෙළ දෙන විට දි රතු ධජ සිරිලක දෙරණ
ඉතිහාසයේ ඉදි වෙයි සැමරුම් කුලුන
**71 සිරගෙදර බිත්තියෙන්**

*අවියෙන් වනසන්න බෑ උතුම් අරමුණු*
*හඬ ගා කියන නුඹෙ හඬ අහසෙහි හැපුනු*
*ඇසුනා ඒ හඬේ නෑ මියගිය ලකුණු*
*මරණය සුන්දරයි සත්‍යය වෙත නැමුණු*
***(ගිං ගඟේ විලාපය)***

රට පුරා ගංගාවල පාකර හැරි තරුණ විරුවන් අතරේ කමල බන්ධු සොයුරාගේ මතකය ජීවමාන කරවන ඉහත කවිය ඔහුගේ නමින්ම චන්ද්‍ර කුමාර වික්‍රමරත්න 'අප්‍රේල් සඳ' කවියේ සඳහන් කර ඇත. එහි අවසන් කවිය මෙසේය.

**අප්‍රේල් සඳ**

*"ළය මඬල කමල වූ බන්ධුනී*
*නුඹය මිය නොයන මේ ගිං ගඟ*
*ගිං ගඟේ ගමන් මග*
*නතර කළ නොහැක කළුවර තොපට*
*ඉවුරු බඩ රතු නෙළුම්*
*පිපෙනු ඇත හැමදාම*
*නෙතින් ගලනා කඳුළු වෛරයද*
*නිවාලිය නොහැක කළු මරණයට"*
***(භූගත කවි සිත)***

ප්‍රේමවතී මනම්පේරි සොයුරිය මරා දැමුණු කෲරත්වය කලාකරුවන් බොහෝ දෙනෙකුගේ හෘදය සාක්ෂිය විවර කරලූයේ විවිධ මාධ්‍ය ඔස්සේය. 1975 දී පළකළ පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ 'අලුත් මිනිහෙක් ඇවිත්' කවි එකතුවෙහි 'කතරගම සිද්ධිය' ලෙසින් පළ කරන ලදී.

*කිරිවෙහෙරට අත් තියලා*
*මැණික් ගඟේ පා ඔබලා*
*ඉර එළියෙන් පිරිසිදු වී*
*පොත්-පත් ගෙන අකුරට ගිය*
*නංගියෙ නුඹ*
*විනාශ විය*

*දෙස බස රස රකිනා මුර බල්ලන්ගෙන්*
*කතරගම දෙවියන්ගේ සිරි යහනේ*
*එහෙත් මෙදා උසාවියට*
*සියැසින් දුටු සාක්ෂියක් වුවමනාය*

*පමා නොවී විගසින්නේ*
*උසාවියට වරෙන් අනේ*
*සියල්ල දුටු දිවැසින්නේ*
*සාක්කියක් දියන් අනේ*
*කදිර දේව රාජනේ*
*කදිර දේව රාජනේ*



71 අරගලය වරදක් බවට දඬුවම් කළ පාලකයෝ බොහෝ පිරිසක් සිරගත ද කළහ. සිරගෙය තුළදී නොසිඳි ජවයෙන් තමන් අත්දුටු සත්‍යයන් ඉතා දිළිඳු ලෙසින්, එහෙත් ජවසම්පන්නව 'විමුක්ති ගී' ලෙසින් උපත ලබාදෙන්නට සිරගත වූවෝ කටයුතු කළහ. ඔවුන් අතින් නිර්මාණය වූ මුල්ම ගී ගොන්නෙහි 'මනම්පේරී සොයුරියේ' නමින් ඇයව ඇමතූ ගීයක් විය. එපමණක් නොව 1978 දී පැවති ජනතා විමුක්ති පෙරමුණේ මංගල මහා සමුළුවේදී (සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී) 'මිලාන වූ මලක් නොවේ' නමින් ඇය ගැන විවරණයක යෙදෙන්නට කටයුතු කෙරිණි. එහෙත් එම සත්‍යයට 1977 බලයට පත් ජේ.ආර්. ජයවර්ධනගේ පාලනය පවා බිය වූ අයුරු දිස්වූයේ පසුදින රූගුම් පාලක මණ්ඩලය විසින් එය ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීමත් සමඟය.

## කුරිරු මර්දනය ගැන තවත් තතු

විමල් දිසානායක කවියාගේ 1974 දී පළකළ රැව් පිළිරැව් කාව්‍ය සංග්‍රහයේ 'අරුම පුදුම මල' තුළින් අරගලය මෝදු වූ අයුරු හා එය තළා පෙළා දැමූ අයුරු පවසයි.



පිපි මල් පරව විසිරී ඇත දෙරණ මත
විහිදු සුවඳ ඉදිරියටත් මියෙනු නැත
ඔපවත් කරන්නට එසුවඳ අපරිමිත
නිමි නැති තරම් පිබිදෙන්නට කැකුළු ඇත
**71 සිරගෙදර බිත්තියෙන්**

*කොහාගෙ හඬ පැතිරී යන බක් මාසයේ*
*එක් දිනයක*
*හඳටයි තරුවලටයි පායන්නට*
*තහනම් වූ රැයෙක*
*ඝන වනපෙත අඬා හැලෙන දොළ ළඟ*
*එක් වගුරු බිමෙක*
*පිපෙනවාලු රතු කුසුමක් මැදියම*
*නිසසල මොහොතක*

*ලේ කැටියක් මෙන් රත් පැහැයෙන්*
*ඒ මල පිපෙනවාලු*
*සිහින් සරින් දුක් මුසු පුවතක්*
*ලොවටම කියනවාලු*
*එනමුත් හිත් පිත් නැති වනයට*
*එපුවත නොවැටහේලු*
*හිරු පායන්නට පෙර මල යළිත්*
*අතුරුදහන් වේලු*

පැන නැඟි විරු අරගලය 'රතු කුසුමක්' ලෙසිනුත්, 'හිත් පිත් නැති වනය' යනු ධනපති පාලකයන් බවටත් පවසමින් ව්‍යංගාර්ථ ඇසුරින් ඔහුද අරගලය ප්‍රතිනිර්මාණය කරලූ සාධනීයන් අතරට එක්වේ.




ආධ්‍යාත්මික විමුක්තිය උදාකරගත හැක්කේ කෑමෙන්, බීමෙන් අඟහිඟකම් දුරුවූ ලොවකදී මිනිසා විඳින ප්‍රායෝගික ගැටලු, පීඩාවන් පළමුව නිමාකරලීමෙන් අනතුරුව බව අරගලය හා බද්ධවුණු බුද්ධ පුත්‍රයන් වහන්සේලා ඥානනය කර සිටියහ. ඒ සඳහා උන්වහන්සේලා දැක්වූ වීරත්වය 1982 දී කෝ. ආනන්ද හිමියන් විසින් 'නව කැලණි පාලම' කවි එකතුවෙහි 'බක්මහේ දිනක' කවියෙහි කොටසක මෙසේ ලියා ඇත.

*"නිදා නොනිදා මෙන් සිටි මම*
*ගෙපැලේ කැඩුනු පිල පිට*
*සැවුලන් හැඬලීය*
*පළමුවෙනි යාමයට*
*අණ කළා සේ මේ ඔබට කාලයයි*
*ඒ මහා නික්මනට*
*නැගී සිටියෙමි වෙර වඩා*
*මහත් සිසිලකි ගත වැලඳ*
*වැටෙන පිණිකැට නිසා මිදුලට*

*පියවරක් ඉදිරියට*
*දෙපියවරක් පසුපසට*
*ධෛර්යය වඩා ගතිමි*
*බක්මහේ එක් දිනෙක"*

එලෙස අරගලයට ජීවය දුන් වරදට භික්ෂූන් වහන්සේලා සිය ගණනින්ද උදුරාගන්නට 'බුද්ධාගම රැකීමට' යැයි කවදත් දස අතේ කෑමොර දෙන පාලකයන් කටයුතු කළ අයුරු පෙන්වීමට රත්න ශ්‍රී විජේසිංහයන් 1985 දී පළකළ 'වස්සානේ' කවි පොතේ 'අසිරිමත් ථෙර' ගාථාව නමින් ඉඩක් වෙන්කර ඇත. ස්වභාදහම ඒ මහා අපරාධයක් කම්පිත වූ අයුරු කවියේ තැනක මෙසේය.

*"පෙඟී අරහත් ධජය*
*සත්‍යයේ බුද්ධ ප්‍රතිමාව ළඟ අඩදැණිව*
*උන් වහන්සේ අසති ශාන්තව*
*නොසිඳුන කටහඬින*

*"නැද්ද අයිතියක් අපට*
*සාධාරණයකට*
*දුක් විඳින මිනිසුන්ට?"*

එසේ අසමින් නොසිඳී දිරියෙන් මරු වැළඳ ගත් උන්වහන්සේලාගේ විරිය යළි යළිත් හැම බක්මහකම රැව්දෙනු ඇත.

අළුගෝසුවන් මැද පොලිස් නිල ඇඳුම හැඳ සිටි දෙවිවරුන් ඉඳහිට සිටි බව සිරගේ ඇතුළතදී ලියවුණු කවියක, පලායන තරුණයකුට පොලිස් භටයකු පවසා ඇත්තේ මෙසේය.

*යළිත් දෝංකාර දෙන්නට විය*
*සුමිතුරු හඬක්*
*පොලිස් නිල ඇඳුම යට සිටි*
*දෙව් කී කතාව*
*පැන ගනිං පැන ගනිං*
*අද රෑට උඹ ඉවරයි*



අදිරදවාදී ධනපති පාලක හැත්ත
සමඟින් උන්ට පන්දම් අල්ලන රොත්ත
වනසා දමන්නට ගෙන විප්ලව පැත්ත
පුළුවනි සහෝදරයනි සහතික ඇත්ත
**71 සිරගෙදර බිත්තියෙන්**

ඉදින් මේ සා ක්‍රෑර මර්දනයක් අභියසදීත් තම උතුම් අරමුණු පාවා නොදුන් විරුවන් වීරවරියන් නමට තම කාව්‍ය සංග්‍රහ පුදන්නට පරාක්‍රම කොඩිතුවක්කු කවියා තම පොත් ත්‍රිත්වයකට සෑජුවම වදන් සරසා ඇත. ඔහුගේ පළමු කාව්‍ය සංග්‍රහය වූ 'පොඩි මල්ලියේ' (1973) හි පිදුම වූයේ,

*"සහෝදරවරුනි*
*මෙහි එන සියල්ල*
*මනඃකල්පිතයැයි*
*මම ඔබට කෙසේ*
*පවසම්ද?*

*මෙය ඔබට හැර*
*අන් කාට පුද දෙම්ද?"*

අරගලය නිමාවේම තම කවි පොත පීඩිතයන් නමට පුදන්නට දිරිය වඩාගත් කිවිඳිය වූ මොනිකා රුවන් පතිරණ 'තහනම් දේශයකින්' නම් තම දෙවන කාව්‍ය සංග්‍රහයෙහි පිදුම මෙසේ සරසා ඇත.

*"කුසගිනි නිවන්නට ඩා බිඳු හෙළන නෙත*
*සෙනෙහස සොයන්නට කඳුළැ ගලන නෙත*
*දුටුයෙන සසල වූයෙන නිරතුරු මසිත*
*පුද දෙමි මෙකවි ලොව හැම එබඳු සත වෙත"*




එවන් දිරියැති කලාකරුවන්ගේ තවත් නිර්මාණ තහනම් කරනට පාලකයෝ දිගින් දිගටම කටයුතු කළහ. 1973 වසරේදී 'මළවුන්ගේ නැගිටීම' නම් වේදිකා නාට්‍ය (ධම්ම ජාගොඩ) එලෙස තහනම් කෙරිණි. එහෙත් කොළඹ, කැලණිය, විද්‍යෝදය හා පේරාදෙණිය සරසවිවල එය ප්‍රදර්ශනය විය. තවද අරගලයට පෙර බිහි වූ නන්දා මාලිනිය ගයන 'සකුරා මල් පිපිලා' ගීයද තහනම් කෙරිනි. 1974 දී ගාමිණී හත්තොටුවගම ඇඳුරිඳු මූලික වී එළිදැක්වූ ලංකාවේ පළමු වීදි නාට්‍ය කණ්ඩායමේ නිර්මාණවලට ද දිගින් දිගටම තහංචි, තර්ජන එල්ල වුවද බාධක මැද ඔවුහු තම නිර්මාණ ජනතාව අතරට ගෙනගියහ.

රෝහණ විජේවීර සොයුරා අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව ඉදිරියේ "බ්‍රිතාන්‍ය යනු අපේ රටේ සාරය උරාගත්තවුන් බවට" චෝදනා එල්ල කළේය. ඒ කාලයේදී හත්තොටුවගම ප්‍රමුඛ 'විවෘත' වීදි නාට්‍ය කණ්ඩායම 1979දී වික්ටෝරියා වේල්ල විවෘතයට පැමිණි අවස්ථාවේදී බ්‍රිතාන්‍ය රැජිනට විරෝධය පළකළේය. ඒ අප රටෙන් කොල්ල කා ගත් සම්පත් නැවත ලබා දිය යුතු බවට වීදියේ රඟ දැක්වීමෙනි.

## අරගලය නිමාවී නැති වග

'71 අරගලය' අලලා විජිත ගුණරත්න 2008 තිරගත කළ 'වලාපටල' එක් දිනෙක කතා පුවතකි. මනෝහරන් නම් වෛද්‍යවරයා අරගලයට පක්ෂපාතී, එයට දායක වූ කෙනකු විය. ඔහුට එරෙහිව කුඩා දරුවකු මිය යාම පිළිබඳ චෝදනා නගන සංකීර්ණ මොහොතකදීත් මර්දනය උත්සන්නව පවතින පසුබිමක වුව 'ව්‍යාපාරයට' සම්බන්ධ තරුණ ගුරුවරයා පිටමං කරන්නට කටයුතු කරයි. මර්දනයට ගොදුරු වන්නන් බොහෝ සිටි අතර නැවත අංකුර මෝදු වන හෙට දිනකට අපේක්ෂා පෙරදැරිව කටයුතු කරන්නන් බවට ඉඟි දෙයි.

ලිපියෙහි මුල් අදියරෙහි ම උපුටා දැක්වූ ජෙයපාලන්ගේ '71 වසන්තය' නිර්මාණයෙහි අවසන පෙන්වන සුභවාදය කදිමය.



ගමන යන මඟ තිබේ හෙලිවී අඳිරදේ මර ගී ගැයෙද්දී
සටන මොට කොට නවත්වන්නට ඇතැම් අය මඟ අවුරවද්දී
ගැයෙන නිවහල් ගීතිකාවෙන් සහස් දන කැළ පිබිද එද්දී
බුරන බල්ලන් ඔහෙ බුරද්දෙන් සොයුර අපි යමු පෙරට ඇද්දී
**71 සිරගෙදර බිත්තියෙන්**



*"71 වසන්තය*
*අපේ ගම් බිම්*
*හරිම සරුසාරයි*
*හැබෑමයි*
*කුමක් වළලා දමන ලද වූත්*
*පඳුරු ගසමින් යළිත්*
*සුපිපෙයි*
*සත්තකින්, දළුලා*
*වැඩෙයි..!"*

චන්ද්‍රකුමාර වික්‍රමරත්න 'අප්‍රේල් සඳෙහි' දීද මේ බව පවසන අයුරු,

*"ජනයිනේ හිස නමව්*
*මේ රැයට*
*ඔබේ නමින් එකතුවී*
*බිඳෙන මේ කඳුළු ගබඩාවලින්*
*විහිදී යන අපරාජිත බලය*
*ඝන අඳුර කුදලා දමනු ඇත*
*ආලෝක තොරණට වැට නගනු ඇත.."*

විප්ලවවාදීන්ට සොහොන් කොත් නැත. ඔවුහු හඳුනා නොගත් සොහොන් බිම්වල සැතපෙති. එහෙත් ඔවුන්ගේ අරගලයට 50 වසරක් සපිරෙද්දී '71' විරුවන් හදවතේ ගැඹුරුම හුස්මත් සමඟින් සමරනුයේ ඔවුන් දිවිපිදූ අරමුණු උත්තුංග වන නිසාය. එපමණක්ද නොව උනුන් ගිය මඟ යාමට මෙන්ම ජය ලැබීමට සපථ කරමිනි. එතෙක් ඔබ නැඟූ හඬ "කුරුලු මුවගින් නොදත් බසකින් සදාකල් ගායනා වනු ඇත".

*මිතුරා මිය ගිය තැනදී*
*උපත ලද දින විපත ලද දින*
*සනිටුහන්කළ සෙල් පුවරු නැත*
*ඔබ නිදන බිම රැකවළුන් සේ*
*බලා හිඳිනා මහ කුළුනු නැත*

*සතුරු වෙඩි මුර නැගෙන වනපෙත*
*වීර ඔබේ ගත පළිහ වූ වග*
*කුරුලු මුවඟින් නොදත් බසකින්*
*සදාකල් ගායනා වනු ඇත*

*අහස නැංවුන අනගි විසිතුරු*
*සොහොන් කොතකින් ඔබට පළ නැත*
*තවත් මිනිසකු නිදන ඉඩකඩ*
*ඔබේ සොහොනින් වැසී ගොස් නැත"*
***('අංගුලිමාලගේ සිහින' - මොනිකා රුවන් පතිරණ - 1974)***



කුසට සාගිනි හදට සෝගිනි ඉනට වැරහැලි කැබලි එල්ලා
සතුට සැනසුම අහිමි කරලූ අඳුර දිනු කාලය ගිහිල්ලා
නොසිට මැරී මැරී සතුරු පා යට වකුටු වී අත-පය හකුල්ලා
නැඟිටපල්ලා ! නැඟිටපල්ලා !! නුඹලගේ වාරය ඇවිල්ලා

**71 සිරගෙදර බිත්තියෙන්**



# රතු පාටින් ඉර බැස ගිය සැඳෑවක්

"දවල් දවස තිස්සේ මොන පාටද කියලා අපිට නිකමටවත් හිතෙන්නේ නැති ඉර උදේ පාන්දර පායනකොටයි, හවස බැහැලා යනකොටයි රතුපාට වෙන්නේ ඇයි කියලා ඔයා නිකමටවත් හිතුවද?"

මම ඇයට යොමු කරන්නට රෙකෝර්ඩ් කරමින් සිටි වොයිස් මැසේජ් එකට කියමින් සිටියෙමි. සුන්දර දර්ශනයක් දකින සෑම මොහොතකම මට ඇය සිහිපත් වේ. ඇගේ රූපය ඒ පසුබිමේ තබා ආකර්ෂණීය පිංතූරයක් ගත හැකි බව ඒ සෑම මොහොතකම මගේ මනසට එයි. මිනිසුන් වඩාත් බැඳෙන්නේ හිමිකරගත් දෙයට වඩා, කෙදිනක හෝ හිමි කර ගැනීමට සිහින දකින, ප්‍රර්ථනා කරන, අපේක්ෂා කරන දේ කෙරෙහි බව කිසිවෙකු විසින් පවසා ඇත. මා කැමරාවේ සටහන් කර ගන්නා සුන්දර දර්ශන කොතෙක් ඇතත්, ඒ සුන්දර දර්ශන දැක, අගයමින් බොහෝ දෙනෙක්, බොහෝ දේ කියා ඇතත්, ඒ හැම දර්ශනයක්ම ඇත්තේ ඇගේ පසුබිමේ නොවන්නේ නම්, ඒ ඡායාරූපයේ කිසියම් අඩුවක් ඇති බවට හැඟීමකින් මම නිරන්තරයෙන්ම පෙළෙමි. එවැනි අවස්ථාවල මම මගේ හැඟීම වොයිස් මැසේජ් එකක් බවට පත්කර ඇයට යොමු කරමි.

එහෙත්, අපේක්ෂා නොකළ පරිදි මගේ පණිවුඩයට පිළිතුරක් මා අසලින් නැගී ආවේය.

"ඒ වෙලාවල් දෙකේම ඉර ගොඩක් අව්‍යාජයි. උදේම එන ඉර කියන්නේ ළදරු ඉරක්. හවස බැහැගෙන යන ඉර කියන්නේ වියපත් ඉරක්. කෙනෙක් වියපත් වෙනවා කියන්නේ ළදරුවෙක් වෙනවා කියන එකට. ඒ කියන්නේ හවසට බහින ඉර කියන්නෙත් චක්‍රාකාරයෙන් ළදරු ඉරක්! ළදරුවෝ නිතරම, සම්පූර්ණයෙන්ම අව්‍යාජයි. රතුපාට කියන්නේ අව්‍යාජත්වයේ පාට. අපේ ලේවල තියෙන පාට. මිනිස්සු කොච්චර ව්‍යාජ වුණත්, මිනිස්සුන්ට ශක්තිය දෙන ලේ නිතරම අව්‍යාජයි!"

මම ඒ හඬ දෙස බැලුවෙමි. මෙතෙක් වෙලාවක් මා අසල සිටින බවට මට හැඟීමක් නොවූ මිනිසෙක්, මට මීටරයකට අඩු දුරකින් බංකුව මත වාඩි වී සිටියේය.

ඔහුගේ පෙනුමෙන් ඔහු වයස හැත්තෑවකට ආසන්න කෙනෙකු විය යුතුය. බැස යන හිරු දෙස කල්පනාකාරී ඉරියව්වකින් බලාගෙන සිටි ඔහු ඇත්ත වශයෙන් කතා කළේ මටද යන්න හැඟවෙන සලකුණකුදු පළ නොකළේය. ඒ වෙනුවට ඔහු තමාටම යමක් කියමින් සිටි බවක් පෙනිණ. මට පිළිතුරක් දෙනවා වෙනුවට තමා තුළ මෙතෙක් කාලයක් කැකෑරෙමින් පැවැති කිසියම් ගැටලුවකට හදිසියේම පිළිතුරක් සොයා ගැනීමට සමත් වූ දාර්ශනිකයෙකු තුළ ඇතිවන ආකාරයේ නිහතමානී ආඩම්බරයක් ඔහුගේ වත පුරා පැතිරී තිබෙනු මම නිරීක්ෂණය කළෙමි. අනතුරුව, ඔහු මා දෙස බැලුවේ සිය ගැඹුරු පර්යේෂණයට සහාය වූ පර්යේෂණ සහකාරවරයෙකු දෙස බලන කෘතඥතාපූර්වක හැඟීමෙනි.

මම මඳක් සිනාවී ඔහු දෙස බැලීමි. ඔහු පෙරළා මා වෙත සිනාසුණේ දිගු කාලයක් තිස්සේ අතුරුදන්ව සිටි දරුවෙකු හදිසියේ දැකීමෙන් විමතිය මුසු ආනන්දයට පත්වූ පියෙකුගේ විලාසයෙනි.

"සමාවෙන්න! මං අංකල්ට බාධා කළාද මන්දා!" මම කීවෙමි.

"නෑ. මට ඇහුණේ ඇත්තටම පුතා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා වගේ!" ඔහු කීවේය.

"නෑ" මම වහා පිළිතුරු දුනිමි. අනතුරුව මා අතේ වූ ජංගම දුරකථනයට කතා කළ බව පවසම්ද, නොපවසම්ද යන දෙගිඩියාවෙන් මොහොතක් බලා සිටියෙමි. එම නිමේෂයෙන් අනතුරුව මෙම පිළිතුර ගැට ගසා ගැනීමට මම සමත් වුණෙමි.

"ඇත්තටම, මං ඒක කියා ගත්තේ මටම තමයි. පුංචි කාලේ ඉඳලම තමන්ටම කතා කර ගන්න නරක පුරුද්දක් මට තියෙනවා!"

"ඇත්තටම?" ඔහු තියුණු නිරීක්ෂණයකින් මා දෙස බැලුවේය. අනතුරුව මගේ දෙනෙත් දෙසම බලාගෙන මෙසේ කීවේය.

"එහෙම නැත්තම් ගෑනු ළමයට යවන්න වොයිස් මැසේජ් එකක් රෙකෝඩ් කළා නෙවෙයි නේද?"

එම ප්‍රකාශයත් සමගම ඔහුගේ මුහුණට මඳ සිනහවක් නැගින. එහෙත් එහි අර්ථය, තමා විසින් මා යටපත් කළ බවට උපන් ආඩම්බරකාරී හැඟීමක් නොව, මා කෙරෙහි උපන් වැඩිහිටි දයාවෙන් උපන්නක් බව ආයාසයකින් තොරව වටහා ගැනීමට මට හැකි විය.

මම මඳක් ලැජ්ජාශීලීව සිනාසුනෙමි. ඔහුගේ මුහුණේ ඇඳී ගියේ පෙරකී වැඩිහිටි සිනාවකි. අනතුරුව අප දෙදෙනා අතර නිහැඬියාවක් ජනිත විය. නැගිට ඔහු වෙතින් ඉවත්ව යන්නේද, නො එසේ නම් තවදුරටත් එහිම රැඳෙන්නේද යන්න තීරණය කර ගැනීමට අපහසුව මෙන් මම මොහොතක් වික්ෂිප්තව ගත කළෙමි.

"මං ළඟ නෑ කියලා හිතාගෙන ඔයාට දිගටම තනියෙම කතා කරන්න පුළුවන්. එහෙම නැත්තම්, පුතාට ඕන නම් මං නැගිටලා වෙන බංකුවකට යන්නම්"



"එහෙම ඕන නෑ අංකල්" මම වහාම කීවෙමි. මා විසින් ඔහුගේ නිරාමිස සුවයකට බාධා කළේය යන පසුතැවිල්ල ඒ ඇසිල්ලකින් මා තුළ ජනිත විය.

"පුතා දන්නවද, තනියෙම කතා කරනවා කියන්නේ කෙනෙක් මුළු ලෝකෙටම ඇහෙන්න කතා කරනවා කියන එක. ලේඛකයෙක්, කවියෙක්, නාට්‍යකාරයෙක්, සිනමා අධ්‍යක්ෂකවරයෙක්, ඕනෑම ආකාරයක නිර්මාණකාරයෙක්, විශේෂයෙන්ම නියම නායකයෙක් කරන්නේ තනියම කතා කරන එක තමයි. ඇත්තටම මට වෙලාවකට හිතෙනවා තනියෙම කතා කරන මිනිස්සු නැත්තම් ශිෂ්ටාචාරයේ පරිණාමය කවදාවත්ම සිද්ධ වෙන එකක් නෑ කියලා!"

මම මඳක් නිහඬව සිටියෙමි.

"අද විශේෂ දවසක්ද?" ඔහු ඇසීය.

"උපන් දිනයක්!" මම කීවෙමි.

"අද එයාට වයස කීයද?" ඔහු වහාම ඇසුවේය.

"විසි හතරයි!" මම නොසිතාම පිළිතුරු දුනිමි. ඔහු ඇසුවේ 'එයා' ගේ වයස බවත්, එහෙත් මම අද ඇයගේ උපන්දිනය බව නොකී බවත් අනතුරුව පසක් කළෙමි. මා විශ්මයට පත්වීමට ඉඩ නොතබාම ඔහු මෙසේ කීවේය.

"එක්දාස් නවසිය අනූ හයේ අප්‍රේල් මාසේ දහවෙනිදා. ඒ කියන්නේ, එයා ගිහින් හරියටම අවුරුදු විසි පහකට පස්සේ! එයා ගියේ එක්දාස් නවසිය හැත්තෑ එකේ අප්‍රේල් මාසේ දහවෙනිදා. මට ගිහින් එන්නම් කිව්වෙත් නැතිව!"

"කවුද?" මම වහාම ඇසුවෙමි.

"මගේ හොඳම යාළුවා. ඇත්තම කියනවා නම් මගේ ගුරුවරයා කිවුවොත් තමයි නිවැරදි!"

අනතුරුව ඔහු බැස යන රතු පැහැති ඉර දෙස නැවතත් බැලුවේය.

"පුතාල වගේ ගොඩක් අය හිතාගෙන ඉන්නේ ඉර බැහැගෙන යනකොට උදේට පිපිච්ච මල් පරවෙන එක නියතයක් කියලා. ඒ දහම පිළිගෙන නිහඬ වෙන එක හැර අපට වෙන විකල්පයක් නෑ කියලා. අපි කවදාවත් මලකට ආයාචනා කරන්නේ නෑ, ඉර බැහැගෙන ගියත් පරවෙන්න එපා කියලා. මලක් පරවෙන්න එකම හේතුව ඉර බැහැගෙන යන එක නම්, ඒකේ තේරුම තමයි මලේ එකම බලාපොරොත්තුව වෙලා තිබුණේ ඉර කියන එක. ඒක මලේ එකම බලාපොරොත්තුව වෙලා තියෙන්නේ, අපි කවදාවත් මලට පර නොවී ඉන්න හේතුවක් දීලා නැති නිසයි. බලාපොරොත්තුවක් දීලා නැති නිසයි. මොකද ලෝකේ හැම දෙයක්ම පවතින්නේ ඊළඟ මොහොත ගැන බලාපොරොත්තුවෙන් නිසා. සවිඥානික අවිඥානික හැම දෙයක්ම පවතින්නේ ඊළඟ මොහොත ගැන අපේක්ෂාවෙන් නිසා. අපේක්ෂාවක්, බලාපොරොත්තුවක් නැත්තම් කිසිම දේකට පැවැත්මක් නෑ. අන්ධකාර රාත්‍රිය කොහොම හරි ගෙවා ගත්තොත් හෙට උදේට ආයෙමත් ඉර පායන බව මලට කියලා දෙන්න, එයාට අපේක්ෂාවක් දෙන්න; බලාපොරොත්තුවක් දෙන්න අපි සමත් වෙලා නෑ. සිද්ද වෙන්නේ ඉර බැහැගෙන ගිය එක විතරයි. එක දවසක් ගෙවිලා ඉවර වුණු එක විතරයි. ටිකක් කටුක, අමාරු රයක් ආව විතරයි කියන්න තරම් අපි නිර්මාණශීලී නෑ. සමහර විට ඒකට හේතුව, තවත් දවසක උදේට පායන ඉර ගැන අපේක්ෂාවෙන් පර නොවී ඉන්න කියලා මලට පැහැදිලි කරලා දෙන්න, අවංකව ආයාචනා කරන්න අපට ධෛර්යයක් නැති එක වෙන්න ඇති!"

ඔහු මඳක් නිහඬව සිට මෙසේ කීවේය.

"හවසට බහින ඉරම තමයි උදේට පායන්නේ. ඒ නිසා තමයි උදේට ඉර රතුපාටට

පේන්නේ! එයා එහෙමයි කිව්වේ! එයා එහෙම කෙනෙක්! හෙට උදේට ඉර පායන නිසා, අද හවසට මල්වලට පරවෙන්න ඕන නෑ කියලා අපේක්ෂාවක්, බලාපොරොත්තුවක් දීපු කෙනෙක්!"

"එයා කවුද? මොකක්ද නම?" මම කුතුහලයෙන් විමසුවෙමි.

"මට එයා හම්බ වුණේ මහා සෙනඟ ගොඩක් මැද්දේ ඉන්න වෙලාවක. ඒ දවස්වල මට වයස දහ නවයයි. ඇත්තටම මං සාමාන්‍ය පෙළ ලිව්වේ අවුරුදු 15 න්. ඒ කියන්නේ මට එයා හම්බ වෙනකොට මං යුනිවර්සිටි එන්ට්‍රන්ස් කරලත් ඉවරයි"

"මිනිහෙක් ජීවත් වෙනවද පවතිනවද කියන කාරණේ තමන්ම තීරණය කරන්න ඕන බවක් අපි හුඟ දෙනෙක් දන්නේ නෑ. මිනිහා මිස මේ ලෝකේ කිසිම සතෙක් ජීවත් වන්නේ නෑ. හුස්ම ගන්න එක, කන බොන එක, වර්ගයා බෝ කරන එක පැවැත්මක් මිස ජීවත්වීමක් නෙවෙයි. අපි මේ දෙක පටලවාගෙන ඉන්නේ. පැවැත්ම කියන්නේ ජීවත්වීම කියලා තමයි අපි අපේ බාල පරම්පරාවට කියලා දෙන්නේ. ඒ නිසා අපේ දරුවෝ කවදාවත් ජීවත් වෙනවා කියන්නේ මේකයි කියන එක දන්නේ නෑ. ජීවත් වෙන්නේ කොහොමද කියන එක දන්නේ නෑ. අපේ රටේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම පවතින්නේ කොහොමද කියලා උගන්වන එකක් මිස ජීවත් වෙන්නේ කොහොමද කියලා උගන්වන එකක් නෙවේ. අපි මොනවද ළමයින්ට උගන්වනවා කියලා කරන්නේ? හොඳ ඉස්කෝලෙකට ගියා කියලා නමක් ගන්න ඕන නිසා කරන්න තියෙන බොරු, වංචා, කපටිකම්, දූෂණ සේරම, සල්ලි බලය, දැන හැඳුනුම්කම් වගේ සිවිල් බලයත් පාවිච්චි කරලා ළමයා හොඳ ඉස්කෝලෙකට දා ගන්නවා. ඊට පස්සේ රස්සාවක් ගන්න පුළුවන් මොන විෂය ඉගෙන ගත්තොත්ද කියලා හිතලා අතේ තියෙන සේසත සේරම වියදම් කරලා අර දරුවගේ ලස්සන හිස් මනස බොරු මනස්ගාතවලින් පුරවනවා. ඊට පස්සේ කාට හරි පන්දමක් අල්ලලා ළමයට රස්සාවක් අරගෙන දෙනවා. මොකටද? ජීවත් වෙන්නද? නෑ...පවතින්න. ඒ නිසා මමත් එස්. එස්. සී., එච්. එස්. සී. ලියන කාලේ පවතින්න මිස ජීවත් වෙන්න දැනගෙන හිටියේ නෑ"

ඔහු මටද නො එසේනම් බැස යන හිරුට ද යන්න නිවැරදිව තේරුම් ගත නොහැකි දෙබසක් එක දිගටම පවසා මදක් නතරව ගිමන් හැරියේය.

"ජීවත් වෙනවා කියන්නේ පවතිනවා කියන එකට හාත්පසින්ම වෙනස් එකක්. මාර්ක් ට්වේන් කිවුවා වගේ මිනිහෙක්ට ජීවිතේ වැදගත් දවස් දෙකක් හම්බවෙනවා. තමන් ඉපදිච්ච දවසයි, තමන් ඉපදිලා ඉන්නේ ඇයි කියන එක ඇත්තටම තේරුම් ගන්න දවසයි. අපි ඉපදුනා කියන්නේ අපේ පැවැත්ම ආරම්භ වුණා කියන එක. අපි ඉපදිලා ඉන්නේ ඇයි කියලා තේරුම් ගත්ත දවස තමයි අපි ජීවත් වෙන එක ආරම්භ කරන දවස "

"අපේ පවුල වාමාංශික දේශපාලනේ කරපු පවුලක්. අපේ ගෙදර පොත්පත් ගොඩාක් තිබ්බා. ඇත්තටම මං ඉස්කෝලේ පොත්පත්වලට වැඩියෙන් කියෙව්වේ ඒ පොත්පත්. ඒ පොත්පත් තමයි මට පැවැත්මයි ජීවත්වීමයි දෙකක් කියලා ඉගැන්වුවේ. ජීවත් වෙන්න නම් මිනිහෙක්ට අරමුණක් තියෙන්න ඕන. ඒ දැක්ම ළඟා කර ගැනීමේ ලොකු ආසාවක් තියෙන්න ඕන.

"මගේ හිතේ මේ වගේ හැඟීම් ගොඩාක් තිබ්බා. ඒත් ඇත්තටම මම අරමුණක්, අපේක්ෂාවක්, බලාපොරොත්තුවක්, උපාය උපක්‍රම වගේ දේවල් තිබ්බයි කියලා මං විශ්වාස කළේ නෑ. මං අවුරුදු දාහතක් දහ අටක් වෙන හැම කොල්ලෙක්ම කරනවා වගේ ඒවා හොයාගෙන ඉබාගාතේ ගියා පිස්සුවෙන් වගේ. පොත්පත් කියෙව්වා, නාට්‍ය බැලුවා, චිත්‍රපටි බැලුවා, සිංදු ඇහුවා, යාළුවොත් එක්ක සෙල්ලම් කළා, රගර් ගැහුවා, මං මෙහෙම හිටියට ඒ කාලේ ජාතික මට්ටමේ ක්‍රීඩකයෙක්. ලංකාවේ රගර් වලට ආදරේ කරපු මිනිස්සු පිස්සු වැටිලා හිටියා. එංගලන්ත කණ්ඩායම එක්ක තිබ්බ තරගෙකදී මං සුද්දෙක්ට ලේ පනින්න ගහපු නිසා ලංකාවේ රගර් පිස්සෝ මට දෙයියෙක්ට වගේ සැලකුවා. පස්සේ දවසක මගේ ජීවිතේ බේරුණේ ඒ සිද්ධිය නිසා මං අඳුරාගෙන හිටිය රගර් පිස්සෙක් වෙච්ච පොලිස් ලොක්කෙක් නිසයි. අනෙක් හැම කොල්ලෙක් වගේම අපි කෙල්ලෝ පස්සේ ගියා. උන්ට විහිළු තහළු කළා. ලියුම් දුන්නා. උන් බෑ කිවුවම දවස් ගණන් නොකා නොබී හිටියා. යාළුවෝ එක්ක සෙට් වෙලා බිව්වා. රස්තියාදු ගැහුවා. කොටින්ම කියනවනම් කොල්ලෙක් කරන හැම දෙයක්ම මමත් කළා"

"ඒ අතරේ අහම්බෙන් දවසක් මට එයා හම්බ වුණා. ඒක හරියට එකම ඉලක්කයක් පිටිපස්සේ ගිය දඩයක්කාරයෝ දෙන්නෙක් හම්බ වෙනවා වගේ දෙයක්"

"එදා අපි පළවෙනි වතාවට සංස්කෘතියක් වෙනස් කරන්න පුළුවන් කියන කාරණය අත්වින්දා. අපි ඉගෙනගෙන තිබුණ හැම දහමක්ම කිව්වේ මිනිස්සු හරිම ආත්මාර්ථකාමීයි කියන එක, ඒ නිසා මිනිස්සු පොදු අරමුණකට ගේන්න බෑ

කියන එක. ඒත් මිනිසුන්ගේ ඇත්ත හෘද සාක්ෂිය නිතරම පරාර්ථකාමීයි කියලා මට පස්සේ තේරුණා. අම්ම කෙනෙක් දරුවෙක් හදන්නේ කවදා හරි තමන් රැක බලාගනීවි කියන ආත්මාර්ථකාමී හැඟීමෙන් කියලා සමහරු කියනවා. බැලූ බැල්මට ඇත්ත. අම්ම කෙනෙක්ගේ බඩට දරුවෙක් එන්නේ එයා පිරිමියෙක් එක්ක ජීවිතේ උපරිම සතුට භුක්ති විඳින්න තීරණය කළාට පස්සේ ඒ වෙනුවෙන් යමක් කළාම. ඒත්, තමන්ගේ සතුටට වැඩිය තමන් එක්ක ඉන්න පිරිමියගේ සතුට වෙනුවෙන් ඒ ස්ත්‍රිය ලොකු කැපකිරීමක් කරන්නේ නැද්ද? ඒ වෙනුවෙන් වේදනාවක් විඳින්නේ නැද්ද? දරුවෙක් පිළිසිඳ ගැනීමේ අවදානමක් ගන්නේ නැද්ද? සති හතළිහක් ඒ දරුවා බඩේ තියාගෙන එක එක සංකූලතාවලට මූණ දීදී ඇති දැඩි කිරීමේ අවදානම ගන්නේ නැද්ද? මේ ලෝකේ මනුස්සයෙකුට දරන්න වෙන උපරිම වේදනාව විඳලා ඒ දරුවා මේ ලෝකෙට බිහි කරන්නේ නැද්ද? එතකොට ඒ සේරම ආත්මාර්ථකාමීකම්ද? නෑ... අපිට ලෝකේ නිතරම දෙන්නේ මිනිස්සු ගැන වැරදි චිත්‍රයක්.

උන් නිතරම අපි මිනිස්සුන්ට බයේ ජීවත් වෙන්න පොළඹවනවා. මොකටද? නිදහස්ව නිවහල්ව එකිනෙකා විශ්වාස කරගෙන සමගියෙන් සතුටෙන් ජීවත්වෙන මිනිස්සුන්ට වඩා බයෙන් ජීවත්වෙන මිනිස්සු පාලනය කරන එක ලේසි නිසා. උන්ට ඕන නිසා අපි සේරම මිනිස්සු ආත්මාර්ථකාමීයි කියලා හිතනවා. උන්ට ඕන නිසා අපි නිතරම අපේ ළඟම ඉන්න මිනිහා සැක කරනවා. උන්ට ඕන නිසාම අපි අපේ ළඟම ඉන්න මිනිහට බයෙන් ජීවත් වෙනවා. මේක කොච්චර මානසික ව්‍යසනයක් වෙලා තියෙනවද කියනවනම් අපි ආදරේ කරන්න තෝර ගන්න ස්ත්‍රිය හරි පිරිමියාට හරි ආදරේ කරනවට වඩා අපි කරන්නේ සැක කරන එක. එයා ගැන කේන්ති ගන්න එක. එයා කරන ආදරේ පවා කපටිකමක් කියලා හිතන එක. කොටින්ම සැකය, කේන්තිය, අවිශ්වාසය එක්ක බයෙන් ජීවත් වෙන එක"

"ඒ වුණත් අපි ඒ සිතුවිල්ලෙන් මිදිලා බැලුවොත් පේනවා මිනිස්සු ඇත්තටම ජීවත් වෙන්නේ ආත්මාර්ථකාමීත්වයට වැඩිය පරාර්ථකාමීත්වය වෙනුවෙන් කියලා. තාත්තා කෙනෙක් තනියම හම්බ කරගෙන සුවපහසු විදියට ජීවත්වෙන්න තියෙන අවස්ථාව කැප කරලා බිරිඳක්, දරුවෝ වගේ හතරපස් දෙනෙක් වෙනුවෙන් තනියම හම්බ කරනවට වඩා දහ දොළොස් ගුණයක් හම්බ කරන්න මහන්සි වෙන්නේ ඒ නිසා. අපිට නිතරම හම්බ වෙන්නේ එහෙම ආත්මාර්ථකාමී විදියට හැසිරෙන්න බලහත්කාරයෙන් පොළඹවපු මිනිස්සු. එදා මං ජීවිතේ පළවෙනි වතාවට හැම මිනිහෙක් ඇතුළෙම තියෙන උතුම් මානුෂීය ගුණාංගයක් වෙච්ච පරාර්ථකාමීත්වයට කතා කරලා අවදි කරලා තියෙනවා දැක්කා. එතන කතා කරපු මිනිස්සු ආදරණීය දෙබස් කිවුවේ නෑ. ඒ වෙනුවට මහා සද්දෙන් රළු විදියට තමයි කතා කළේ. ඒ රළුකම අස්සේ මං ආවේගයක් දැක්කා. ඔව් ඒක ආවේගයක්. දැනුම් තේරුම් තියෙන, තක්කඩි, කපටි, අධම, අධානග්‍රාහී, පටු විදිහට හිතන, කෲර, වංචනික මිනිසුන්ට වඩා තිරිසනුන්ට ළං වෙච්ච ගතිගුණ තියෙන අතළොස්සක් විසින් මුළාවේ දාලා ඉන්න මිනිස්සු ගැන සංවේගයෙන්, සංවේදීව, ආදරයෙන් කතා කරන මිනිස්සු. උන්ගේ කතාව ආවේගශීලියි තමයි. ඒත් ඒ ආවේගය අර අතළොස්සක් වෙච්ච මිනිස්සු ගැන මිස ජීවත් වෙනවා වෙනුවට පවතින මිනිස්සු ගැන නෙවෙයි කියන එක හුඟක් දෙනෙකුට තේරුම් ගන්න අමාරුයි.

"එහෙම එක මිනිහෙක් දැක්කොත් අර කපටි රැල ගොඩක් බය වෙනවා. තමන් හෙළිදරව් වෙන එක වළක්වන්න ඕනෑම දෙයක් කරනවා. ඉන් එහාට තමන්ගේ පැවැත්මක් නෑ කියලා තේරුණාම තමන්ගේ පැවැත්ම වෙනුවෙන් අවසාන සටන වුණත් කරනවා. ඒ කේන්තිය, උන්ගේ පැත්තෙන් ගත්තම හරිම සාධාරණයි!"

"ඉතිං උන් මොනවද කළේ?" මම විමසීමි.

"උන් අපිව අල්ලලා හිරේ දැම්මා"

"හිරේ දැම්මා?"

"ඔව් අපි හැට තුන් දෙනෙක් අල්ලලා හිරේ දැම්මා!"

ඔහු රත් පැහැති ඉර අනුව ගුරු පැහැගත් සාගරය දෙස මද වේලාවක් නිහඬව බලා සිටියේය.

"එදා තමයි මගේ ජීවිතේ දෙවැනි වැදගත් දවස. මං ඇත්තටම ඉපදිලා තියෙන්නේ ඇයි කියන කාරණේ මං තේරුම්ගත්ත දවස. ඉතිං ඒක කරන්න නං අපි සන්නද්ධ වෙන්න ඕන. මොකකින්ද? දැනුමින්. මාක්ස් කිවුවේ නිර්ධනයාට සංවිධානය වීම හැර වෙන විකල්පයක් නෑ කියන එක. අපි සංවිධානය වෙන්න නම් දැනුම තියෙන්න ඕන. ඒකට ඉගෙන ගන්න ඕන. ලෝක ඉතිහාසයේ වඩාත්ම, සඵලදායීම, ඉගෙනුම් මාධ්‍ය තමයි, සාකච්ඡා හා බුද්ධි කලම්බනය. සොක්‍රටීස්ගේ ඇක්රො පොලිස් එක එහෙම තැනක්. අපි

හොඳටම දන්න ජාතක පොතේ දිසාපාමොක්ගේ ගෙදර එහෙම තැනක්! එයාලටත් තිබුණා එහෙම ආකෘතියක්. අධ්‍යාපන කඳවුර. කට්ටිය දවස් පහක් විතර එක තැනකට රූස් වෙලා දන්න අය නොදන්න අය එක්ක කතාබහ කර කර ප්‍රඥාව වඩවා ගන්න එක. ඉතිං එයා ඇහුවා ඒ තැනට එන්න කැමතිද කියලා. මං හා කිවුවා. මට මතක විදියට ඒ 1970 වේ අගෝස්තු මාසේ විතර වෙන්න ඕන. අපි ඔය සීදුව පැත්තේ තැනකට එකතු වුණා. අපේ බලාපොරොත්තුව දවස් පහක් සොක්‍රටීස්ගේ ක්‍රමයට එහෙම නැත්තං  දිසාපාමොක්ගේ ක්‍රමේට ප්‍රඥාව වඩවා ගන්න එක. දැනුමෙන් සන්නද්ධ වෙන එක"

"ඒත් උන් අපේ දිහා ඇහැ ගහගෙන ඉදලා. උන් කලින්ම දන්නවා අපි සන්නද්ධ වෙනවා නම් ඒ දැනුමෙන් කියන එක. ඒ වෙනුවට උන් අපි අවි ආයුධවලින් සන්නද්ධ වෙනවා කියලා ප්‍රචාරය කළා. උන් හොඳටම දන්නවා නිල ආණ්ඩුවකට තරම් අපිට අවි ආයුධවලින් සන්නද්ධ වෙන්න බෑ කියලා. ඒත් උන්  රටේ මිනිස්සුන්ට කිවුවේ අපි ආණ්ඩුවට තියෙනවටත් වඩා දරුණු භයානක අවි ආයුධවලින් සන්නද්ධ වෙන්න යනවයි කියලයි. අපි දැනුමින් සන්නද්ධ වෙනවයි කියන එක උන් වැරදියට අර්ථ දැක්කුවේ අන්න එහෙම තමයි"

අපි හැට තුන්දෙනාම අල්ලා ගත්තා. ඊට පස්සේ මීගමුව හිර ගෙදරට අරගෙන ගියා. අපි හැටතුන් දෙනාම දවස් විසි අටකට හිර ගෙදරට දැම්මා"

"සේරම ඉවර වුණා ද අන්කල්?"

"නෑ...කවදාවත් එහෙම හිතන්න එපා. කෙනෙක් අරමුණු සහගතයි නම් කිසිම බලවේගයකට එයා නවත්තන්න බෑ. බාධා කරන්න පුළුවන්. ඒත් අරමුණු සහගත කෙනා ඒ බාධා තමන්ගේ වාසියට හරවා ගන්නවා"

"මේ අධ්‍යාපන කඳවුර ගැන පොලිසිය කලින්ම දැනගෙන ඉඳලා තියෙනවා. උන් ඒ ගැන අවධානෙන් ඉඳලා. සමහරු ඇවිල්ලා එතන ඉද්දී අල්ලා ගත්තා. තවත් සමහරු එද්දි අල්ලා ගත්තා. උන් අපි සේරම උසාවි දාලා රිමාන්ඩ් එකට දැම්මා"

"අපි මොකද කළේ? වහාම සංවිධානය වුණා. මූලික අදහස් තිබ්බ අය පුංචි පුංචි කණ්ඩායම්වල නායකයෝ විදියට පත් වුණා. හෙට දවස වෙනුවෙන් අද කාලසටහනක් හදනවා. හරිම සරල එකක්. ඊට පස්සේ කණ්ඩායම් නායකයෝ හරහා පණිවිඩේ දෙනවා. හැටතුන් දෙනාම වැඩ කරන්නේ එකම කාල සටහනකට"

"ඊට පස්සේ අපට උදේ කෑම හම්බ වෙනවා. අපි කෑම කාලා අපේ සාකච්ඡාව පටන් ගන්නවා. කොහොමටත් අධ්‍යාපනය දෙන්න ආපු සහෝදරවරුත් ඇතුළෙම හිටිය නිසා හැම දෙයක්ම පහසුවක් වුණා. ඇත්තටම ඒක කලින් සංවිධානය කළාට වඩා හොඳ අධ්‍යාපන කඳවුරක් වුණා. අපි ඒක සංවිධානය කළා නම් ආරක්ෂාව අපි දෙන්න ඕන. දැන් ආරක්ෂාවට ජේලර් ලා ළඟ ඉන්නවා. අපි සංවිධානය කළා නම් කෑමට වියදම් අපි හොයා ගන්න ඕන. දැන් ඔක්කෝම වියදම් රජය දරනවා. අපි සංවිධානය කළා නම් කෑම අපි උයලා දෙන්න ඕන. දැන් ආණ්ඩුවෙන් කෑම උයලා දෙනවා. අපේ තැනක හිටියා නම්, වෙන ප්‍රශ්න මොකුත් නෑ. අපි ආණ්ඩුවේ තැනක ආණ්ඩුව සලසපු පහසුකම්වලින් අපේ අධ්‍යාපන කඳවුර කළා. කලින් දවස් 10කට විතර සැලසුම් කරලා තිබුණ වැඩේ දවස් විසි අටක් කිසිම සැලකිය යුතු බාධාවක් නැතිව කරන්න අපිට පුළුවන් වුණා. අන්න එදා, උන්ගේ කෑම බීම කන බොන ගමන්, උන්ගෙම ආරක්ෂාව යටතේ, උන්ගෙම තැනක ඉඳගෙන අපි තීරණය කළා උන්ට විරුද්ධව අරගලයක් කරන්න. උන් ඉවරයක් කරලා දාන්න කොන්දේසි විරහිතව අරගලයක් කරන්න"

"මාරයි නේ අන්කල්" මම කිව්වා.

"නෑ... මාර නෑ පුතා. ඒක තමයි මිනිස්සුන්ගේ ධාරිතාව. මේ ක්‍රමය අස්සේ මිනිසුන්ගේ ධාරිතාවය ගොඩක් බාධා කරනවා. හේතුව, මිනිස්සු සැබෑ ධාරිතාවෙන් වැඩ කළොත් තමන්ට ඕන විදියට පාලනය නොවෙන බව උන් දන්නා නිසා. මිනිස්සු නිර්මාණශීලී වෙනවා. මිනිස්සු ක්‍රමය ප්‍රශ්න කරනවා. අසාධාරණ ක්‍රමයට එරෙහි වෙනවා. ඒත් මිනිස්සු නිදහස් කළාම එයාලා තමන්ගේ හැබෑ ධාරිතාවයෙන් වැඩ කරන්න පටන් ගන්නවා. ඇත්තටම එයා කළේ මං නිදහස් කරපු එක මගේ ඇත්ත තරම ගැන මටම දැනෙන්න ඉඩ හැරපු එක. මගේ විලංගු මටම  කඩාගන්න පොළඹවපු එක. මට පියාඹන්න නිදහස දීපු එක"

"ඔව්, අපි අරගලයක් කළා තමයි; අපි අරගලයක් කළා අපි ළඟම තිබ්බ කාලකණ්ණිකමට විරුද්ධව. අපි අරගලයක් කළා; අපි ළඟ තිබ්බ නූගත්කමට විරුද්ධව. අපි අරගලයක් කළා; අපි අපිම බෙදිලා වෙන්වෙලා අසමගිවෙලා ඉන්න එකට විරුද්ධව. අපි අරගලයක් කළා දැනුමෙන් ප්‍රඥාවෙන් පිරිච්ච මිනිස්සු බවට පත්වෙන්න. අපි අරගලයක් කළා අභිමානවත් මිනිස්සු බවට පත්වෙන්න. ඒ



අරගලේ අනිවාර්යයෙන්ම අපි කාලකණ්ණි කරපු; කරමින් ඉන්න, අපි නූගත්තු කරපු; කරමින් ඉන්න, අපි අධමයන් කරපු; කරමින් ඉන්න, අපි මුග්ධයෝ කරපු; කරමින් ඉන්න උන්ට විරුද්ධ අරගලයක් වෙනවා තමයි. ඒකට හේතුව තමයි, අපි බලහත්කාරයෙන් කාලකණ්ණි, අධම, නීච, කෲර, ආත්මාර්ථකාමී මිනිස්සු විදිහට පවත්වාගෙන යන්නේ උන් නම්, එහෙම නොවී ඉන්න නම් අපට උන්ගෙන් මිදෙන්න සිද්ධ වෙනවා. උන් ස්වේච්ඡාවෙන් අපි නිදහස් නොකරන නිසා, අපට බලහත්කාරකමෙන් උන්ගෙන් ගැලවෙන්න සිද්ධ වෙනවා. උන් අපි අල්ලාගෙන ඉන්න අයෝමය හස්තයට හයියෙන් ගහලා ඒක කුඩු පට්ටම් කරලා දාන්න ඕන. ඔව් උන් කියනවා නම් "අපට රිදෙනවා" කියලා අපි කියනවා "ඔව් අපිට ඕන උඹලට රිද්දන්න තමයි; නොසෑහෙන්න රිද්දන්න තමයි" කියලා. අපිට උඹලට රිද්දන්න සිද්ධ වෙනවා මොකද උඹලා අපි අල්ලාගෙන ඉන්න අත, තදකරගෙන ඉන්න බැම්ම කවදාවත්ම උඹලගේ කැමැත්තෙන් ගලවන්නේ නැති නිසා. අන්න ඒකට තමයි අපි අරගල කළේ!"

"උන් අපිව අල්ලා ගත්තා. එයයි මමයි දෙන්නවම අල්ලා ගත්තා. ඊට පස්සේ අනිවාර්යයෙන්ම මරා දාන්න ඕන කියලා උන් තීරණය කරපු කණ්ඩායමට අපි දෙන්නම ඇතුළු කළා. අපිට නඩු අහන්නේ නැතිව මරණ දඬුවම නියම කරපු තැනක, මරණයට නියමිත වෙලා ඉන්න වින්දිතයෝ විදිහට අපි පෝලිමකට දණ ගහගෙන හිටියේ. ඌ....; මං අර කලින් කිව්ව පොලිස්කාරයා එතනට ආවා. මරලා දාන්න කලින් හැම එකාගෙම මූණ පෞද්ගලිකව බලා ගන්න ඌට ඕන වෙලා තිබ්බා මං හිතන්නෙ. බිම දණගහගෙන, බිමට හරවගෙන හිටිය අපේ මූණු උස්සලා බල බලා ඌ පෝලිම දිගට ආවා. එයා හිටියේ පෝලිමේ මට කලින්. පොලිස්කාරයා එයාගේ කොණ්ඩෙන් අල්ලලා උස්සලා, මූණ දිහා හොඳට බලලා මෙහෙම කිව්වා"

"කාලකණ්ණියා!"

බිම බලාගෙන හිටියත් එයාගේ මූණ මට මැවිලා පෙනුණා. ඒ මුහුණේ හැමදාම තිබ්බ, උපහාසාත්මක කරුණාවන්ත හිනාව ඒ මොහොතෙත් තියෙන්න ඇති. ඒත් එයා වචනයක්වත් කියනවා මට ඇහුනේ නෑ"

"ඊට පස්සේ පොලිස්කාරයා මගේ කොණ්ඩෙන් අල්ලලා උස්සලා මගේ මූණ දිහාත් බැලුවා"

"තමුසේ?" මිනිහට එකපාරටම කියවුණා.

"තමුසෙ මෙහෙම, මෙතන, මේ විදිහට දණගහගෙන. වෙන්න බෑ. ඒ තමුසෙ වෙන්න බෑ. තමුසේ... නෙවෙයි නේද?"

"මිනිහා පුදුම වෙලා ඉන්න තරම මට හිතාගන්නවත් බැරි වුණා"

"ඔව්! ඒ මං තමයි!" මං කිව්වා.

"හෙණ ගහපං! තමුසෙලා දන්නවද මේ කවුද කියලා?"

"මිනිහා ඊට පස්සේ පිරිවරාගෙන හිටිය අනෙක් පොලිස්කාරයන්ගෙන් ඇහුවා."

"මේ යකා තමයි අර අවුරුදු දෙකකට කලින් එංගලන්තේ එක්ක තිබ්බ රගර් මැච් එකේදි පිට්ටනිය මැද්දෙදිම සුද්දෙකුට ලේ පනින්න ගහපු එකා"

"එහෙම කියපු පොලිස් ලොක්කා, මගෙන් එහාට පෝලිම බලන්නේ නැතිව ටිකක් අවුලෙන් වගේ පැත්තකට ගියා.

"සහෝදරයා!" ඒ අවසරයෙන් එයා මට කතා කළා.

"සහෝදරයා, ඒ කියන්නේ උන් ඔහේ මරන්නේ නැති බව මට ඒ කතාවෙන් තහවුරු වුණා. මට විශ්වාසයි, උන් ඔයා මරන්නේ නෑ. ඒ වගේම මට ඒ ගැන ගොඩක් සතුටුයි. දැන් මගේ තැන ගන්න කෙනෙක් ඉන්නවා කියන විශ්වාසෙන් මට නිදහසේ මැරෙන්න පුළුවන්. ඔයා මගේ තැන අරගෙන මේ වැඩේ ඉස්සරහට කරගෙන යන්න ඕන.

මට පොරොන්දු වෙන්න. ඔයා ඒක කරනවයි කියලා"

"මම.....?"

"මට ගොත ගැහුණා."

"මං හිතන්නේ නෑ මට සහෝදරයා වගේ දැවැන්තයෙකුගේ තැන ගන්න පුළුවන් වෙයි කියලා"

"ඒක පුළුවන්ද බැරිද, කරනවද නැද්ද වගේ දේවල් ගැන තීරණයක් ගන්න සහෝදරයට කිසිම අයිතියක් නෑ. සහෝදරයට දැන් ඒක පැවරිලා තියෙනවා. සහෝදරයා ඒක කරන්නම ඕන. කරන්නම ඕන!! ඒක තමයි නායකයෙකුගේ ඉරණම. මාටින් ලූතර් කිං කිව්වේ එහෙමයි. මිනිහෙකුට තමන් නායකයෙක් වෙනවද නැද්ද වගේ දේවල් ගැන තීරණ ගන්න කිසිම අයිතියක් නෑ. එයා කරන්න ඕන, එයාට කරන්න වෙන්නේ ඓතිහාසිකව තමන්ට පැවරිච්ච වගකීම ඉෂ්ට කිරීමේ ඉරණමට මූණ දෙන එක. සහෝදරයට ඉගිලෙන්න බෑ කියලා හිතනවා නම්, දුවන්න. දුවන්න බෑ කියලා හිතනවා නම්, ඇවිදින්න. ඇවිදින්න බෑ කියලා හිතනවා නම්, බඩගාගෙන යන්න. හැබැයි මොන හේතුවක් නිසාවත්, තමන්ගේ අරමුණ දිහාවට, ඉස්සරහට යන එක නතර කරන්න එපා! සහෝදරයා දැන් තමන්ගේ ඉරණමට මූණ දෙන්න"

"මං සද්ද නැතිව එයා රහසෙන් වගේ මට කියන දේවල් අහගෙන හිටිය"

"කෙනෙක් නායකයෙක් වෙන්න නම්, එයාට මහ ලොකු දැන උගත්කමක්, උපාධියක්, පරම්පරාවෙන් එන නම්බුව, ගෞරවය, ප්‍රභූත්වය වගේ දේවල් ඕන නෑ. එයාට තියෙන්න ඕන ගුණාංග දෙකයි. පළවෙනි එක තමයි තමන්ට කැමැති-අකැමැති, තමන් කැමැති-අකැමැති හැම කෙනෙකුගෙම ආරක්ෂකයා වෙන එක. එහෙම නැත්තම්, ඒ හැමෝගෙම ආරක්ෂාව වෙනුවෙන් පෙනීහිටින එක. දෙවෙනි එක තමයි ඒ හැමෝටම කොන්දේසි විරහිතව ආදරේ කරන එක. කවුරු හරි, කාට හරි ආදරෙයි නම් එයා වෙනුවෙන් කරන්න බැහැ කියලා දෙයක් තියෙන්න බැහැ. සීමාකම්, අපහසුතා තියෙන්න පුළුවන්. ඒත්, කරන්න බැහැ කියලා දෙයක් තියෙන්න බැහැ. මං දන්නවා, සහෝදරයා ළඟ ඒ ගුණාංග දෙකම ඕනවටත් වැඩිය තියෙනවා"

"ඒ කියන්නේ සහෝදරයා මේ වෙනකොටත් මැරෙන්න හිත හදාගෙන ඉවරයි කියන එකද?"

"මං ඇහුවා"

"වැරදියි... නායකයෙක් විදිහට අනිවාර්යෙන්ම මූණ දෙන්න සිද්ධ වෙන ඉරණමකට මූණ දෙන්න හිත හදාගෙන ඉන්නවා. එච්චරයි!"

"ඊට පස්සේ එයා බැහැගෙන යන ඉර දිහා බලාගෙන හිටියා"

"සහෝදරයා නැතිව මේක කොහොම කරන්නද කියලා මට නම් හිතාගන්නවත් බෑ"

"අර බලන්න සහෝදරයා. ඉර බැහැගෙන යනවා. රතු පාටට. ඊට පස්සේ එන්නේ අන්ධකාර රැයක්. ඒ අන්ධකාර රාත්‍රිය ගෙවිලා ගිහිල්ලා එන හෙට දවසේ උදෙන්ම නැගිටලා බලන්න. ඉර පායාගෙන එනවා සහෝදරයට පෙනෙයි. හොඳට බලන්න. ඔය රතු පාටින්ම ඉර පායගෙන එනවා සහෝදරයට පෙනෙයි. ඒ කියන්නේ, අද රතු පාටින් අපිව දාලා යන ඉරම තමයි පොඩි විවේකයක් අරගෙන හෙට උදේ ආයෙමත් එන්නේ. අපට ඉරක් ඕන ඇයි? ආලෝකය ලබා ගන්න. ආලෝකය ලැබෙනවා නම් අපිට පායන්නේ මොන ඉරද කියන එක අදාළ නෑ. ඒත් අපි දන්නවා, පායන්නේ ඒ ඉරම තමයි කියලා. අපේ ආලෝකය තමයි අපේ අරමුණ!"

අනතුරුව ඔහු දිගු නිහැඬියාවකට එළඹින. තමා අසල මෙතෙක් තමාට සවන් දෙමින් මා සිටි බව පවා අමතක වූ පරිද්දෙන් ඔහු නිහඬ විය.

"මං හිතන්නේ මං එයාගේ වචනේ රැක්කා. මට කරන්න පුළුවන් උපරිම දේ මම කළා. ඇත්තටම වටිනාම දේ තමයි, කවදාවත්, එයාටවත්, එයාගේ අරමුණටවත් ද්‍රෝහි නොවිච්ච එක"

ඒ ඉර බැස යන ආකර්ෂණීය පසුබිමේ ඔහු තබා ගත් ඡායාරූපයක් මා සතුව ඇත. සුන්දර දර්ශනයක් දකින සෑම මොහොතකම මට සිහිපත්වෙන ඇයගේ රූපය තරමට ඔහුගේ රූපය ඒ පසුබිමේ තබා ගත් ඒ ඡායාරූපයට මම ඇළුම් කරමි. මා ඒ ඡායාරූපය ගත් බව ඔහුට කිසි දිනක කියා නැත. ඊට හේතුව ඔහු යළිත් කිසිදු දිනක මට හමු නොවීමයි. ඔහු ඇතැයි සිතා ඒ බංකුව වෙත යන මම නැවත නැවතත් කඩ වූ අපේක්ෂාවෙන් පෙරළා පැමිණෙමි. ඔහු සිටියද නොසිටියද, ඔහු විසින් ප්‍රකාශ කළ යමක් මෙනෙහි කරමින් මඳ වේලාවක් ඒ බංකුවේ අසුන්ගෙන ගත කිරීම ඇබ්බැහිකමක් බවට පත් කරගෙන සිටිමි.

"එකපාරටම ගොඩක් කළුවර වුණා නේද?" හිරු බැස ගොස් ස්වල්ප වෙලාවකට පසු මම අප අතර වූ නිහැඬියාව බිඳිමින් ඔහුට කීවෙමි.

"කොච්චර තදින් කළුවර වෙන්න පුළුවන් වුණත්, කිසිම අන්ධකාර රාත්‍රියකට, ආලෝකය ගැන අපේ තියෙන බලාපොරොත්තුව නැති කරන්න බෑ!"■

1971-2021
අප්‍රේල් අරගලයට
අඩසියවසයි

# ඉතිහාස අරගලය



"මේ රටේ ජනතාවට එතරම් ප්‍රේම කළ, එතරම් ආදරය කළ, එතරම් ඇලුම් කළ, ඔවුන්ගේ විමුක්තිය, ප්‍රගතිය හා ජයග්‍රහණය උදෙසාම ඇප කැප වී පේවී සිටි මගේ සගයින් දසදහස් ගණනකට මේ දේශයේ මිනීවළවල් හිමි වී නැති අයුරින්ම, මගේ සගයන්ගේ උණු ලෙයින් තෙත් වී, බරිත වී ශුද්ධ වූ බිමක් බවට පත් වී ඇති මේ පොළවේ මටත්, මගේ අනෙකුත් සගයන්ටත් මිනී වළක් හිමිවේ යැයි සිතිය නොහැක. මේ රටේ පීඩිත ජනතාව වෙනුවෙන් සිය යුතුකම් ඉටු කිරීමට අවස්ථාව නොලත් අපට එවැන්නක් සඳහා අයිතියක් නැති බව අපි දනිමු. එසේම මගේ සගයන් දිවි පරදුවට තබා සේවය කළ සහෝදර පීඩිත ජනතාවට ඔවුන්ගේ අවමඟුල් ගීතය ගැයීමට අවස්ථාවක් නොලැබුණු බව මම දනිමි. එලෙසින්ම මගේත්, මගේ අනෙකුත් සගයන්ගේත් අවමඟුල් ගීතය ගැයීමට අපේ සහෝදර ජනතාවට ඉඩ ලැබේ යැයි සිතිය නොහැක. එහෙත් අපට එරෙහිව අපේ සකලවිධ පංති සතුරන් විසින්ම නගා ඇති අනන්ත අප්‍රමාණ නින්දා, අපහාස, අවලාද, අවමාන, පච සහ බේගල්, විකෘති කිරීම්, කණපිට පෙරළීම්වලින් හා සෑම සියලු කුමන්ත්‍රණ හා අපරාධ චෝදනාවකින්ම වැඩ කරන පංති ජනතාව විසින් අපව නිදොස් කොට, මුදාලන බව සහතිකය."

'අප මරා දැමුවද අප නඟන හඬ
සදා නොමියෙනු ඇත'

\- **රෝහණ විජේවීර** -

# ඒදවස

මතක නම් ඒ දවස
මතක ඇති සැඩසුළඟ
සුසුම් දහසින් තැනුණ
කුණාටුව වූ සුළඟ

කුණාටුව තැනු උනට
පියාපත් බර පමණ
නොවී යසිසුරු දිනන
කැදලි තනනා සිහින

බැගෑපත් වී යදින
තැළී පොඩිවී හිඳින
සුවාසක් ජනයිනට
දිනා දෙන ලොව පමණ

තුමුල වාසල් පවුරු
විකුම් පෙළපත් මහරු
කම්පාව සැඩ නලින
සැළුම් වෙවුලුම් කෑය

පිපී එරබදු රුසිරු
නැඟූ කූජන මියුරු
උදා වන සඳවතෙහි
තැබී සසලප රුහිරු

වියැට විසිරී මඩට
කිඳී කලලෙහි යටට
මළ ද ඒ මරණය ද
අස්වැන්න වේ හෙටට




බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ, 464/20 හි පදිංචි උපුල් රන්ජන් වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම ස්ථානයේ පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවන ලදී.